ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත



නත්තලට පෙරාතුව සිදුවේ යැයි කියන තෙදිනක අඳුරක් සම්බන්ධයෙන් පැන නැඟී ඇති මුසාවාදයට කිතුනු ආධ්‍යාත්මික පිළිතුරක්

**අන්ධකාරයට අප බිය විය යුතුද?**

3 පිටුව



**සංක්‍රමණිකයන්ගේ විශ්ව දිනය**

ජාත්‍යන්තර සංක්‍රමණිකයන්ගේ විශ්ව සැමරුම් දිනය වෙනුවෙන් පළ කැරෙන ඇගයීමකි.

8 පිටුව



නිදහස් අධ්‍යාපනයේ කප්පාදුව ගැන අතීත - වර්තමාන විමර්ශනයකි

**නිදහස් අධ්‍යාපනයේ කප්පාදුවට කතෝලික අපිත් නෑකම් කියමුද?**

12 පිටුව



**2010 වසරේ හොඳම ආගමික පුවත්පත**


# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07




ආගමන සමයේ තෙවන ඉරුදින අදයි

ක්‍රි.ව. 2012 ක් වූ දෙසැම්බර් 16 ඉරිදා 147 වෙළුම 29 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 QD/12/NEWS/2012 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

## ජීවිත වටිනාකම් සුරැකීමට කිතුනු කලාකරුවන් පෙරමුණට ආ යුතුයි

### වාර්ෂික නත්තල් සුහද හමුවේදී කාදිනල් හිමිපාණෝ කතෝලික කලාකරුවන්ට දැඩිව අවධාරණය කරති

ඇන්ටන් ජේ. ප්‍රනාන්දු විසිනි

**කතෝලික කලාකරුවන් ලෙස කිතුනු වටිනාකම් අගයමින් මේ සමාජය තුළ ජීවිත වටිනාකම් සුරැකීමට පෙරමුණ ගන්නැයි ද, ගබ්සාව නීතිගත කිරීම බඳු විනාශකාරී ව්‍යසනයන් හමුවේ සභාව ගන්නා ක්‍රියා මාර්ගයන්ට කතෝලික කලාකරුවන් ලෙස දායක වීම ප්‍රබල ක්‍රියා පටිපාටියක් වන හෙයින් ඒ සඳහා ඉදිරිපත් වන්නැයි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ඉල්ලා සිටියහ. කිතුනු කලාකරුවන්ගේ වාර්ෂික නත්තල් සුහද හමුව අමතා කාදිනල් හිමිපාණෝ එසේ පැවසූහ.**

කොළඹ අගරදගුරු හිමිපාණන්ගේ අදහසකට අනුව, ජාතික කතෝලික ජනසන්නිවේදන හා සංස්කෘතික කේන්ද්‍රයේ අධ්‍යක්ෂ ගරු බෙනඩික්ට් ජෝශප් පියතුමාගේ පූර්ණ සංවිධානයෙන් යුතුව කිතුනු කලාකරුවන්ගේ වාර්ෂික නත්තල් සුහද හමුව තුන්වන වරටත් කොළඹ අගරදගුරු නිවාස පරිශ්‍රයේ දී පැවැත්විණ.

ලතා වල්පොල, වින්සන් ද පෝල් පීරිස්, අයිවෝ ඩෙනිස්, විල්බට් ඇන්තනි, එඩ්වඩ් ජයකොඩි - චරිතා ප්‍රියදර්ශනී, රවින්ද්‍ර රන්දෙණිය, ෆීලික්ස් ඇන්ටන්, චන්දන ලියනාරච්චි, මල්කාන්ති පීරිස් සහ දියණිය අනුරාධා, මාරියෝ ආනන්ද ඇතුළු බොහෝ කලාකරුවෝ ගීතිකා හා ගීත ගැයූහ. සිරස මාධ්‍ය ජාලයේ ප්‍රියන්ත විජේසිංහ මහතා සහ නෙත්. එෆ්. එම්. සේවයේ නුවන් ලියනගේ යන මහත්වරු නිවේදන කටයුතු සිදු කළහ. ඔවුන්ගේ චතුර නිවේදකත්වය මොනවට පැහැදිලි කරන්නට සමත් විය.

15 පිටුවට



සමන්ති ලැනරෝල්, හයිසින්ත් විජේරත්න, මල්කාන්ති නන්දසිරි, සකුන්තලා පීරිස් හා අනුරාධා නන්දසිරි යන ශිල්පිනියන් අති උතුම් කාදිනල් හිමිපාණන් සමඟ සමූහ ඡායාරූපයකට පෙනී සිටිමින්.

## කළුතර කලාපීය ගුරු උපහාරයේ දී කතෝලික පාසල් වලට කැපිල්ලක්!

කළුතර කලාපීය ගුරු උපහාර උලෙළක් ඉකුත් දින පැවැති අතර කළුතර කලාපයේ ප්‍රකට හා ඉපැරැණි කතෝලික පාසල් දෙකක් වන සිරිකුරුස විදුහලට හා ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයට ඊට ආරාධනා කර නැතැයි ප්‍රදීපයට වාර්තා වේ.

මේ පාසල්වල සේවය කරනුයේ ගුරුවරුන් නොවන්නේ දැයි පැනයක් මතුවන අතර කලාපීය අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය සිය කලාපයේ ගුරු පිරිසක් අමතක කර දමමින් අන්තවාදී ලෙස කටයුතු කරන්නට වීම ගුරු දෙගුරුන් බොහෝ දෙනාගේ බලවත් විරෝධයට හේතුවී තිබේ. කළුතර කලාපයේ ඉපැරැණි මෙන්ම බොහෝ අංශ වලින් කැපී පෙනෙන පාසල් දෙකක් වන සිරිකුරුස විදුහලේ හා ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයේ ගුරු මහත්ම මහත්මීන්ට කලාපීය අධ්‍යාපන අධ්‍යක්ෂවරිය කුඩම්මාගේ සැලකිලි දක්වන්නේ ඇයි දැයි ඔවුහු විමතියෙන් යුතුව විමසා සිටිති.

## නත්තල් දිව්‍ය යාගය කළමුල්ලේ දී

ඇන්ටනි ප්‍රනාන්දු විසිනි

කළමුල්ල මීසමේ මෙවර නත්තල් රාත්‍රි දිව්‍ය පූජාව කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට නියමිතව ඇත.

කළමුල්ල මීසම් සේවක ගරු මොරිස් නාමල් පියතුමාගේ හා මීසම් සංඝය විසින් මෙය සංවිධාන කරන අතර ජාතික රූපවාහිනියෙන් සජීවීව විකාශය කිරීමට කටයුතු යොදා ඇත.

## පොලිස් කැරොල් ගායනා මෙවර උත්කර්ෂවත්ව

ඉතා දිගු ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානයේ නත්තල් කැරොල් ගී ගායනය මෙවරද ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ හා පොලිස්පති එන්. එස්. ඉලංග කෝන් මහතාගේ සහ එම මැතිනියගේ මූලිකත්වයෙන්, පොලිස් නිලධාරින්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජික සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් දෙසැ. 19 වන දින සවස 6.30 ට බම්බලපිටිය පොලිස් බලකා මූලස්ථානයේදී මෙම කැරොල් ගායනයන් පැවැත්වේ.

## බදුල්ල රදගුරු වසම ස්ථාපිත කර දෙසැම්බර් 18 වැනිදාට වසර 40 පිරේ

බදුල්ල රදගුරු වසම ප්‍රකාශයට පත්කර දෙසැ. 18 දාට 40 වසරක් සපිරේ. 1972 දෙසැ. 18 වැනිදා එවකට මහනුවර රදගුරු වසමට අයත්ව තිබූ බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්ක එක්කර ගත් ඌව පළාත වෙනම රදගුරු වසමක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදි. එහි ප්‍රථම රදගුරු ලෙස අති උතුම් ලියෝ නානායක්කාර සා.බෙ.නි. හිමිද, දෙවන රදගුරු ලෙස අති උතුම් එඩ්මන්ඩ් ජේ. ප්‍රනාන්දු නි.ම.නි හිමිද සේවය කළහ.

මේ නිමිත්තෙන් දෙසැ. 18 බදාදා පෙ.ව. 9.00 ට බදුල්ල සා. මරියා ආසන දෙව්මැඳුරේදී තුති පිදීමේ දේව මෙහෙයක් පැවැත්වේ. බදුල්ල රදගුරු අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි. හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් මේ දේව මෙහෙය පැවැත්වේ. විශ්වාසයේ වසර තුළ දී බදුල්ල රදගුරු වසම අරඹා 40 වසරක් සපිරීමේ ජයන්තිය යෙදීම මහත් ආශිර්වාදයටත්, ප්‍රීතියටත් හේතුවන බැව් පෙන්නා දෙන රදගුරු හිමිපාණෝ, ස්වකීය කැඳවීම අලුත් කරගනිමින් මීසම් ජීවිතය සහ සමාජ ජීවිතය තුළ ක්‍රිස්තියානි සාක්ෂි දැරීම උදෙසා කැපවන්නැයි සියලු සැදැහැවතුන්ට ඇරියුම් කර සිටී.

## ජනතා ධර්මදාන නියෝජනයේ නව කාර්යාලයීය ප්‍රධානියා



අති උත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමන් විසින් මොන්සිඤ්ඤෝර් අතිගරු කැමිලස් නිමලන් ජෝන්පිල්ලේ පියතුමන්ව ජනතා ධර්මදානය පිළිබඳ සසුන් නියෝජනයේ කාර්යාලයීය ප්‍රධානියා ලෙස නොවැම්බර් 21 වැනිදා සිට පත්කර තිබේ.

අතිගරු ජෝන් පිල්ලේ පියතුමා යාපනය පදවියෙන් වන අතර මේ කාර්යාලයේ 1994 සිට සේවය කරමින් ගිණිකොන දිග ආසියානු රටවල කතෝලික සසුන් අවශ්‍යතා

15 පිටුවට

## දැනුම්දීමයි

දෙසැ. මස 20 දින සවස 6.00 ට ගාලු මුවදොර භූමියෙහි අන්තර් සභා පදනම යන මැයින් යුත් සංවිධානයක් මඟින් කතෝලික විශ්වාසිකයන්ගේ ද සහභාගිත්වයෙන් අන්තර් සභා ආගමික මෙහෙයක් පවත්වන්නට සැලසුම් කර ඇතැයි කොළඹ අගරදගුරු පදවියට දැන ගන්නට ලැබී තිබේ. නමුත් මෙහි අරමුණ හා පරමාර්ථ කුමක්දැයි යන්න පැහැදිලි නොවන නිසාත්, කතෝලික සභාවේ අනුදැනුමක් මෙයට නොමැති නිසාත්, එයට සහභාගි වීමෙන් කතෝලිකයන් තුළ ව්‍යාකූලත්වය ඇතිවිය හැකි නිසාත් මෙයට සහභාගි නොවන ලෙස කතෝලික සැදැහැවතුන්ගෙන් මෙයින් ඉල්ලා සිටිමු. කලාපීය නාහිමි තුමන්ගේ අනුදැනුම මත හෝ මීසම් සේවක පියතුමන්ගේ අනුදැනුම මත හෝ සංවිධානය කරනු ලබන ආගමික මෙහෙයන් වලට පමණක් කතෝලික සැදැහැවතුන් සහභාගි විය යුතු බව මෙයින් දන්වා සිටිමු.

**(විශේෂ ව්‍යාපෘති පිළිබඳ නාහිමි අතිගරු අයිවන් පෙරේරා පියතුමා)**

## නත්තල් නාට්‍ය හා කැරොල් ගායනය

අම්පිටිය ජාතික දෙව්සත්හලේ දේව ධර්මය පීඨයේ ගොන්සාල්වෙස් සිංහල ආයතනය මඟින් ඉදිරිපත් කැරෙන වාර්ෂික නත්තල් නාට්‍ය හා කැරොල් ගායනා උලෙළ දෙසැම්බර් මස 16 වන ඉරුදින සවස 2.30 සිට දෙව්සත්හලේ සැකට් ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ. ප්‍රවීන රංගන ශිල්පිනී ජයනි සේනානායක, ජනප්‍රිය ගායක චන්දන ලියනාරච්චි, මහනුවර පිහිටි ශ්‍රී ලංකාවේ ප්‍රථම සෞන්දර්ය විද්‍යාලයේ විදුහල්පති කේ. රංජිත් රාජපක්ෂ මෙහිදී විනිශ්චයෙන් දායක වෙති. මෙම ශාන්තිමය සන්ධ්‍යාවේදී නත්තල් නාට්‍ය 05 ක් හා කැරොල් ගීත 08 ක් ඉදිරිපත් කෙරේ. මෙම කිතුනු ආධ්‍යාත්මික කලා දැහැනට සම වැදීමට ඔබටත් ආරාධනා!

## “සිරස”ට ප්‍රණාමය

මීගමුව නගර සභා ක්‍රීඩාංගනයේ පැවැත්වීමට නියමිත සිරස “කඩමණ්ඩිය” සංගීත සංදර්ශනය කාදිනල් හිමිපාණන්ගේ හා මීගමුව කලාපීය නාහිමිපාණන්ගේ ඉල්ලීම මත දෙසැ. 24 වන දින නොපැවැත්වෙන අතර එදින අධ්‍යාත්මික ක්‍රියාවලියට මුල් තැන දී ක්‍රියා කිරීමට “සිරස” නාලිකාව උත්සුක වෙන බව දැනුම් දී ඇත. මීගමුව මහවීදිය දෙව්මැඳුරේ නත්තල් දින දේව මෙහෙය සජීවී විකාශනය ද “සිරස” නාලිකාව ඔස්සේ සිදුවීමට නියමිතය.

**“ස්වාමින් වහන්සේ විගස වඩින සේක”** (පිලිප්පි 4:4-7)

# ජීවත්වන කාලයේදී දෙවිඳුන් හඳුනා නොගත්තොත් මරණයෙන් පසු ලැබෙන්නේ නැහැ

## සලාපුර රදගුරු හිමි නයිනමඩමේදී ප්‍රකාශ කරයි

**ජීවත්වන කාලයේදී දුගියන් පීඩිතයින් තුළින් අප දෙවිඳුන් දුටුවේ නැතිනම් අපට මරණින් පසුවත් දෙවියන් වහන්සේ දකින්න ලැබෙන්නේ නැතැයි සලාපුර රදගුරු අති උතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ පැවසූහ.**

නයිනමඩම මීසමේ ශුද්ධාත්ම වරම් දානය කිරීමේ දිව්‍ය මෙහෙයේදී රදගුරු හිමි මෙසේ ප්‍රකාශ කළේය.

එහිදී රදගුරු හිමි මෙසේද පැවසීය. ඇද වුනු රූලක ලියනවා වගේ ජීවිතයේ ප්‍රශ්න වලින් එළිදරව්වන දෙවියන් වහන්සේ අපට දේව කරුණාව ලබා දෙනවා. ශුද්ධාත්ම වරම් වරප්‍රසාද ලබාගත් ඔබ වැඩිහිටි දිවයට අවතීර්ණ වන විට මේ සියල්ල තුළ ශුද්ධාත්ම ආලෝකයෙන් පිරි දිවියක් අරඹන්න.

අසිපා සමුළුවට සහභාගිවූ විදේශීය පියවරුන් දෙදෙනකු සලාපුර අනුනායක අතිගරු පැට්‍රික් විජේසිංහ මීසම් සේවක ගරු ලයිලි ප්‍රනාන්දු සහ සහයක චිරංග විරාජ් පියතුමන්ගේ සහභාගිත්වයෙන් සහ පැවිදි සොහොයුරියන්ගේ සහ දහම් ගුරු සැමගේ සහයෝගය මත මෙම මෙහෙය සංවිධානය කර පැවැත්විණි.

ටෙස්මා රෝස් ශ්‍රියන්ති



## 'උපත' 23 දා එළිදකී

'උපත' නත්තල් සඟරාවේ තෙවැනි කලාපය වෙන්නප්පුව සා. ජෝසප් දෙව්මැඳුරේ 'තලෙන්තු' ශාලාවේදී හලාවත පදවියේ ගරු පියතුමන්ගේ සහභාගිත්වයෙන් දෙසැම්බර් 23 පෙ.ව. 9.00 ට එළිදකින බැව් එහි සංස්කාරක ප්‍රියන්ත පීටර්ස් මහතා ප්‍රදීපයට පැවසීය.

## 'මිණි උදාන' 24 දා කළඑළියට

රත්නපුර පදවියේ 'මිණිඋදාන' නත්තල් සඟරාවේ මංගල කලාපය දෙසැම්බර් 24 දෙහිග හපිටිය දේවස්ථානයේදී රත්නපුර රදගුරු අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි හිමිපාණන්ට පිළිගැන්වීමට සංස්කාරක ජෝශප් ජයසිරි ප්‍රනාන්දු බලාපොරොත්තුවේ.

## ගවලෙන් තරගයක්

නත්තල නිමිත්තෙන් වත්තල යෝක් ජාත්‍යන්තර පාසල සහ හැඳල සිංහ සමාජය ඒකාබද්ධව ගවලෙන් තරගයක් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

වත්තල, බලගල, පල්ලියවත්ත, නායකකන්ද සහ කෙරවලපිටිය මීසම් බල ප්‍රදේශයන්හී පදිංචි කරුවන්ට මේ තරගයට ඉදිරිපත් විය හැකිය.

දෙසැම්බර් මස 22 දා උදේ 10.00 ට හැඳල බලගල පාරේ පිහිටි යෝක් ජාත්‍යන්තර පාසල් භූමියේදී තරගය පැවැත්වේ.

නිමල් පෙරේරා

## පන්නල පොලිසියෙන් නත්තල් උත්සවයක්

කුරුණෑගල රදගුරු පදවිය තුළ පිහිටි මීසම්වලට සහභාගි විය හැකි නත්තල් උත්සවයක් පන්නල පොලිසිය මගින් සංවිධානය කර තිබේ. දෙසැම්බර් 21 සිකුරාදා ප.ව. 6.00 සිට පන්නල ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගණයේදී මෙය පැවැත්වේ.

සිසිල් ඩැනීසියස්

## නත්තල් බැති ගී තරගය හා ප්‍රසංගය

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ කිතුනු උපදේශක මණ්ඩලයේ මෙහෙයවීමෙන් සංවිධානය කරනු ලබන සිංහල හා ද්‍රවිඩ භාෂාවෙන් පැවැත්වෙන නත්තල් බැති ගී තරගය හා ප්‍රසංගය අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් දෙසැ. 19 ප.ව. 3.00 සිට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ආනන්ද සමරකෝන් මැදිරියේ පැවැත්වේ. එය ස්වදේශීය සේවය ඔස්සේ සජීවීව ප්‍රචාරය කරනු ලබන අතර ජූඩ් අයිවන්ගේ නිෂ්පාදනයකි.

## ගවලෙන් තරගය මීගමුවේ

මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංස්කෘතික බලමණ්ඩලය සංවිධානය කරන ගවලෙන් තරගාවලිය දෙසැ. 21 වෙනිදා පෙ.ව. 7.00-ප.ව. 6.00 දක්වා පැවැත්වේ. මීගමුව නගර සභා සීමාවේ මීසම් සේවක පියවරුන්ගෙන් අයදුම්පත් ලබාගත හැකිය.



'භක්ති ප්‍රබෝධනය' කතෝලික මාසික සඟරාවේ ලේඛකයින් හා බෙදාහැරීමේ නියෝජිතයින් සඳහා සංවිධානය කළ වාර්ෂික සුහද හමුව පසුගියදා මරදාන සමාජීය හා සාමයික කේන්ද්‍රයේ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. මෙහිදී හෙළ කතෝලික කලාවේ, සාහිත්‍යයේ හා ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ දීර්ඝ කාලයක් විශිෂ්ට සේවාවක් කළ තිදෙනකුට උපහාර පිදීමක් සිදුවූ අතර පිළිවෙලින් ප්‍රවීන කාටුන් ශිල්පී කැමිලස් පෙරේරා, ප්‍රකට කවියකු හා සාහිත්‍යකරුවකු වූ නුංගමුගෙ ාඩ විල්සන් රූද්‍රිගු හා ප්‍රවීන ජනමාධ්‍යවේදියකු වූ මොරටුවේ හෙන්රි ප්‍රියශාන්ත මෙන්ඩිස් මහතුන්ට බණ්ඩාරවෙල නි.ම.නි දෙව්සත්හලේ අදියුරු ගරු රොෂාන් ප්‍රනාන්දු පියතුමා උපහාර පිදූ අයුරු. භක්ති ප්‍රබෝධන සංස්කාරක ගරු ඩිලාන් පෙරේරා නි.ම.නි පියනමද මෙහි සිටී.

ටී. සුනිල් ප්‍රනාන්දු

## මොරගොඩ රජත ජයන්තියට සැරසේ

මොරගොඩ මීසමට වසර විසිපහක් පිරීම නිමිත්තෙන් මීසමේ අධ්‍යාත්මික වැඩසටහන් කිහිපයක් ආරම්භ කැරිණ. පුරා සති දෙකක් තුළ දිව්‍ය ගැලවුම්කරුවාණන්ගේ නිකායික පියතුමන් තිදෙනෙකු හා මීසම් සේවක ගරු රවීන් සඳසිරි පියතුමාගේ මඟපෙන්වීම මත නිවෙස් බැහැදැක, ළමා, තරුණ, වැඩිහිටියන් සඳහා විශේෂ දින වෙන්කොට අධ්‍යාත්මික වැඩසටහන් සංවිධානය කැරිණ.

රෝගීන් සඳහා දිනක් වෙන්කොට ඔවුන්ට සුවය පතා විශේෂ දේව මෙහෙයක් පවත්වන ලදි. ධර්ම විවේක කාලය තුළ දිනපතා රාත්‍රි දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව සමඟින් දිව්‍ය පූජාව පවත්වා ගැඹුරු අධ්‍යාත්මික පෝෂණයක් ලබා දුනි.

සුදත් රොහාන්

## නත්තල් ගුවන් විදුලි වැඩසටහන්

**ස්වදේශිය සේවය 91.7-91.9FM**

දෙසැ. 19 පෙ.ව. 07.00-08.00 සුභාරති - කිතු දහමින් ඉගැන්වෙන සැබෑ කිතුනුවා යනු කවුරුන්ද?, පෙ.ව. 11.30-12.00 ගරු බෙනඩික් ජෝශප් පියතුමා, ප.ව. 03.00-05.30 නත්තල් බැති ගී තරගය හා ප්‍රසංගය, දෙසැ. 20 පෙ.ව. 09.30-10.00 ගරු ජූඩ් ක්‍රිෂාන්ත පියතුමා, දෙසැ. 21 පෙ.ව. 07.00-08.00 සුභාරති - නත්තල් සමයේ ඔබගේ ශරීර සුවතාව කෙසේ විය යුතුද? ප.ව. 02.00-02.30 ගරු ජෙරල්ඩ් ප්‍රනාන්දු පියතුමා, රාත්‍රී 07.30-08.00 සිනගෝගය - ගරු ප්‍රැන්සිස් සේනානායක පියතුමා, දෙසැ. 22 පෙ.ව. 07.00-08.00 සුභාරතී - ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික පෝෂණයට කිතු දහමෙන් ලද දායකත්වය, පෙ.ව. 09.00-09.15 සහෝදර රවීන් කල්දේරා, ප.ව. 01.30-02.00 ලෙනාඩ් කුරේ මහතා

## වැලිකන්න නව දේවස්ථාන ගොඩනැගිල්ලට මුල්ගල් තබයි



වග මීසමේ වැලිකන්න ශුද්ධවූ ජපමාල මාතා නව දේවස්ථාන ගොඩනැගිල්ල සඳහා මුල්ගල තැබීමේ උත්සවය වාර්ෂික මංගලෝත්සවයේදී අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

වසර 135 ක් පමණ පැරණි වර්තමාන දේවස්ථානය අබලන් තත්ත්වයේ පැවතීම නිසා කලකට පෙර ඇරැඹූ ගොඩනැගිලි අරමුදල ඔස්සේ වර්තමාන මීසම් සේවක ගරු ප්‍රසන්න සංජීව පෙරේරා පියතුමා ව්‍යාපෘති කිහිපයක් මෙහෙයවමින් විවිධ කමිටු පිහිටුවමින් සංවිධානාත්මකව කටයුතු අරඹා තිබේ.

වැලිකන්න සංඝයේ ක්‍රියාකාරි සාමාජිකයකුව සිට නැසීගිය ජෝන් රූපසිංහ මහතාගේ පවුලේ අය විසින් වර්තමාන දේවස්ථාන ඉඩමට යාබද අක්කරයකට වැඩි භූමි භාගයක් දේවස්ථානයට පරිත්‍යාග කිරීමෙන් පසු කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ආශිර්වාදය හා අවසරය ඇතිව පරිත්‍යාග වශයෙන් ලැබුණු උස් භූමියේ නව දේවස්ථානය ගොඩනැගීමට තීරනය වී ඉඩම සකස් කිරීමේ කටයුතු ලහිලහියේ සිදුවිය.

මෙම අවස්ථාවට ධර්මදූත සේවා කලාපීය නාහිමි අතිගරු සිරිල් ගාමිණි ප්‍රනාන්දු, ගුරුබැවිල දිසානායක ගරු ගියොම් නෝනිස් හිටපු මීසම් සේවක ගරු එච්. ඩී. ඇන්තනි ප්‍රැන්සිස් ජයකොඩි, ශ්‍රීනාත් මනෝජ් පෙරේරා හා මීසම් පුතණුවන් වන ගරු ක්‍රිස්පින් ලියෝ සහ ගරු අරුණ අත්තනායක පියතුමා සමග පියවරුන් කිහිපපලක්ද වග විහාරාධිපති පූජ්‍ය කහහේනේ මේධානන්ද නායක ස්ථිවර හිමිපාණන්ගේ සහභාගිත්වයෙන් උත්සවය විචිත්‍රවත් විය.

ප්‍රසාද් කිරිහේන

## කැරොල් තරගයෙන් බඩල්ගම මුලට

කටාන දිසාවේ බඩල්ගම මීසම 2012 වසරේ කැරොල් ගායනා තරගයෙන් ප්‍රථම ස්ථානය දිනා ගන්නා ලදී. එහිදී දරුවන්ගේ කැපවීම හා නිරන්තර පුහුණුවීම් කටයුතු අගය කළ යුතු අතර මීසම් සේවක ගරු ඇන්ටන් රංජිත් පියතුමාගේ මඟපෙන්වීම හා සහයෝගය ද අගය කළයුතුය.

කේ. අබේසේකර



ශුද්ධවූ බයිබලයේ නව සිංහල අනුවාදය තෙවන සංස්කරණය අන්තර් ජාලයට මුදාහැරීම පසුගියදා ශ්‍රී ලංකා බයිබල් සමාග මේ ශ්‍රවණාගාරයේදී සිදුකෙරිණි. එම ශුද්ධ බයිබලයේ තෙවන සංස්කරණ කමිටුවේ සභාපති ගරු ආචාර්ය හෙන්රි සිල්වා පියතුමා නව වෙබ් අඩවිය විවෘත කළ අයුරු. ශ්‍රී ලංකා බයිබල් සමාගමේ සභාපති මේජර් ඩග්ලස් විජේසිංහ මහතා සමග ලේඛකාධිකාරිනී ලක්ෂානි ප්‍රනාන්දු මහත්මිය සමග වෙබ් අඩවි නිර්මාතෘ අශාන්ත් ඩෑන් මහතා ද මෙහි වෙති.

ටී. සුනිල් ප්‍රනාන්දු

## අලුත් ජීවිතයකට ඇරියුමක්!

ශුද්ධෝත්තම පියතුමා මේ වසර 'විශ්වාසයේ වසර' ලෙස ප්‍රකාශ කළේ අලුත් ජීවිතයක් ගත කරන්න අපට ආරාධනා කරමින්. අධ්‍යාත්මික විශ්වාසයක් බොහෝ දෙනා තුළ නැහැ. මරාගන්නවා. චරිත ඝාතනය කරනවා. දිව්‍ය පූජාවට, මංගල්‍ය පැවැත්වීමට, නුවාන වලට සහභාගි වීම, සමිති සමාගම් වලට සම්බන්ධ වූ පමණින් නියම කතෝලිකයන් වෙන්නේ නැහැ. ඒ නිසා විශ්වාසය අප තුළ ජනිත කළ යුතුයි. සිත් සුවය සාමය, සතුට අත් දකින්නට නම් අපේ ජීවිතය උත්ථාන වූ ස්වාමින් වහන්සේ බව පිළිගනිමින් අනෙක් අයව ජීවත් කරන්න උනන්දු විය යුතු යැයි කොළඹ අගරදගුරු පදවි 'සෙත්සරණ' අධ්‍යක්ෂ ගරු රොහාන් ද අල්විස් පියතුමා පැවසීය.

උන්වහන්සේ මේ බැව් ප්‍රකාශ කළේ බෝපිටිය ශු. නිකුලා මුනිඳුන්ගේ දේවස්ථානයේ වාර්ෂික මංගල මෙහෙයේ දේශනය කරමිනි. මංගල දිව්‍ය යාගයෙන් පසුව ප්‍රතිමාව රැගෙන ජුබිලි මාවත ඔස්සේ පෙරහර වීදි සංචාරය කෙරිණි. සන්ධ්‍යා මෙහෙය කොළඹ උතුරු කලාපීය නාහිමි අතිගරු ප්‍රැට්ක් පෙරේරා පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර මීසම් සේවක ගරු එරින්ටන් ද සිල්වා පියතුමාගේ මෙහෙයවීමෙන් මීසම් ධර්ම සේවා සභා මංගල උලෙළ මනාව සංවිධානය කර තිබුණි.

ඇන්ටන් ජයසූරිය

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk

ක්‍රිස්තු වර්ෂ 2012 දෙසැම්බර් 16 ඉරිදා

# නත්තලට පෙර විසඳුමක් ලැබුනොත්......

"ඕස්ට්‍රේලියාවට යන්න ගිහින් රිමාන්ඩ් කර සිටින සැමියන් නත්තලට පෙර නිදහස් කරන්න" යන ආයාචනාත්මක ඉල්ලීම සමග පසුගිය දිනක ඔවුන්ගේ බිරින්දෑවරු සිය දරුවන් හා සමග විරෝධතාවක නිරත වූ බව පුවත්පත් කිහිපයකම ගෙවුනු දිනවල සඳහන්ව තිබුණි. මීගමුව බස් නැවතුම් පොළ අබියස විරෝධතාවක යෙදුනු මේ අඹු දරුවන්ද, ඥාතින්ද උදක්ම රජයෙන් ඉල්ලා සිටින්නේ නීති විරෝධි ලෙස ඕස්ට්‍රේලියාවට යන්නට ගොස් එම සිද්ධීන්වලට සම්බන්ධව රිමාන්ඩ් බාරේ සිටින පුද්ගලයින් නත්තලට පෙර නිදහස් කරදෙන ලෙසයි.

හුදෙක් මානුෂික දැක්මකම පිහිටා මේ ප්‍රශ්නය දෙස බැලිය යුතු බව කාගේත් හැඟීමයි. නීතිමය රාමුව තුළ මෙහි විවිධ අර්ථකථනයන් ඇතත් මෙවන් තත්ත්වයන් උදාවීමට බලපාන බාහිර සාධක ගණනාවක්ම දැනට දේශය තුළ උදාවී ඇති සෙයක්ද නැත්තේ නොවේ. එහිදි ධීවර ජනතාවට බලපා ඇති ආර්ථික ප්‍රශ්න පිළිබඳව එකින් එක ගෙන හෝ විස්තර කිරීම උගහට වී ඇත. ඒ සියලු දැවෙන ප්‍රශ්න හමුවේ යම් ආර්ථික හා පවුල් ජීවිතයේ සහනයකට මෙවන් පියවර හිතට එකඟ නොවී හෝ ගැනීමට පුද්ගලයින් පෙළඹෙන්නේ යම් සැනසීමේ තත්ත්වයක් පතා බව යන්නත් තේරුම් ගත යුතුයි.

මෙහිදී නීති විරෝධිව වඩ වඩා ජනතාව ඕස්ට්‍රේලියාවට යා යුතුය යන්න අපි කිසිසේත් නොකියමු. යා යුතු ක්‍රමවේද නිසි පරිදි අවබෝධ කරගෙන, තමන් එවන් රටක කරන රැකියාව පිළිබඳව නිසි අවබෝධයක් ඇතිව මෙවැනි ගමන් නීත්‍යානුකූලව සකස් කර ගත යුතුයි. අනික් අතට මෙවන් ගමනක් සූදානම් කර ගැනීමේදී ලක්ෂ ගණනින් මුදල් වියදම් කිරීමටද සිදුවෙනු ලබයි. නමුත් නිසි අවබෝධයකින් තොරව ගේ දොර ඉඩ කඩම් උගස්කර හෝ විකුණා ලක්ෂ ගණනින් ඉතා අසීරුවෙන් මුදල් ලබා ගෙන අයථා ලෙස කරන මේ ගමන් ගනුදෙනු වලදී සිදුවන්නේ ඒ සියලු මුදල් පවා සැනෙකින් අහිමි වීමයි.

ආර්ථික අමාරුකම් මැද පීඩා විඳින පවුලක් යම් සහනයක් ලබා ගැනීමට කියා ක්‍රියා කිරීමේදී තවත් ආර්ථික නරාවලක් සපයා ඇති මේ නීති විරෝධි ගමන් නිසා අද අපා දුක් විඳින්නේ මේ අහිංසක බිරින්දෑවරුන් සහ දූ දරුවන්ය. එදා විරෝධතාවට සම්බන්ධ වූ පිරිස් එක හඬින් කියා සිටි කථාන්දරය මෙය තවත් සනාථ නොකරන්නේද? ඔවුන් එකහඬින් පවසා ඇත්තේ ඔවුන්ගේ සැමියන් රක්ෂිත බන්ධනාගාරගතව සිටීම නිසා ඔවුන් දැන් ආර්ථික වශයෙන් අන්ත අසරණ තත්ත්වයකට වැටී සිටින බවත් මෙම තත්ත්වය මත තම දූ දරුවන්ගේ අධ්‍යාපනය කඩා වැටී හරි හමන් බත් වේලක් පවා කන්නට නොහැකිවී තිබෙන බවත්ය.

මේ තත්ත්වය සැබවින්ම අවබෝධ කරගෙන ජනතාව දැනුම්වත් කිරීමට කටයුතු කිරීම වගකිව යුත්තන්ගේ වගකීම බවද මෙහි දී පවසන්නෙමු. ජීවිත වල කාගේත් සිහින අපේක්ෂා එමට ඇත. එහිදී දෙමව්පියන්ගේ ඒකායන උත්සහය වනුයේ තමන්ට වඩා හිතකර යහපත් වාතාවරණයක් තම දරුවන්ට උදාකර දීමයි. ඒ අපේක්ෂා ඉටු කරන්නට දිනෙන් දින ගන්නා උත්සහයන් මිලාන වන විට ජීවිතයේ ගැහැට මත තවත් එය දරාගත නොහැකි වූ තැන යම් ක්‍රමවේදයකට ගොනු වී ජීවිතයේ ක්ෂේම භූමියක් පැතීම ඒ තත්ත්වයේ ඉන්න පුද්ගලයින්ගේ අපේක්ෂාව බව තේරුම් ගත යුතුයි. විශේෂයෙන්ම ඉරණවිල, හලාවත, තොඩුවාව, කල්පිටිය, මීගමුව යන ප්‍රදේශ වල අහිංසක ධීවර ජනතාව දළ රළ මත ජීවිතයේ අභියෝගයට මුහුණ දෙන්නේ ජීවිතය ජය ගන්නට බව අමතක කළ යුතු නොවේ.

මෑතක සිට ඉන්ධන මිල ප්‍රශ්නය, දැල් ආම්පන්න ප්‍රශ්නය හා විවිධ තහංචි මත ධීවර රැකියාවට මුහුණ පෑමට සිදු වූ අනේක විද ගැහැට අමතක කළ යුතු නොවේ. එයට විසඳුමක් නොමැති වූ තැන ජීවිතය ජය ගන්නට කෙසේ හෝ තවත් පියවරක් කරා නිතැතින්ම යොමු වීම ස්වාභාවිකයි. එහිදි නීතියේ රාමුවට එකඟවත් එයින් පිටතත් තීරණ ගැනීමට ඔවුන් පෙළඹෙන්නේ කඩිනම් විසඳුමකට තම පවුල් සංස්ථාව අපේක්ෂා කරන සහන අත්දැකීම ලබා දීමටයි. නමුත් විශාල මුදලක් වැයකර තම ජීවිත පවා අවදානමට හෙලමින් නීතියේ රාමුවට පිටින් මෙවන් පියවර ගැනීම නම් අනුමත කළ හැකි නොවේ.

නමුත් දැන් සිදුවීම් ගණනාවක් තුළින් අහිතකර දැඩි බලපෑම් එල්ල වී ඇත්තේ අසරණ පවුල් සංඛ්‍යාවකට නිසා ඔවුන්වත් දැනුම්වත් කරමින් මෙය විසඳීමේ කඩිනම් ක්‍රියා මාර්ගය මානුෂික මුහුණුවරක් ගත යුතුමයි. මෙහිදි ඔවුන්ගේ ඉල්ලීම කෙලින්ම යොමුවී ඇත්තේ රටේ ජනාධිපතිවරයා වෙතයි. තමන් මෙම විරෝධතාව පවත්වන්නේ දේශපාලන භේද වලින් තොරව බවත් උදාවන්නට තිබෙන නත්තලට පෙර සැමියන් නිදහස් කරන ලෙසත් කරන ඔවුන්ගේ ඉල්ලීමෙහි දැඩි ආධ්‍යාත්මික නැඹුරත්වයක්ද ඇත.

එම නිසා මෙම ජනතාව අයත් වන ඒ ඒ මීසම් වල පියතුමන්ලා ඇතුළු අනෙකුත් සාමාජීය සංවිධානයන් මේ පිළිබඳව දැඩිව අවධානය යොමුකළ යුතුව ඇත. ඒ සංවිධාන ශක්තිය තුළ ඒකරාශිවී ඔවුනුත් ජනාධිපතිතුමන් වෙත මේ ඉල්ලීම ඉදිරිපත් කළ යුත්තේ සැබවින්ම මෙහි මානුෂීය මුහුණුවරක් ඇති නිසාමයි. අසරණ පවුල්වල හඬ හදවත් වලට දැඩිව දැනෙන නිසාමයි.

ඒ පවුල් වලටත් අයිති සාමය සැනසීම හා සතුට උදාකර දීම කාගෙත් යුතුකම වන නිසා සැවොම එකතුව ඒ හඬට යම් පන්නරයක් දෙමු. ජනාධිපති තුමන් වෙත ඉදිරිපත් කරන මේ ආයාචනය හුදෙක් ඉදිරිපත් වන්නේ නත්තල උදාවීමට තවත් දින කිහිපයක් තිබියදී බවත් මතක් කර ගනිමින් සහනදායි පිළිවෙතකින් හා දැනුම්වත් කිරීමකින් මෙන්ම සතුටුදායි පිළිතුරකින් කඩිනමින් මේ ප්‍රශ්නය නිරාකරණය කර ගන්නට මාවතක් විවෘත කර දෙන්න යන්න එතුමාණන්ගෙන් හා සියලු වගකිව යුත්තන්ගෙන් ඉතා බැගෑපත්ව ඉල්ලා සිටිමු. .

විශ්වාසයේ වසර
දහම් චින්තා 10

# අන්ධකාරයට අප බිය විය යුතුද?

අද බොහෝ දෙනෙක් එළැඹෙන නත්තලට පෙරාතුව සිදුවේ යැයි කියන තෙදිනක අඳුරක් පවතින රාත්‍රියක් ගැන කතා කරති. ඇතැම්හු සිදුවෙන්නට යනවා යැයි කියන ලෝක විනාශය හේතුවෙන් හටගත් බියෙන් වියවුල් වී සිටිති. මේ අතර මේ තුන් දින රාත්‍රිය ගතකරන්නට පාස්කු ඉටිපහන් දල්වාගත යුතු බවට මත පළ කරන්නෝද වෙති. තවද මෙවැනි ලෝක විනාශයක් හුදු මිත්‍යා මතයක් මිස විද්‍යාත්මක පදනමක් ඇත්තක් නොවන බව පවසන්නෝද වෙත්. කියනා ලෙසටම දෙරණ වසා තුන්දින අඳුරක් ඇතිවන්නේ නම් ඉන් අපට සමිඳාණන් ආරාධනය කරනුයේ කුමක්ද? ඒ කාලයට අප කෙලෙස සූදානම් විය යුතුද? පාස්කු ඉටිපහන් දැල්වීමේ අරමුණ කුමක්ද? මේ කාරණා සලකා බැලීම සඳහා අන්ධකාරය හෙවත් රාත්‍රිය අර්ථකථනය කිරීම වැදගත් වේ.

අන්ධකාරයේ ඇවිද්ද සෙනග මහත් ආලෝකයක් දුටු බවද, ගන'ඳුරු දේශයෙහි විසූ අය කෙරෙන් එළියක් දැන් බැබළෙන බවද යෙසායා දිවැසිවරයා පවසයි (යෙසායා 9:2). ඒ අන්ධකාරය වනාහි දෙවියන් වහන්සේ සියල්ල මැවීමට ප්‍රථම දෙරණ වසා පැවති දෙයයි (උත්පත්ති 1:1). මිනිස් මිම්මෙන් මෙන්ම හුදු වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම රාත්‍රිය යනු, බිය, අවිනිශ්චිතකම, අනාගතය හා ඊළඟ මොහොත කෙරෙහි වන අපැහැදිලි බව ගෙන එන යථාර්ථයකි. කොටින්ම කියතොත් මිනිස් සිත තුළ බියක් උපදවන්නකි. මතු බලාපොරොත්තු මොහොතකට හෝ හීන කරවන්නකි. ශු. බයිබලීය ඉතිහාසය දෙස බලන කල පෙනීයන්නේ රාත්‍රිය හා අන්ධකාරය කෙතරම් ප්‍රබල වූවත් දෙවියන් වහන්සේ අති ප්‍රබල ක්‍රියා ඊශ්‍රායෙල් ජනයා තුළ සිදුකළේ රාත්‍රියේදී බවයි. උන්වහන්සේ ස්වකීය බාහු බලයෙන් විකුම් පා ඊශ්‍රායෙල් ජනතාව ඊජිප්තුවේ පාරාවෝගේ වහල් සේවයෙන් මුදාගත්තේද, ඊජිප්තුවේ කුළුඳුලන් පිට මරණ බිය හා පීඩාව ගෙනඑමින් තම ජනතාව මුදා ගත්තේද ඒ රාත්‍රියේදී බව පාස්කු මංගල ගීය අපට උගන්වයි. තවද ගිනි ටැඹක් සේ වැඩවසමින් පොරොන්දු දේශය කරා උන්වහන්සේ සෙනඟ ගෙන ගියේද ඒ රාත්‍රියේදී බව පාස්කු මංගල ගීය පවසයි. එපමණකුත් නොව ක්‍රිස්තුන් වහන්සේ දින තුනක් පාතාල



ලෝකයේ වැඩසිට විරාජමානව උත්ථාන වෙමින් මරණයේ සිර මැදිරි විසුනු කළේ ඒ භාග්‍යවත් රාත්‍රියේදි බව එම ගීය පවසයි. එසේනම්, එළැඹෙන්නට නියමිත යැයි කියන දින තුනේ රාත්‍රිය සහ ගැලවීමේ ඉතිහාසයේ අති සුවිශේෂි වූ පාස්කු විජයග්‍රහණයේ රාත්‍රිය අතර සම්බන්ධතාවයක් පවතීද? ඕනෑම අඳුරක් හෝ රාත්‍රියක් බිය උපදවන්නේ නම් මෙම රාත්‍රීන් දෙකට එනම් එළැඹෙන දින තුනේ රාත්‍රිය හා පාස්කු රාත්‍රිය දෙආකාරයක බියක් උපදවයි. පළමුවැන්නෙන් හටගනුයේ ලෞකික බියකි. දෙවැන්න උපදවන්නේ දේව ගරු බියයි. ලෞකික බිය වනාහි භෞතික ලෝකයේ ඇතිවන කැළඹිල්ල හේතුවෙන් යක්ෂයා විසින් උපදවන්නාවූ දෙයයි. එය අපව බෙලහීන, පාපිෂ්ඨ හා දුර්වල අත්දැකීමට ගෙනයයි; අපගේ අධ්‍යාත්මය විකෘති කරයි. එහෙත් ගැලවීමේ අති සුවිශේෂි රාත්‍රිය අපට ගෙනඑන පණිවුඩය වනුයේ ශු. බයිබලයේ 365 වරක් සඳහන් වන 'බිය නොවන්න' යන පණිවුඩයයි. 'නිශ්චල වන්න මා දෙවිඳුන් බව සිතට ගන්න' (ගීතා 46:10) කියාද, අප නොකැළැඹී, නොබියව සිටින්න. (උන්වහන්සේම) අප උදෙසා සටන් කරන බවද උගන්වයි. (නික්මයාම 14:14) එසේනම් එළැඹෙන දින තුනේ අත්දැකීම අපව ඇතුළු කරනුයේ අපි දේව ගරුබිය ඇත්තෝද නැතහොත් මිනිස් ගරුබිය ඇත්තෝද යන්න විමසා බැලීමටය. අපි දේව ගරුබිය ඇත්තෝ වෙමු. එනිසා අප කළ යුත්තේ දෙවියන් වහන්සේට අපගේ ජීවිතවල මුළු අයිතිය ලබා දීම පමණකි. අප එසේ කරන විට දෙවියන් වහන්සේ එම රාත්‍රිය හරහා ගමන් කොට හැම නපුරක්ම පරදා හැම දෙයක්ම අප උදෙසා විජයග්‍රහණය කරන සේක.

එළඹෙතැයි කියන අඳුර දින තුනක් වන්නේ ඇයි? එය කවරක් වූවත් එය ගැලවීමේ අභිරහස වන ක්‍රිස්තුන් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානය වන තෙදිනේ උත්තුංග යථාර්ථය අපට පසක් කර දෙයි. එනම් උන්වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානය අප සිදුකරනුයේ තෙදිනක් තුළයි. තවද අප ස්වාමින් වහන්සේ අන්ධකාරය ගෙනා වේදනාව, පාපය හේතුකොටගෙන උපදින බිය තමන් වහන්සේ වෙත පවරාගෙන මුළු මිනිස් සංහතිය වෙනුවෙන් අඳුරේ පැය ගත කළ බවද ශු. ලියවිල්ල මොනවට පැහැදිලි කරයි. එසේනම් එළැඹෙතැයි කියන තුන්දින අඳුර හා පාස්කු ඉටිපහන දැල්වීම අතර ඇති සම්බන්ධතාවය කුමක්ද? පාස්කු රාත්‍රියේදී දල්වනු ලබන පාස්කු ඉටිපහන ක්‍රිස්තුන් වහන්සේ අපගේ ආලෝකය වන බව ප්‍රකාශ කරයි. එනම් ඔවුන් වහන්සේ පාපයේ අවසාන සතුරා වන මරණය සදහටම විනාශකර සැබෑ ආලෝකයාණෝ වූ සේක. එසේනම් පාස්කු රාත්‍රියේදී නව ගින්න ආසිරි ගන්වා ඉන් ඉටිපහන් දල්වන කිතුනුවෝ ක්‍රිස්තුන් වහන්සේ සැබෑ ආලෝකය බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්නෝ වෙත්.

තවද එදින රාත්‍රියේදි ඉටිපහන් දල්වමින් බෞතිස්ම ස්නාපන පොරොන්දු අලුත් කරගන්නා ඔව්හු යක්ෂයාද, උගේ ක්‍රියාද, ඌට නැකම් කියන ලෝකයා, මාංශයා ඇතුළු සැම දෙයක්ම ත්‍යාජ කරමින් ඇදහිල්ල ප්‍රකාශ කරති. ඒ ඇදහිල්ල වනාහි අහස පොළව මැවූ සර්වබලධාරී දෙවි පියාණන් ඔවුන් වහන්සේගේ ඒක ජාතක පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ හා පරිශුද්ධාත්මයාණන් වන ශුද්ධාත්මයාණන් වහන්සේ කෙරෙහි වන ඇදහිල්ලය. එය වනාහි කන්‍යා මරියාවන්ගෙන්

මිනිස් බව ගෙන දුක්විඳීම, මරණය හා උත්ථානය ඔස්සේ අජරාමරව අහස් නැඟී, මතු වඩින කිතු සමිඳාණන් කෙරෙහි වන ඇදහිල්ලය. තවද එය සාන්ත සභාව කෙරෙහි මෙන්ම, යුගාන්තයේදී සිදුවන මාංහෝස්ථානය කෙරෙහි වන ඇදහිල්ලය. කොටින්ම කියතොත් මින් අපි ප්‍රබලවම ප්‍රකාශ කරනුයේ අන්ධකාරයේ රජාණන් වන යක්ෂයාව අපි ත්‍යාජ කර, ක්‍රිස්තුන් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානය තුළ දිනාදුන් බෞතිස්ම කැඳවීම පිළිගෙන ඔවුන් වහන්සේව ආලෝකයේ රජාණන් හා අපේ එකම ස්වාමියාණන් ලෙස පිළිගැනීමය. එලෙසින් බලන

15 පිටුවට »

ගරු ලලිත් එක්ස්පෙඩිටස් පියතුමා

කැම්ලස්ගේ — තිත්ත ඇත්ත



## මීසමෙන් මීසමට

# කතෝලිකකම ලියා පදිංචියට පමණක් නොවේ

## බදුල්ල රදගුරු හිම්පාණෝ අවධාරණය කරති

ක්‍රිස්තියානින් වශයෙන් අපගෙන් බලාපොරොත්තුවන්නේ අසල්වැසි ප්‍රේමය පිටාර ගැලීමට සලස්වා ස්වාමින්වහන්සේගේ ප්‍රේමයට සාක්ෂි දැරීමයි. එය කළහැක්කේ දෙවිපියාණන්ට සම්බන්ධ වී, උන්වහන්සේ දැන හැඳිනගෙන, ජීවිත පූජාව මගින් අපට ගැලවීම දුන් ජේසුස් වහන්සේව හඳුනාගත් ශු. පියෝ පියතුමා මෙන් ජීවත්වුවොත් පමණයි. එසේ නොමැතිව රෙජිස්ටර් වෙලා කතෝලිකකම තබාගෙන පලක් නැහැ.” බදුල්ල රදගුරු අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි හිම්පාණෝ බදුල්ල පදවියේ ප්‍රථම වතාවට ශු. පියෝ පියතුමාට කැපවූ දෙව්මැඳුරක් ස්ප්‍රිංවැලි මේමලේ වතුයායේ විවෘත කළ අවස්ථාවේ දී පැවසූහ.

2011 මාර්තු 10 වන දින ආරම්භ කළ මෙම දෙව්මැඳුර මෙතරම් ඉක්මනින් නිමකිරීමට ලැබීම දේව වරප්‍රසාදයක් බව මීසම් සේවක ගරු ප්‍රියලාල් කුරේ පියතුමා පැවසීය. දෙව්මැඳුර තැනීමට උරදුන් ගරු මාලන් ඇන්තනි, ගරු රෙජී කුමාර්, ගරු රොබට් ජේකබ් පියතුමන් ඇතුළු පැවිදි සොයුරියෝද සහභාගි වූහ.

ශ්‍රීකාන්ති ගුණවර්ධන



අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිම්පාණන්ට උපහාර දැක්වීමේ සුහද හමුවක් දලාසාල් උත්සව ශාලාවේදී පවත්වන ලදි. මේ උපහාර උලෙළ සංවිධානය කරන ලද්දේ ග්‍රෑන්ඩ්පාස් සා. ජෝශප් විදුහලේ එවකට සේවයේ යෙදී සිටි විදුහල්පති ගරු ප්ලැසිඩස් සහෝදර තුමන් හා එම ආචාර්ය මණ්ඩලය විසිනි. මේ එහි අවස්ථාවක්.

ජූඩ් සේනාධිර

## වාර්ෂික බත් දානය මෙවරත්

තඹරවිල නිර්දෝෂ දේවමාතා වහන්සේගේ මංගල්‍යය නිමිත්තෙන් වාර්ෂිකව තඹරවිල මංසන්ධියේ පිහිටා ඇති දෙව්මව් ප්‍රතිමාව අසල පැවැත්වෙන බත් දානය මෙවරද මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය.

ඩබ්ලිව්. හෙක්ටර් ප්‍රනාන්දු



මීගමුව සා. පිතර දේවස්ථානයේ මීසම් සභාව හා මීසම් වැසියන් එක්ව ලක්ෂ අටක පමණ මුදලක් වැයකර ස්ථිර නිවසක් නොමැති මීසම් වාසි පවුලකට නිවසක් තනා දීමේ සත්කාරය හිටපු මීසම් සේවක ගරු ලෙස්ටර් විජේසූරිය හා නව මීසම් සේවක ලියෝ කැමිලස් හෙට්ටිආරච්චි යන ගරු පියතුමන්ගේ මූලිකත්වයෙන් සිදුකරන ලදි. නිවසෙහි යතුර නිවාස ලාභී රෝහන් ජයසේකර මහතාට හා එම මහත්මියට නව මීසම් සේවක ගරු ලියෝ කැමිලස් හෙට්ටිආරච්චි පියතුමා භාර දෙන මොහොත. හිටපු මීසම් සේවක ගරු ලෙස්ටර් විජේසූරිය පියතුමාද සේයාරුවේ සිටී.

රේමන් අපෝන්සු

## ගබ්සා විරෝධී නාට්‍යය තඹකන්දේදී

ගබ්සා විරෝධී නත්තල් නාට්‍යයක් රඟදැක්වීමට තඹකන්ද මීසම් සංඝය පියවර ගෙන තිබේ.

මීසම් සේවක ගරු ස්ටැන්ලි ජෝශප් පීරිස් පියතුමාගේ අනුශාසනා පරිදි මෙම නත්තල් නාට්‍යය සඳහා විශේෂඥ උපදේශකත්වය ජාතික පවුල් සේවා අපෝස්තලික සේවා අධ්‍යක්ෂ ගරු ආචාර්ය ජුලියන් පැට්‍රික් පෙරේරා පියතුමන් විසින් ලබාදී ඇත. දෙසැ. 21 සිකුරාදා පන්නල ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගණයේ පැවැත්වෙන විශේෂ නත්තල් උත්සවයේදී මේ නාට්‍යය රඟ දැක්වේ.

සිසිල් ඩැනීසියස්



කඳාන සා. සෙබස්තියන් මහා විදුහලට බස් රථයක් මිළදී ගැනීම සඳහා පාසල් සංවර්ධන සමිතිය මගින් ලක්ෂ 15 ක මුදලක් ලබාදීම ඉකුත්දා සිදුවිය. එම චෙක්පත පාසල් සංවර්ධන සමිතියේ සභාපති සනත් විරප්පෙරුම මහතා ඇතුළු නිලධාරීන් විසින් විදුහල්පති ඩබ්ලිව්. ලාල් කුමාර හා නියෝජ්‍ය විදුහල්පති ගරු හේමන්ත ප්‍රනාන්දු පියතුමාට බාර දුන් අවස්ථාවයි මේ.

ඇන්ටන් ජයසූරිය

### වෙළෙඳ සේවයේ නත්තල් වැඩසටහන්

දෙසැ. 19-22 ප.ව. 8-8.30 නත්තල් ගීත නාට්‍යය

දෙසැ. 10-22 නත්තල් බැති ගී (පැයකට වරක්)

## අද අපේ පවුල් වලට විශ්වාසයේ ශක්තිය අවශ්‍යයි

“අප දෙවියන් කෙරෙහි විශ්වාස කරනවා නමුත් අපගේ විශ්වාසය මාලිමාව වගේ සැලෙනවා. අද අපේ පවුල් වලට විශ්වාසයේ ශක්තිමත්කම අවශ්‍යයයි”. ප්‍රැන්සිස්කන් නිකායේ ගරු ජූඩ් ශාමන් ප්‍රනාන්දු පියතුමා එසේ පැවසුවේ, මොරටු දිසාවේ දිව්‍ය හෘද සමිති සාමාජිකාවන් වෙනුවෙන් පසුගියදා කොරළවැල්ල සා. මිකායෙල් දෙව්මැඳුරු ශාලාවේ පැවති එක් දින ධර්ම විවේකයේදීය.

ධර්ම විවේකයට දිසාවේ සාමාජිකාවන් බොහෝ පිරිසක් සහභාගි වූ අතර මෙය සංවිධානය කළේ සමිති උපාධ්‍ය හා කොරළවැල්ල මීසම් සේවක ගරු එරික් මදුරාවල පැ.තු.නි පියතුමාය.

ඩොරින් පෙරේරා

## පේරාදෙණිය මීසමේ වැසි මැද ශ්‍රමදානයක්!

පේරාදෙණිය සා. තෙරේසා දෙව්මැඳුර සහ මීසම් ශාලාව ඇතුළු දෙව්මැඳුරු භූමිය පසුගියදා ශ්‍රමදානයකින් පිරිසිදු කරන ලදී.

නව මීසම් සේවක ගරු ලලිත් තුෂාර අමරසිංහ පියතුමාගේ උපදෙස් පරිදි වල් වැදී තිබූ සුසාන භූමිය, දේවස්ථාන භූමිය සහ ගරා වැටෙමින් තිබූ සියලුම දෑ ඉවත්කොට නව ප්‍රතිසංස්කරණය සඳහා වැඩ පිළිවෙලකට අඩිතාලම දමන ලදී. පේරාදෙණිය මීසම් වාසීන් තද වැසි නොතකා එකම පවුලක් සේ කටයුතු කළ ආකාරය පිළිබඳව පැමිණ සිටි සියල්ලන්ට ස්තුති කොට සමිඳු වරම් පැතුවේය.

ජූඩ් ජේ. ප්‍රනාන්දු

## ශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර අරමුණු ඉටුකර ගැනීමට කරනු ලබන දිරිගැන්වීමය

ශිෂ්‍යත්වයක් එසේත් නොමැති නම් ශිෂ්‍යාධාරයක් ප්‍රදානය කිරීමේ අරමුණ අපේක්ෂිත බලාපොරොත්තු ඉටුකර ගැනීමට කරනු ලබන දිරි ගැන්වීමක්, විවිධ බාධක මැද ඉගෙනුම ලබන සිසු දරු දැරියන්ට තම අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගෙන යාමට මෙය අත් වැලක් වනවා. රැකියා අපේක්ෂිත දරු දැරියන්ට රැකියාව සඳහා අවශ්‍ය අමතර සුදුසුකම් සපුරාගන්නට මෙය පිටුවහලක් වනවා. ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය මගින් දියත් කරනු ලබන කීගල් ශිෂ්‍යාධාර හා පරිගණක පුහුණුව සඳහා දෙනු ලබන මූල්‍යාධාර කාලීන අවශ්‍යතා ඉටුකර දෙන සත් ක්‍රියාවක් වශයෙන් හැඳින්විය හැකියයි රත්නපුර ගරු මැල්පිංඤානෝ පිය සමරු ගොඩනැගිල්ලේ ශ්‍රවනාගාරයේ පැවති රත්නපුර පදවියේ කීගල් ශිෂ්‍යාධාර හා පරිසනක පුහුණු මූල්‍යාධාර ප්‍රදානය කිරීමේ උලෙළේදී ක්‍රි. ක. ව්‍යාපාරයේ ජාතික උපාධ්‍ය ගරු රන්ජන්මාල් මොරායස් පියතුමා පැවසීය.

මෙම උත්සවය අමතා ජාත්‍යන්තර සම්බන්ධිකාරක වරුන් වන ඇන්ටන් මංචනායක හා ශිරාන් මෛත්‍රි යන මහත්වරුද වැඩබලන ජාතික ලේඛිකා සුධර්මා කුමුදුමාලා පෙරේරා, ජාතික සභාපති ටී. සමරතුංග, පදවි ලේකම් නිශාන්ත විරවර්ධන යන මහත්ම මහත්මීහුද කතා කළහ. රත්නපුර මාටින් කීගල් ශිෂ්‍යාධාරලාභීන්ගේ සංසදය හා රත්නපුර ක්‍රි.ක. ව්‍යාපාර ශාඛාව උත්සව කටයුතු සංවිධානය කරතිබුණි.

මිණිපුර වාර්තාකරු

# කිතුනු විශ්වාසයට දිවිපිදු බිමේ ගොඩනැගුණු තෝට්ටවේලි - ප්‍රාණපරිත්‍යාගී රාජේශ්වරි දෙව්මැඳුර



පුදබිමක අසිරිය

කිතුනු ‘විශ්වාසයේ මිණි පහනක්’ යැයි විරුදාවලිය ලත් මන්නාරම සමිඳු කෙත අස්වැද්දීම සඳහා දෙව් සේවයට බොහෝදෙනකු එක්වූ තෝතැන්නකි. අතීතයේ යාපනය රදගුරු පදවියට අයත්ව තිබූ වන්නි හා මන්නාරම් දිස්ත්‍රික්ක එයින් වෙන්කොට වර්ෂ 1981 ජනවාරි 28 වන දින මන්නාරම නව පදවිය ලෙස ස්ථාපිත කරන ලදි. මරඳ මඩු සිද්ධස්ථානය ඇතුළු ඓතිහාසික වශයෙන් ඉතා වැදගත් ආගමික ස්ථාන බොහෝමයක් පිහිටි මේ ප්‍රදේශයේ කිතුනු බැතිමතුන් ඇතුළු එහි ජනයා අතීතයේ පටන් බොහෝ තාඩන, පීඩනයන්ට ලක්ව දිවි ගෙවූහ. මන්නාරම නගරය පසුකර තලෙයි මන්නාරම දක්වා දිවෙන මාර්ගයේදී, සැ. 03 ක දුරක් ගියවිට හමුවන තෝට්ටවේලි ගම්මානය ලක් කිතුනු ජනයා තුළ තිබූ විශ්වාසයේ අමරණීය සිහිවටනයන් සනිටුහන්වූ ග්‍රාමයකි. එනම් එහි කිතුනු ජනයාගේ වන්දනාමානයට ලක්වූ ප්‍රාණපරිත්‍යාගී රාජේශ්වරියගේ දෙව්මැඳුර පිහිටා ඇත.

දෙව්මැඳුර ගොඩනැංවීමට මුල්වූ අමිහිරි ඛේදජනක සිදුවීම් ඉතිහාසයේ සඳහන්වේ. පෘතුගීසි ආක්‍රමණයෙන් පසු දකුනු ඉන්දියාවේ ගෝවේහි වෙරළ බඩ ප්‍රදේශයන්හි ජීවත් වූ ජනයා කිතු දහම වැළඳගන්නට වූහ. ඔවුන් ගෙන් වැඩි දෙනෙකු ධීවර කාර්මිකයන් ලෙස තම ජීවිකාව කරගත් පිරිසක් විය. මේ පිරිස පිළිබඳ දැනගත් සභා පාලකයින් වර්ෂ 1842 දී ජේසු නිකායික ගරු ෆැන්සිස් ක්ෂේවියර් පියතුමා මෙහි එවා කිතුනු බැතිමතුන්ගේ විශ්වාසය ශක්තිමත් කරන ලදි. පියතුමා සිදුකළ දේශනයන් හා ප්‍රාතිහාර්යම ක්‍රියා මගින් තව බොහෝ පිරිසක් කිතු දහම වැළඳගන්නට විය. එකල ඉන්දියාවේ සිට ලක්බිමට පැමිණි පිරිස් අතරවූ තම හිතවතුන් මගින් එහිවූ කිතු දහම පිළිබඳ දැනගත් ජනයා තමන් හටද කිතු දහම දේශනා කිරීමට ලක්බිමට පැමිණෙන ලෙස එතුමන් වෙත ආරාධනා කර පණිවුඩ යවන ලදි. එහෙත් උන්වහන්සේට ලක්බිමට පැමිණීමට නොහැකි තත්ත්වය හේතුවෙන් ගෝවේහි අගරදගුරු පදවි පූජක තුමකුවූ ගරු ජුවාන් ඩී ලිසානෝ පියතුමන් මෙහි එවන ලදි. මන්නාරම අවට ජනතාව පියතුමන්ගේ පැමිණීමත් සමඟ කිතු දහම පිළිබඳව සිත් හැරුණු 600 කට අධික පිරිසක් කිතු දහම වැළඳගන්නට වූහ. ඔවුන් සඳහා ගිහි නායකත්වය ඉලංග ජිගන් යන අය විසින් දරණ ලද බව පැවසේ. එවකට මන්නාරම හා යාපනය රාජධානියකට අයත් විය. මන්නාරම් ජනයා කිතු දහම වැළඳගැනීමත් සමඟ ප්‍රදේශයේ ඇතිවූ නව පිබිදීම හමුවේ අන්තවාදි කණ්ඩායම් මහත් බියට පත්විය.

කෝට්ටේ රාජධානිය පෘතුගීසින් යටත් කර ගැනීමත් සමග යාපනය රාජධානියද ඔවුන් විසින් යටත් කොට ගනු ඇතැයි ඔවුහු සිතූහ. එයින් වඩාත් බියකරුවූයේ මන්නාරමේ ජනයා යාපනය රජුගේ අණ පිළිනොගෙන පෘතුගීසි පාලකයින්ගේ අණ පිළිගන්නා බවට කට කතාවන් පැතිර යාම නිසයි. මෙයින් වඩාත් කෝපයට හා බියට පත් එවකට යුව රජුවූ සංගිලි 5000 කට අධික සේනාවක් සමග මෙහි පැමිණ කිතු දහම අතහැර දමන ලෙසත් එසේ නොකරන අයට විවිධ වද හිංසාවන්ට ලක්වීමට සිදුවන බවටත් රාජ අණක් නිකුත් කරන ලදි. එහෙත් මෙහිවූ කිතුනු ජනයා තම විශ්වාසය අත් නොහැර සිටීම හේතුවෙන් සංගිලි රජුගේ අණ පරිදි ගරු ජුවාන් පියතුමා ඇතුළු කිතුනු විශ්වාසකයින් 600 කට අධික පිරිසක් වර්ෂ 1544 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ඉතා කුරිරු ලෙස වද හිංසා පමුණුවා මරණයට පත්කරන ලදි. එලෙස දිවි පිදූ කිතුනුවන් අද මන්නාරම් ප්‍රාණපරිත්‍යාගීන් ලෙස හඳුන්වති. මේ ව්‍යසනයෙදි එම ජනයා අතර සිටි කුඩා දරුවන් පවා මරා දමා ඇති බවත් ඇතැමුන් හිස්ලූ අත දිවගොස් සැඟවී දිවි බේරාගත් බවත් ඉතිහාසයේ සඳහන් වේ. මියගිය කිතුනු විශ්වාසකයින්ගේ රුධිරය විලක් ලෙස තෝට්ටවේලි ප්‍රදේශය පුරා විසිර ගියේය. සංගිලි රජතුමා මේ සියලුම සාහසික ක්‍රියාවන් තුළින් තම රාජධානිය තුළ කිතු දහම මුලුමනින්ම වැනසී යනු ඇතැයි සිතුවද ප්‍රාණපරිත්‍යාගී රුධිරයෙන් කිතු දහමේ වර්ධනයට මහඟු පිටුවහලක් විය.

පසු කාලයේ මේ ස්ථානයේ ඔවුන් සිහිවීම පිණිස ස්මාරකයක් ඉදිකර ඇත. අද ඒ ආසන්නයේම කාගෙත් අවධානයට ලක්වන පිණිස “වළලනු ලබන්නේ අගෞරවාන්විත වූවකි. උත්ථාන කරනු ලබන්නේ තේජාන්විත වූවකි. වළලනු ලබන සිරුර දුබල වූවකි. උත්ථාන කරනු ලබන්නේ ප්‍රබල වූවකි.” (1කොරෙන්ති 15:43) යනුවෙන් සඳහන් වූ දේව වාක්‍යය භාෂාවන් තුනකින් සටහන්ව ඇති පුවරුවක් සිටුවා ඇත. මේ වන විට මෙලෙස දිවිපිදූ ප්‍රාණපරිත්‍යගින් භාග්‍යවරයට ඔසවනු පිණිස කිතුනු ජනයාගේ ඉල්ලීම පරිදි මන්නාරම රදගුරුතුමන් විසින් ශුද්ධවූ සභා පාලකයන් වෙත කරුණු ගොනුකර යවා ඇත. ස්මාරකයට වම් පසින් අද දක්නට ලැබෙන දෙව්මැඳුර ගරු නේරු පියතුමාගේ මූලිකත්වයෙන් ගොඩනංවන ලද අතර එහි වරින් වර ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර ඇත. “එම්මාවුස්” ආධ්‍යාත්මික මධ්‍යස්ථානය හා තෝට්ටවේලි - ප්‍රාණපරිත්‍යාගී රාජේශ්වරි දෙව්මැඳුර භාරව ගරු ජූඩ් ක්‍රෘස් ඒඩ්රියන් පියතුමා මහත් කැපවීමෙන් කටයුතු කරයි.

චින්තක ද මැල්



# මරණින් මතු ශරීරය උත්ථාන වන බව අපගේ විශ්වාසයයි

**පසුගිය සතියේ මැද පිටුවේ පළවූ ලිපියේ ඉතිරිය...**

**ආත්මය සහ ශරීරය**

ආත්මය සහ ශරීරය උත්ථාන වීම ගැන කතා කරන විට අප සිහියට නැගෙන මූලික සිද්ධි දෙකක් ඇත. පළමුවෙන් ජේසුස් වහන්සේගේ උත්ථානයත් දෙවනුව මරියතුමිය ආත්ම ශරීර පිටින් ස්වර්ගාරෝපණය වීමත් ය. මේ සිද්ධි දෙකම දෙවියන් වහන්සේගේ ගැලවීමට පංගුකාර වන සැම කෙනාටම අවසාන දවසේ දී අත්වන භාග්‍යයේ පෙර නිමිත්තකි.

ජේසුස් වහන්සේ හැරුණුකොට මනුෂ්‍යයින් අතරින් මෙම භාග්‍යය සැම මනුෂ්‍යයකුටම ප්‍රථමයෙන් අත් විඳින්නේ මරිය තුමියයි. ආත්මය සහ ශරීරය සම්පූර්ණයෙන් ඒකාබද්ධව ඇය සැබෑ ලෙසම අන් අයට ලෝකාන්තිමයේ දී ලැබෙන වරප්‍රසාදය වේලාසනින් භුක්ති විඳින්නට "ප්‍රසාද ලද්දීය" මෙහි අදහස නම් ගැලවීම "සම්පූර්ණ වීමට" ශරීරය සහ ආත්මය යන දෙකම ඒකාබද්ධ විය යුතු බවයි. එනම් ශරීරය ස්වර්ග සම්පත්තියට අදාළ නොවන දෙයක් නොව ස්වර්ග සම්පත්තිය ලැබීමේ සම්පූර්ණ ස්වභාවය බවයි. එවිට, ස්වර්ග සම්පත්තියේ "සම්පූර්ණ" ස්වභාවය ආත්මය සහ ශරීරයේ "නොබෙදුණු" සම්බන්ධතාවයයි.

මෙම සත්‍යය තවදුරටත් මෙසේ විග්‍රහ කිරීමට උත්සාහ කරමි. දෙවියන් වහන්සේ ලෝකාරම්භයේ දී මවන මිනිසාත් පාපයෙන් පසු මිනිසාගේ ස්වභාවයත් අතර දැඩි වෙනසක් ඇත. එසේම මෙම ඓතිහාසික මිනිසාගේ ස්වභාවයත් අවසාන උත්ථානයෙන් පසු සිටින මිනිසාත් අතරත් දැඩි වෙනසක් ඇත. මෙම වෙනස මෙසේ පවතින අතර මෙම ස්වභාවයන් තුන අතර අත්‍යන්ත සම්බන්ධතාවයක් ද ඇත. ලෝකාරම්භයේ දී දෙවියන් වහන්සේ මනුෂ්‍ය වර්ග යාව තම ස්වරූපයට මැවීමත්, පාපයට වැටුනු මනුෂ්‍යයා එයින් මුදවා ගැනීමත්, උත්ථානයේ දී තම ස්වර්ග සම්පත්තිය මනුෂ්‍යයාට ලබා දීමත් අතර මූලික පදනම දෙවියන් වහන්සේ මනුෂ්‍ය වර්ගයා ද දක්වන ප්‍රේමයයි. මෙකී ප්‍රේමය අපට දක්වමින් අප ගලවා ගැනීමට දෙවියන් වහන්සේ ලබාගත්තේ මනුෂ්‍ය ශරීරයයි. එහි ස්ථිර සලකුණ වන දිව්‍ය සත්ප්‍රසාදයේ දී උන්වහන්සේ අප හට ලබා දෙන්නේ ද උන්වහන්සේගේ "ශරීරයයි". මරණය පරදා නැගී සිටියේ ද උන්වහන්සේගේ ශරීරයයි. මේ නිසා අනාගත ස්වර්ගීය ජීවිතයට "ශරීරය" වැදගත් වෙයි. මෙකී ශරීරය සංකේතාත්මක එකක් නොව සැබෑ පුරුෂ හෝ ස්ත්‍රී ශරීරයයි.

කෙසේ වෙතත් අප ඇසිය යුතු ප්‍රශ්නය වන්නේ මෙයයි. "මේ ලෝකයේදීත් ලෝකාවසානයේ ශරීර උත්ථානයේදීත් ඇති වෙනස කුමක් ද? යන්නයි. සරළව ප්‍රකාශ කළහොත් වෙනස මෙයයි. පාපයෙන් පසු ඓතිහාසික මනුෂ්‍යයාගේ ස්වභාවය ආත්මය සහ ශරීරයේ බෙදීමයි. පාපය නිසා ශරීරයට මරණය හිමිවීම නිසා ශරීරය දිර පත්වන දේ සම්බන්ධවත් ආත්මය සදාතනික දේ සම්බන්ධවත් මනුෂ්‍ය ස්වභාවය තුළ සටඨනය වෙති. මේ සටඨනය නිසා පාපය ඓතිහාසික මනුෂ්‍යයාට උරුම වෙයි.

පාපය ඇති වීමට මූලික හේතුව මේ බෙදීමයි. නමුත් යම් විටෙක ආත්මය සහ ශරීරය "ඒකාත්මික" වෙයි. මෙසේ ආත්මය විසින් දමනය කර ගැනීමක් නොව ශරීරයේ දෙවියන් වහන්සේ මූලාරම්භයේ පටන් අදහස් කරන ලද සැබෑ ස්වභාවය ඉස්මතු වීමකි. එහි සැබෑ ස්වභාවය දෙවියන් වහන්සේගේ ප්‍රේමයට සම්පූර්ණයෙන් නතුවීමයි. ශරීරයේ උත්ථානයේ දි සිදුවන්නේ මෙයයි. ශරීරය ආත්මයෙන් "වෙන්වීම" නොව ආත්මය විසින් සම්පූර්ණයෙන් වසා ගැනීම තුළ ආත්ම ශරීර වෙනස සම්පූර්ණයෙන් ම නැති වී ශරීරය ගැලවීම අත්කර ගැනීමයි සිදුවනුයේ.

මෙකී ශරීරය උත්ථාන වීම අපගේ විශ්වාසයට කෙතරම් වැදගත් දැයි මින් වැටහෙනු ඇත. ශරීරය උත්ථාන වීමක් නැතිනම් දෙවියන් වහන්සේගේ මැවිල්ල කිසි විටෙක සම්පූර්ණ නොවෙනු ඇත.

මෙවැනි විග්‍රහයක් තුළින් අපට යා හැකි දුර කුමක් ද? යා හැකි දුර අති ප්‍රබලය. කෙටියෙන් කිවහොත් දෙවියන් වහන්සේට ද ශරීරයක් ඇති බව කීම දක්වා යා හැකිය. එයට හේතුව දෙවියන් වහන්සේ "මාංශගත වීමත්" එම මාංශගත වූ ශරීරය සැබවින් උත්ථාන වීමත් නිසාය. උත්ථාන වූ ක්‍රිස්තු ශරීරය සදාතනිකය. අහස් නැගීමෙන් ශු. ත්‍රිත්වයට එම ශරීරය එකතු වීම පැහැදිලි වෙයි. අපගේ උත්ථාන වන ශරීරයෙන් ද ඒකාත්මික වනුයේ මෙම දේව ශරීරය සමඟය. කට වචනයට "දෙවියන් වහන්සේ මුහුණට මුහුණ දැකීමේ භාග්‍යය" අපි ඉල්ලා යාච්ඤා කළත් ඉන් පිළිබිඹු වන "මුහුන" යන ශාරීරික සංකල්පය ගැන අප සිතනවා අඩුය.

දෙවියන් වහන්සේට එසේ නම් "මුහුණක්" ඇත. ඒ මුහුණ දැකීම අපගේ බලාපොරොත්තුවයි. ඒ ස්වරූපය ඇත්තේ අපගේ ශරීරයටයි. අපව මවා ඇත්තේ ඒ ස්වරූපයටයි. දෙවියන් වහන්සේ මනුෂ්‍ය භාවය ලබා ගත්තේ ද එම ස්වරූපයටයි. එසේ නම් "මාංශය උත්ථාන" වීම සරළව සිතිය යුතු දෙයක් නොව, දෙවියන් වහන්සේ හා එක්වන්නට ආශාවන සැම විශ්වාසකයකුගේම අවසාන බලාපොරොත්තුවයි. අප ගැලවීමේ අවසාන ජයග්‍රහණයයි. - නිමි -

ගරු බී. ඇන්සලම් ශිරාන් පියතුමා
මත්තුමගල මීසම් සේවක

(ප්‍රධාන මූලාශ්‍රය - භාග්‍යවත් දෙවන ජුවාම් පාවුළු පාප් වහන්සේ ශරීරයේ උත්ථානය ගැන කළ දේශනා සමුච්චය)

දේව වචනයෙන් හික්මීම්
ප්‍රදීපය
## ධර්ම සංග්‍රහය

**පසුගිය සතිය හා සබැඳේ....**

මෙම හසුන කොටස් දෙකකට බෙදා ඇත. පළමුවන කොටස න්‍යායාත්මක වන අතර දෙවන කොටස ප්‍රායෝගික වේ. පළමු වන කොටස පරිච්ඡේද 17 කින් සමන්විත වන අතර එය දේව ධාර්මික ස්වරූපයක් ගනී. "ඔබගේ විශ්වාසයත් සමඟ ඔබගේ දැනුම සර්ව සම්පූර්ණ කරගැනීම" මෙම හසුනේ ප්‍රධාන පරමාර්ථය බව කතුවරයා සඳහන් කරයි.

නමුත් මෙම දැනුම සුවිශේෂිතය. එනම් පැරැණි ගිවිසුමේ අඩංගු දේව අනාවරණයේ වටිනාකම පැහැදිලිව විස්තර කිරීමට කතුවරයා බලාපොරොත්තු වේ. ඔහුට අනුව ජුදා වංශය දේව නීතිය සම්පූර්ණයෙන්ම වැරදි ලෙස වටහා ගෙන තිබේ. ඊට හේතුව ඔවුන් එය වචනාර්ථයෙන් අර්ථකථනය කිරීමයි. මෙම කාරණයට පසුව ඔහු තම මතයට අනුව අධ්‍යාත්මික අර්ථය ඉදිරිපත් කරයි.

දෙවියන් වහන්සේ පරිත්‍යාගයන් චර්මඡේදනය සහ ආහාර පාන ගැන අණ පනත් ඉතා උසස් සහ අධ්‍යාත්මික අර්ථයකින් විග්‍රහ කොට ඇත. නපුරු දේව දූතයකු විසින් රැවටීමට ලක් කරන ලද කැමැත්ත විකෘති කර ඇති අතර, දේව නීතිය තේරුම් ගෙන සහ පිළිපැද ඇත්තේ වචනාර්ථයෙනි.

### සභා පියවරු 54 කොටස

**මහාචාර්ය ඇන්ටන් මීමන විසිනි**

### බර්ණබස් තුමාගේ හසුන - 4

බාහිර වත් පිළිවෙත් වලට වඩා හදවතේ වෙනසක් දෙවියන් වහන්සේ ඉල්ලා සිටින සේක. මාංශයේ චර්මඡේදනයට වඩා හදවතේ චර්මඡේදනය උන්වහන්සේට ප්‍රසන්න වන සේක. පුරාණ ගිවිසුම තුළ අඩංගු සෑම කරුණකම සහ වත් පිළිවෙතකම ජේසුස් වහන්සේගේ මහිමය දැක ගත හැකිය.

දෙවියන් වහන්සේ අපෙන් වෙනස් වූ, පරිවර්තනය වූ හදවතක් අපේක්ෂා කරන සේක. උපවාස කිරීම නොව යහපත් ක්‍රියාවන් ඉල්ලා සිටින සේක. සමහර සතුන්ගේ මාංශය අනුභව කිරීමෙන් වැළකී සිටීම නොව, සමහර අපිරිසිදු සතුන් විසින් නිරූපනය කරන වැරදි ක්‍රියා වලින් වැළකී සිටීම අපේක්ෂා කරන සේක.

එමෙන්ම ආදි පිතෘ ආබ්‍රහම් විසින් චර්මඡේදනය කරන ලද සේවකයන් 318 දෙනා විසින් සංකේතවත් කරන්නේ කුරුසිය මත වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේය.

ඉදිරියට

## දෙසැ. 14 දිනට යෙදෙන ශු. කුරුසියේ ජුවාම් මුනි මංගල්‍යය වෙනුවෙනි

# දුක් විඳීමෙන් උපත ලද සුදුවරයාණෝ



**මෙලොව උපත ලද සෑම මිනිසෙක් ම ජාති, ආගම්, කුල භේදයෙන් තොරව දුක් විඳීමේ වේදනාබර අත්දැකීම් වලට මුහුණ පෑමේ යථාර්ථයට හිමිකම් කියයි. විවිධ දහම් විවිධාකාර දැක්ම ඔස්සේ මේ දුක් විඳීමේ අභිරහස පැහැදිලි කිරීමට උත්සාහ ගෙන තිබේ. එමෙන්ම විවිධ දර්ශනවාදීහු විවිධ ඉගැන්වීම් මඟින් මේ අභිරහස විවරණය කිරීමට ගත් උත්සාහයන් ද සුලබය.**

ක්‍රිස්තුන් වහන්සේ දුක, වේදනාව, ප්‍රේමය තුළින් ජයගත් සේක. ශු. ජුවාම් සුවිශේෂයේ උන්වහන්සේ "ලෝකයේ ඔබට දුක් ගැහැට තිබේ. එහෙත් ධෛර්යවත් වන්න; මම ලෝකය අභිබවා ජය ගතිමියි" වදාළ සේක. (ශු. ජුවාම් 16:33) කිතු තුමන්ගේ ජීවිත පූජාව ආදර්ශ කොටගත්, බොහෝ ශුද්ධවරුන්ගේ ජීවිත ලියවිලි දුක, වේදනා විඳීම පිළිබඳ ගැඹුරු සත්‍යයන් අපට හෙළි කරයි. දුක් වේදනා විඳීම තුළ ශක්තිමත් වීම, බැහැපත්වීම, සමාව දීම කැපවීම වැනි ගුණාංග ඔවුහු උකහා ගත්හ. මේ දුක, වේදනාව තුළ බිහි වූ සභා ශුද්ධවාදී අධ්‍යාත්මිකත්වය මේ දුක්විඳීමේ අභිරහස සාමාන්‍ය මිනිස් සිතිවිලි වලට වඩා වෙනත් මානයකින් ග්‍රහණය කරයි. දුක වේදනාවේ අභිරහස තුළ (1) ආත්මික පරිශුද්ධත්වය ළඟා කර ගැනීම. (2) සබැඳියාවේ ඒකත්වයේ ගුණය ළඟා කර ගැනීම හා (3) ගැලවීමේ පංගුකාරත්වයේ ගුණය ළඟා කර ගැනීමේ කර්තව්‍යයක මේ සුදුවරු යෙදුණහ. සභාවේ අති උත්කෘෂ්ඨවත් ශුද්ධවාදී සුදුවරයකු, ධර්මධරයකු වන කුරුසියේ ශු. ජුවාම් මුනිතුමාගේ දිවිය මීට කදිම උදාහරණයකි. දෙසැ. 14 වැනි දින සිය මංගල්‍ය සමරන මේ සුදුවරයාණෝ කිතු සමිඳුන්ගේ දුක්ප්‍රාප්තිය හා අපේ වේදනා එක් කිරීමෙන් ලැබෙන විපුල ඵලදායිත්වය පිළිබඳ, කිතුනු අධ්‍යාත්මිකත්වය හා ශුද්ධවාදය පිළිබඳ විශාරදයෙකි. දුක්, වේදනා විඳීම තුළින් උපන් මහා ශුද්ධවාදියෙකි.

ක්‍රි.ව. 1542 ජුනි මස 24 වෙනි දින ස්පාඤ්ඤයේ උබෙදා, අන්දලුසියාහි උපත ලද මෙතුමා ජුවන් දෙයෙපෙස් නමින් බෞතිස්ම ස්නාපනය ලැබීය. සිය පියා වංශවත් පවුලකට අයත් වූ නමුත් සිය මවගේ පාර්ශ්වය දිළිඳු වූ නිසා පාරම්පරික උරුමයනට හිමිකම ඔවුනට නොලැබිණි. කුඩා කලදීම සිදුවූ පිය වියෝවෙන් දිළිඳු අගහිඟකම් පිරි දිවියකට උරුමකම් කී කුඩා ජුවාම් දිළිඳුන් සඳහා වූ පාසලක සිප් සතර හැදෑරීය. ඔහුගේ දක්ෂතා, හැකියා හේතුවෙන් පසුකලෙක රෝහල් සේවය සඳහා තෝරාගනු ලැබීමටත්, ජේසු නිකායික පියවරුන් යටතේ වැඩිදුර අධ්‍යාපනය හැදෑරීමටත් ඔහු වාසනාවත් විය. කුඩා කල සිට වර්ධනය වූ සිය දේව කැඳවීමේ බීජය කාර්මෙල් නිකාය තුළ මල් ඵල දරන්නට පටන් ගැණුනේ 1563 පෙබරවාරි මස 24 දින ස්පාඤ්ඤයේ මෙදීනාහි එම නිකායේ තාපසාරාමයට පිවිසීමත් සමඟය. ශු. මතෙව් තුමාගේ ජුවාම් ලෙස සිය පැවිදි දිවිය ඇරඹි ඔහු පසුව සිය ශ්‍රේෂ්ඨයන්ගේ අවසරය ඇතිව තාපස නීතිය වඩා හොඳින් පිළිපැදීමේ අදිටනින් යුතුව නව මං සොයන්නට විය. සුපතල සලමන්කා ගුරු කුළයෙහි දේව ධර්මය හැදෑරූ ජුවාම් 1567 වසරේදී පූජක වරම් ලැබීය. යැදුම් දිවිය සඳහා වූ සිය නොසිඳෙන පවස සංසිඳුවා ගනු වස් සභාවේ දැඩිම තාපස නිකාය වන කාර්තූසියානු නිකායට ඇතුළුවීමේ ආශාව දිනෙන් දින ඔහු තුළ වර්ධනය වූයේ මේ අවධියේ දී ය.

එහෙත් සභා ඉතිහාසය නව මඟකට යොමුකළ තවත් අභීත චරිතයක් වන අවිලාහි ශු. තෙරේසා මුනිතුමිය මුණ ගැසීම ජුවාම්ගේ ජීවිතයේ වැදගත් සන්ධිස්ථානයක් විය.

කාර්මෙල් තාපස නිකාය ප්‍රතිව්‍යුහගත කිරීමේ මහා කර්තව්‍ය ඒ වන විටත් අරඹා සිටි ඇයට, යැදුම, තාපස දිවිය කෙරෙහි ජුවාම් තුළැති දැවෙන ආශාව මෙම කාර්යයට මහත් උපකාරයක් විය හැකි බව අවබෝධ විය. සිය ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලට සහය දෙන මෙන් ඇය ජුවාම්ගෙන් ඉල්ලීය. කාර්තූසියානු නිකායට බැඳීම වෙනුවට කාර්මෙල් නිකාය නැවත මුල් අධ්‍යාත්මික ප්‍රතිපත්තීන් කරා ගෙන ඒම, පංතියේ නීති මාලාව පූර්ණ ලෙස පිළිපැදීමට තාපසාරාම සූදානම් කිරීම හා ඒ සඳහා නව තාපසාරාම ගොඩනැංවීම යුගයේ අවශ්‍යතාව බව ඕතුමිය ඔහුට ඒත්තු ගැන්වූවාය.

මේ අනුව 1568 නොවැම්බර් 28 දින දෙවිඳුන් හා වඩා ඒකාත්මික වූ මඟක ගමන් කරනු වස් ජුවාම් තුමාණෝ කාර්මෙල් නිකායේ ප්‍රතිව්‍යුහගත කිරීම ඇරැඹූහ.

එකල සභාවට පිටතින් සිට පීඩා කරන ලූතරාන ප්‍රොතෙස්තන්තුවාදය මෙන්ම ඇතුළත සුඛෝපභෝගී දිවි ගෙවමින් තපසුන් බව කියා ගනිමින් නිකායේ ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙලට එරෙහි වූ බාධා පැමිණවූවන් ගෙන් ද අඩුවක් නොවීය.

අවාසනාවකට ජුවාම් තුමා අයත් වූ සංඝයේ ප්‍රධාන පියතුමන් ද එවැනි සැබෑ තාපස දිවියකට එරෙහි වූ නාමික තාපසයෙක් විය. ප්‍රතිව්‍යුහගත කිරීම, ප්‍රතිසංස්කෘත ව්‍යාපාරය හා ඊට එරෙහි වූවන් අතර වූ ආතතිය 1577 වන විට උච්චස්ථානයට පත් විය.

එහි ප්‍රතිඵලයක් ලෙස 1577 දෙසැම්බර් මස 3 වැනි දින එවකට 35 වියැති ජුවාම් තුමන්ව අත් අඩංගුවට ගැනුණි. ඒකපාර්ශ්වික අසාධාරණ නඩු තීන්දුවකින් පසු, සංඝයේ ප්‍රධාන පියතුමන්ගේ අණ පරිදි ඩොලෙඩොහි තාපසාරාමයක අඳුරු කුටියක ඔහුව සිර කර තබන ලදි. සිය ශ්‍රේෂ්ඨයන්ගේ අණට කීකරු නොවීම, උඩඟුව ඔහුට විරුද්ධව නැගුණු චෝදනා අතර විය. කස පහර, ශාරීරික වේදනා, වද හිංසන වලට අමතරව මානසික පීඩනයන්ට ඔහුව දැඩි ලෙස ලක් කෙරුණි. අඩි 10 ක් පමන දිග අඩි 6 ක් පළල සිරකුටිය බොහෝ විට අඳුරින් පිරුණක් විය. ඇඳුම් මාරු කිරීමට අවසර නොලද ඔහුට ආහාර ලෙස ජලය, පාන් ස්වල්පයක් හා කරවල ස්වල්පයක් පමණක් ලැබුණි. එයද ආහාරයට ගැනීමට නියම වූයේ දණින් වැටීය.

15 පිටුවට

ගරු ලින්ස්ලි දිලීප එදිරිසිංහ පියතුමා

ජන වන්දනාව

# අසීමිත දේව ප්‍රේමය වූ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ



2012.11.25 ලිපිය හා සබැඳේ

දේවත්වය පිළිගැනීම, දේවත්වයට ගරු කිරීම, පාපය පිළිගැනීම, පසුතැවිලිවීම හා නැවත හැරී ඒම ඔවුන් වහන්සේට සතුටකි.

දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනය තුළ අපට හිමිවන ප්‍රේමය, මෙම දෙව් මිනිස් සම්බන්ධතාවය වර්ධනය කරනු ලබන මහඟු වරප්‍රසාදයකි. පියාණන් වහන්සේගේ අසීමිත දේව ප්‍රේමයේ මහා යාගයාණන් වූයේ ක්‍රිස්තුන් වහන්සේය. කල්වාරිය මත පුදදෙනු ලැබූ ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය අභිරහස්මකව සුදෝ සුදු පූපයක් ලෙසට අප හදවත් වෙත වැඩම කරන සේක. ශාරීරික වශයෙන් අප මරණයට පත්විය යුතුය. එහෙත් ආත්මික වශයෙන් අප අමරණීයත්වයට පත් කරනු සඳහා මෙම දිව්‍ය භෝජනය ඔවුන් වහන්සේ අපට දානය කළ සේක. ක්‍රිස්තුන් වහන්සේගේ පැමිණීම තුළින් ලෝකයට විමුක්තිය, ගැලවීම හා මිදීම උදා වූ සේක. පියාණන් වහන්සේගේ ගැඹුරුතම ප්‍රේමය අප ලබන්නා සේ අප ද ඔවුන් වහන්සේට ප්‍රතිප්‍රේමය දැක්විය යුතුය. අප ස්වාමින් වූ ක්‍රිස්තුන් වහන්සේම ඒ බව මෙසේ පවසන සේක. “මාගේ ආඥා පිළිගෙන ඒවා පිළිපදින යම් තැනැත්තෙක් වේද මට ප්‍රේම කරන්නේ ඔහුය. යම් තැනැත්තෙක් මට ප්‍රේම කරන්නේ ද මගේ පියාණන් වහන්සේත් ඔහුට ප්‍රේම කරන සේක. මම ද ඔහුට ප්‍රේම කොට එළිදරව් වන්නෙමි.” (යොහාන් 14:21).

ජේසුන් වහන්සේ ඔහුට පිළිතුරු දෙමින් “යම් තැනැත්තෙක් මට ප්‍රේම කරන්නේ නම් හෙතෙම මාගේ ධර්මය පිළිපදින්නේය. මාගේ පියාණන් වහන්සේ ද ඔහුට ප්‍රේම කරන සේක. අපි ඔහු වෙතට පැමිණ ඔහු සමග වාසය කරන්නෙමු. මට ප්‍රේම නොකරන්නා මාගේ ධර්මය නොපිලිපදියි. ඔබ අසන ධර්මය මාගේ නොව මා එවා වදාළ පියාණන් වහන්සේගේ ධර්මයයි” (ජුවාම් 14:23-24).

පියාණන් වහන්සේගේ ප්‍රේමයට අප හිමිකරුවන් වන්නට නම් අප ක්‍රිස්තුන් වහන්සේට ද ප්‍රේම කළ යුතු බවත්, ඔවුන් වහන්සේගේ ආඥා පිළිපැදිය යුතු බවත් ඔවුන්වහන්සේම පැහැදිලි කරනු ලබන සේක. පියාණන් වහන්සේ හා පුත්‍රයාණන් වහන්සේ වෙන්කර දැක්විය නොහැකිය. ඔවුන් වහන්සේ එකම දෙවිඳුන්ද එකම ස්වාමියාණන් ද වන සේක.

දිව්‍ය සත්ප්‍රසාද වන්සේ ක්‍රිස්තුන් වහන්සේමය. ඔවුන් වහන්සේ හා එක්වන අපගේ ජීවිතයට පියාණන් වහන්සේගේ පීතෘක ආදරය ද හිමිවන සේක. කිතුනු ජීවිතය දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ගෙන් ඈත් වන්නේ නම් බැහැරව කටයුතු කරන්නේ නම් ඔහු අධ්‍යාත්මිකත්වයක් නැති ආත්මික වශයෙන් මියගිය පුද්ගලයෙක් වනු ඇත. අප ජීවත් විය යුත්තේ ලෝකය දිනාගැනීමට හෝ ලෝකය ජයග්‍රහණය කිරීම සඳහා හෝ නොව ස්වර්ගය දිනා ගැනීම සඳහා බව වටහාගත යුතුය. ලෝකය දිනන්නා ලෝකයට පමණි. එහෙත් ස්වර්ගය දිනන්නා දේව ප්‍රේමය ද දිනාගත්තෙකි.

කිතුනු අප ජීවත්විය යුත්තේ ද ස්වර්ගික උරුමය සඳහාම පමණි. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අප අතර ජීවමානව වැඩ සිටින්නේ පවුකාර වූ අපගේ මේ උතුම් අරමුණ ඉටු කරදීම සඳහාය. අප කුමන අන්දමේ පාපයක සිටියත්, කුමන ආකාරයේ පව්කරුවෙක් වුවත් ජීවමාන ස්වාමීන් වහන්සේ හමුවීමේ ඉඩකඩ, වාසනාවන්ත මොහොත අපට උරුමව ඇත. එය අප ලැබූ උතුම් වූ වරප්‍රසාදයකි. අපගේ හැරී ඒම ඔවුන් වහන්සේගේ බලාපොරොත්තුවය. ඔවුන් වහන්සේගේ ප්‍රීතියය. “ලෝකාවසානය දක්වාම අප සමඟ වාසය කරන්නට තරම් ඔවුන් වහන්සේගේ ප්‍රේමය අසීමිතය. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ නම් වූ ප්‍රේමයේ භෝජනයෙන් අප පෝෂණය වන්නට අප තුළ තිර ඇදහිල්ලක්, විශ්වාසයක් තිබිය යුතුය. එසේ නොමැති වූ විට එම දිව්‍ය භෝජනයට සහභාගි වීම නිරර්ථක සිදුවීමකි. අප එකිනෙකා කෙරෙහි ඇත්තේ දෙවිඳුන්ගෙන් ලද සැඟවුන ආදරයකි. ප්‍රේමයකි. එය වචනයෙන් ප්‍රකාශ නොවූවද ඇතැම් අවස්ථාවල දී එය මනාව ඔප්පු වේ. දෙවිඳුන්ගෙන් අප ලබන ප්‍රේමය මිනිසා වෙතද ගලා යා යුතුය. එය අප ජීවිතය තුළ අත්දැකිය හැක්කේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළිනි. ඔවුන් වහන්සේ අප වෙනුවෙන් පූපය තුළ ජීවමාන වන්නේ නම්, අප ඔවුන් වහන්සේ තුළ අන්‍යයන් වෙනුවෙන් ජීවත් විය යුතුය.

✍ රංජිත් නෝනිස්

## ගරු හෙන්රි සිල්වා පියතුමා 62

### පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යය හා ගීතාවලිය



**පසුගිය සතිය හා සබැඳේ.....**

ජෝබ් ග්‍රන්ථයේ සාහිත්‍යමය
ශෛලියය සාමාන්‍යයෙන් නම්
කෙරෙන්නේ නාට්‍යයක් දක්වා දිගෑදුණු ප්‍රඥා සාහිත්‍ය
උපමාවක් ලෙසට ය.

**ජෝබ්ගේ කතාව ගෙන එන පණිවුඩය**

ජෝබ් කතාව අවධානය යොමු කරන්නේ දුදනන් ජීවිතාන්තය දක්වා සමෘද්ධිමත් ජීවිත ගත කරන අතරතුර දැහැමියා මරණය තෙක් දුක් වේදනා විඳීම පිළිබඳව ය. එකල පැවැති විශ්වාසයට අනුව මරණින් පසු ජීවිතයක් පිළිබඳව අදහසක් නොවූ අතර, විපාකය හා දඬුවම මෙලොව ජීවිත කාලය තුළදීම ලැබිය යුතු විය. ඒ අනුව දැහැමියා නිමක් නොවන දුක් වේදනාවනට මුහුණ දෙන්නේ මන්ද යන්න පැහැදිලි කළ යුතුවිය. මේ සම්බන්ධව දෙවියන් වහන්සේ වෙනුවෙන් ඉදිරිපත් වීමේ කාර්යභාරය ජෝබ්ගේ මිතුරන් තිදෙනා තමන් මත පවරා ගනිති. මොවුහු බෙහෙවින් ඉදිරිපත් කරන්නේ පහත සඳහන් තර්ක විතර්ක සමූහයකි. එනම්;

01. අන් අයගේ දුක් වේදනා වලදී ඔවුන් සැනසූ ජෝබ් තම දුක් වේදනා වලදී මැසිවිලි නැගීම නොකළ යුතුය. (4:3-6)
02. දුක් වේදනා මඟින් දෙවියන් වහන්සේ දමිටු වූවන් පිරික්සා බලන සේක. (5:17-27)
03. අතීත පරම්පරාවන් සතුවූ ප්‍රඥාව විසින් අපට උගන්වා ඇත්තේ දෙවියන් වහන්සේ දැහැමියාට යහවිපාක දෙන බවත් දුදනනට දඬුවම් පමුණුවන බවත් ය. ඒ අනුව, දුදනන් අත් විඳින සතුට කෙටි කාලීනය (8:10-22; 20:1-29)
04. දෙවියන් වහන්සේ සාධාරණ වන සේක. දැහැමියා වෙත අසාධාරණයක් ඉටුකිරීමේ හැකියාව ඔවුන්වහන්සේ සතු නොවේ. (8:3-9)
05. ජෝබ් සහ ඔහුගේ දරුවන් දෙවියන් වහන්සේට විරුද්ධව පව්කර ඇත. එබැවින් පවතින දුක් වේදනා ඔහු වෙත පැමිණීම සාධාරණය. (15:1-35;22:1-30)
06. පවත්නා දුඃඛිත තත්ත්වය පහකර ගැනීම සඳහා ජෝබ් පසුතැවිලි වී දෙවියන් වහන්සේ හා සමඟි විය යුතුය. (22:5-30)

සිතාගත හැකි කිසියම් හෝ අපරාධයක් පිළිබඳව තම නිර්දෝෂී බව ප්‍රකාශ කරමින් ජෝබ් මෙම තර්ක සියල්ලම ප්‍රතික්ෂේප කරයි. තම නිර්දෝෂීභාවය ඔප්පු කිරීම සඳහා සාකච්ඡාවකට එළැඹෙන ලෙස හේ දෙවියන් වහන්සේට පවා ඇරියුම් කරයි. (10:1-22; 28:1-17) ජෝබ් අමතන දෙවියන් වහන්සේ (පරිච්ඡේද 38 - 41) ඔහුගෙන් විමසන්නේ මැවිල්ලේ සියලුම අභිරහස් තේරුම් ගැනීමේ හැකියාව ඔහු සතුවේ ද නැතහොත් දෙවියන් වහන්සේ සතු සියලු බලය හා ආධිපත්‍යය තමන් මත පවරාගෙන මිනිස් ලෝකය තුළ පූර්ණ සාධාරණත්වය යළි උදාකිරීමට ඔහුට හැකිවේ ද යනුවෙනි. දෙවියන් වහන්සේ විසින් ජෝබ් අමතනු ලැබීම දුක් විඳීමේ අභිරහස වෙත අවධානය යොමු කරවීමක් වෙයි. දෙවියන් වහන්සේ වෙත ජෝබ්ගේ ප්‍රතිචාරය වනුයේ, “කලින් මා ඔබ ගැන කනින් අසා තිබුණේය. එහෙත්, දැන් මාගේම දෙනෙතින් මම ඔබ දැක ගනිමි.” යන්නය (42:5). මෙම වචන මඟින් පිළිබිඹු කෙරෙනුයේ, දුක් විඳීම තුළ දෙවිඳුන් අත්දැකීමකි.

ඉදිරියට...

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

## දෙවන සතිය ඉරිදා සැඳෑ යාම යැදුම 115 වැනි ගීය



ගීතාවලිය

ශුද්ධ ලියැවිලි වසර

**(39)**

**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

පසුගිය සතිය හා සබැඳේ...

(ඇ) වගන්ති 12 - 15
දේව ආශිර්වාදය තුළින් ආයතන පරම්පරා දිවියෙහි පල දරන මින් සැකෙවින් දැක්වේ.

ලොකු කුඩා සියල්ලන්ට : පුරාණ ගිවිසුම් ජනතාව ආගමික ජන සමාජයක් විය. එහි සියලු තරාතිරම්වල අයට තම අයිතිවාසිකම් හා වගකීම් උරුම වීම ආගමික සම්ප්‍රදායේ මූලික ප්‍රතිපත්තියක් විණි (ජෙරම් 6:13, එළිදරව් 11:18).

වඩ වඩා වර්ධනය කරන සේක්වා! : ආදිපිතුරු ඉතිහාසය කතා තුළ දේවාශිර්වාදය තුළින් පරපුර වර්ධනය වීමේ යථාර්ථය කේන්ද්‍රීය ලෙස පෙන්නුම් කෙරිණි. (උත්. 12:1-5, 1:28) දේව පොරොන්දුව ඉටුවීමේ එම අත්දැකීම පසුකාලීන ජනතාවට ද දේවාශිර්වාදය තුළින් වර්ධනය වීමේ පැතුම ගොඩනගා ගැනීමට ඉවහල් විණි (යෙසායා 54:1-3, සෙකරි 10:10).

වගන්ති 16-18
සමිඳුන්ට පමණක් අයිතිය: මෙම වැකිය බහු දේවතා ඇදහිලි පසුබිමක දෙවි සමිඳුන් කෙරෙහි විශ්වාසය ප්‍රබල ලෙස පෙන්වා දෙයි. උන්වහන්සේ විශ්වයේ අධිපතියාණෝය (ගීතා 8:7-8)

මියගිය ... පාතාල ලෝකයේ අය : මෙය පුරාණ ගිවිසුමේ මතු දිවිය පිළිබඳ ආගමික චින්තය විස්තර කරයි. එහෙත් එයින් සොහොන් ගෙය ඉක්මවා යන පැතුමක් ධ්වනිත වේ. (යෙසායා 38:18-19, ගීතා 6:5, 30 - 9).

**යැදුම**

සකල විශ්වායේ ස්වාමින්ද්‍රයාණන් වන දෙවි පියාණනි, සොබා දහමේ ආශ්චර්යයක් තුළින් ද මානව ඉතිහාසයේ සිදුවීම් තුළින් ද ඔබවහන්සේගේ ප්‍රේමය හා සත්‍යය හෙළි කරන සේක් වේද? ඒ වෙනුවෙන් අපගේ තුති පැසසුම් පිළිග මැනව. අපගේ විශ්වාසයේ පැවැත්ම හා කැපවුණු සේවය තුළින් ඔබවහන්සේට සාක්ෂි දැරීමට වරම් දුන මැනව.

ඉදිරියට

# ආගමනය අර්ථවත් කරගනිමු



මේ දිනවල කරන්නට හැකි ඉතා ලස්සන අභ්‍යාසයක් මම ඔබට ඉදිරිපත් කරනු කැමැත්තෙමි. ඒ තමා දේව අම්මාගේ බෙත්ලෙහෙම් ගමනට එක්වීම. කුසයේ බිළිඳුන් ඔසවාගෙන ලහි ලහියේ එතුමිය ජුසේ තුමා සමඟ ගමන් කරනුයේ රාජ අණට කීකරු වනු සඳහාය. බලන්න එතුමියගේ මුහුණ දෙස මැසිවිල්ලක ඡායාවක්වත් දක්නට නැත. “මේ මම සමිඳුන්ගේ දාසිය වෙමි” කිය කියා ගමන් කරන සුන්දර කුමරියක් දෙව්දුවක් තමා අපට පෙනෙන්නේ. මැය යන විට, අපට වාගේ යාන වාහන, අහස් යාත්‍රා එකල තිබුනේ නැහැ. කොටළුවකුගේ පිට එතුමිය වාඩි වී යනවා. අපි ඉගෙන ගනිමුද පාඩමක් එතුමියගෙන්. නොකොඳුරා සියලු අවහිරකම් දරාගෙන අපගේ දෛනික ගමන යන්නට දේව අම්මාගෙන් ඉගෙන ගනිමු.



හරිම ශාන්තයි එතුමියගේ සුපෙම්බර මුව මඬල. ලපටි ළඳක් හරි ආසයි එතුමිය දෙස බලන්න. ඔව්. මෙන්න දැන් බෙත්ලෙහෙමට පැමිණියා. රෑ බෝවි හමාරයි. සෙමින් බිමට බැසගත් එතුමිය ගෙයක් බලාපොරොත්තු වූයේ බිළිඳා ප්‍රසූත කිරීමට පැය, වේලාව ළඟ බව ඇඟට පතට දැනුණ නිසා. අනේ අපොයි: ජුසේ තුමා සමඟ ගෙන් ගෙට ගියේ නවාතැනක් සොයාය. සැමදෙනාම එතුමියගේ තත්වය දැක අනුකම්පා කළා වෙනුවට, ලැබුණේ ප්‍රතික්ෂේප කිරීමකි. දැන් නැවතත් එතුමියගේ ආදරනීය මුහුණ දෙස නෙත් යොමා බලන්න. එතුමිය කුපිත වූයේ ද? නැත. පුදුම ඉවසීමේ කැටපතක්. කෙඳිරියට ඉඩ දුන්නේ ද නැත. අපට පාඩමක්. දැන් යුවළ ගමන් කරනුයේ ඈත දුරක පෙනුන ගව මඩුවක් දෙසටය. එහි නවා තැන් ගත් සැණින්, සුමිහිරි හඬක් නඟමින් මනුලෝ දෙව් ලෝ දෙවි තුමාණෝ කුඩා බිළිඳකු මෙන් අපේ ලොවට පිවිසියේ ය.

චීන පටස් ශබ්දයක් නම් නැත. එහෙත් අහසේ ගී රාවයක් ඇසේ. එය පැමිණියේ සුරදූතයන්ගෙනි.

අභ්‍යාසයක් :

ජේසුතුමා මෙලොවට පැමිණීමේ දී “දෙවිඳුනි ඔබේ කැමැත්ත ඉටු කිරීමට මෙන්න මම පැමිණියෙමි. ඔබ මා හට සිරුරක් දුන් සේක” යනුවෙන් පැවසූ බව සංගීතයේ සඳහන් වේ. මේ තුළ ඔබටත් මටත් රහසක් ඇත. මෙම දුබල සිරුර තමා ජේසු සමිඳුන්ට මෙන් අපට ද ලැබී ඇත්තේ. මේ සිරුර තමා ලොකුම වස්තුව ජේසු සමිඳුන්ට. එමඟින් තමා එතුමාණෝ අප නිසා දුක් වින්දේ. අපට දුක සිතෙනුයේ මෙම දුබල සිරුර තුළ බහා ඇති මනස නිසාය. හදවතේ කහට බැඳෙනුයේ මේ සිරුර තුළ ඇති හෘදයෙහිය. මේ එන නත්තලට ඔබත් මමත් ලස්සන තෑග්ගක් ජේසු සමිඳුන්ට පුද කරමු. පියවරු, මව්වරු, දූ දරුවන් අපේ පවුල්වල කොතරම් තරහ ක්‍රෝධ බැඳගෙන නත්තල සමරන්නට නොහැකි තත්ත්වයක සිටිනවාද? මේ අමනාප දුරලා කැඩුනු සිත් යළි සනසවන, බිඳුනු පවුල් නැවත සමගි කරවන ආදර සිප වැළඳ ගැනීමක් දෙන්න දැන්ම තියා සූදානම් වන්න.

දේව අම්මාගේ ආදර වදන් “මේ මම සමිඳුන්ගේ දාසිය වෙමි යන්නෙහි දෝංකාරය ද, ජේසු සමිඳුන් කී “දෙවිඳුනි, මම ඔබගේ කැමැත්ත ඉටු කිරීමට මෙන්න ආවෙමි. ඔබ මට දුබල සිරුරක් දුන් සේක.” යන ජේසුගේ හඬෙහි දෝංකාරය ද ඔබ සවන්හි වැකෙද්දී බිරිඳ ආදර සැමියා ද, සැමියා තම ආදර බිරිඳ ද, දූ දරුවන් එකිනෙකා අතරද ආදරය දල්වා ගෙන එකිනෙකාට සහෝදර ප්‍රේමයේ යදම් අලුත් කර ගනිමින් සාමය උතුරවන දැහැමි ප්‍රීතිමත් නත්තලක් සැමරීමට දැන්ම තියා සූදානම් වෙමු.

ජේසුට වැඳලා ජේසුව සිඹලා අන් අයට අපි සැම දෙමු ජේසු තෑගි ලෙසින්.

✍ ගරු ලැටීෂියා පෙරේරා පැවිදි සොයුරිය
තලවිල - ජපමාල හවුල

## ජනතා හඬ

# උත්පත්ති පොතේ සඳහන් දිව්‍ය පුත්‍රයා නම්.....

**කතුතුමනි,**

උත්පත්ති පොතේ දැක්වෙන දිව්‍ය පුත්‍රයා කවුද? යනුවෙන් 2012.11.25 දිනැති ඥානාර්ථ ප්‍රදීපය පුවත් පතේ පළවූ ලිපියෙන් පැහැදිලි විස්තරයක් ඉදිරිපත් කරන ලෙසට කළ විවෘත ඉල්ලීම ගැන කියවූ විට මෙම ලිපිය ලියන්නට සිත්විය.

උත්පත්ති 6:2 හී මෙසේ දක්වා ඇත. මිනිස් දූවරුන් සුරූපී බව දුටු දිව්‍ය පුත්‍රයෝ තම තමන් රිසිවූවන් සරණ පාවා ගත්හ. දිව්‍ය පුත්‍රයන් යන අදහස ඇතැම් බයිබල් පාඨවල මෙසේ දක්වා ඇත. තවද එක් දිනක සගලොව රාජ සභාවෙහි ඇමති මණ්ඩලය සමිඳාණන් ඉදිරියේ රැස්වූ අවස්ථාවේ...... (ජෝබ් 1:6) මෙම අර්ථයම (ජෝබ් 2:1) හිත් දක්වා ඇත. මෙහි ඇමති මණ්ඩලය යනුවෙන් දක්වා ඇත්තේ දේව දූතයන් විනා මනුෂ්‍ය පුත්‍රයන් නොවේ. ඒ අරුණෝදයේ පහන් තරු ගී ගැයීය. සියලු දෙවි පුත්තු තුති ගොස නැගුවෝය. (ජෝබ් 38:7) එම ගී ගැයුවේද දේව දූතයන්ය.

දේව දරුවන් ලෙස මනුෂ්‍ය පුත්‍රයෝද මෙසේ හඳුන්වාදී ඇත. ඊශ්‍රායෙල් ජනතාව මගේ කුලුදුල් පුත්‍ර රත්නය (නික්මයාම 4:22) ඔබ දෙවි සමිඳාණන් වහන්සේගේ දරුවෝය. මළවුන් නිසා ඔබ ශරීරය කපා නොගත යුතුය. (ද්විතීය නීති සංග්‍රහය 14:1) ඔබ දෙවිවරුයයි මම කීවෙමි. ඔබ සියල්ලෝම අති උත්තමයාණන්ගේ දරුවෝ වන්නහුය. (ගීතාවලිය 82:6) මෙම බයිබල්පාඨ එකිනෙක සැසඳීමේදී ප්‍රකාශ වන්නේ එකල සිටි මනුෂ්‍ය වර්ග යා දෙකොටසකට බෙදී සිටි අන්දමය. දේව භක්තික කොටසට අයත් වූවන් දෙවියන් වහන්සේට නමස්කාර කළ නිසා ඔව්හු දේව පුත්‍රයන් ලෙස හඳුන්වාදී ඇත. ඒ අනුව මෙම උත්පත්ති 6:2 පදයෙන් ප්‍රකාශවන්නේ දේව භක්තික මනුෂ්‍යයන් අදේව භක්තික භාර්යාවන් පාවා ගත් බවය. මෙහිදී මතෙව් 22:30 යන බයිබල් පාඨ කියවීමේදී දේව දූතයන්ට සාමාන්‍ය මනුෂ්‍යයන්මෙන් ආවාහ විවාහ පැවැත්විය නොහැකි බව ක්‍රිස්තුන් වහන්සේ ප්‍රකාශ කළබව පෙනේ. උත්පත්ති 6:3 පාඨය ඇඩි සැලකිල්ලෙන් කියවාබැලීමේදී දෙවියන් වහන්සේ දේව විනිශ්චය ප්‍රකාශ කළේ මනුෂ්‍යයන්ට පමණක් බව පැහැදිලිව පෙනේ. මෙම සිද්ධියට දේව දූතයින් සම්බන්ධ නම් දේව දූතයින්ට විරුද්ධවද විනිශ්චය ප්‍රකාශ කළ යුතුව තිබුණි. එසේ කර නැත. මෙහිදී දේවභක්තික මනුෂ්‍යයන් පාපයට පෙළඹී සිටි බැවින් ඔවුන්ට පමණක් විනිශ්චය ප්‍රකාශ කර ඇත. උත්පත්ති 6:4 සඳහන් යෝධයින් බිහිවුනේ මනුෂ්‍ය දූවරුන් හා දේවපුත්‍රයන්යැයි සඳහන් දේවදූතයින් අතර පැවැති සම්බන්ධතාවයකින් නොවන බව ඉතා පැහැදිලිය. දේව භක්තික දේවපුත්‍රයන් හා දේව අභක්තික මනුෂ්‍ය දූවරු විවාහවන කාලයේද එහි සඳහන් යෝධයින් පොළොවේ සිටි බවත් ඉන්පසු කාලවලදීත් ඔවුන් ලොව වාසය කළ බවත් නිගමනය කළ හැක. දිව්‍ය පුත්‍රයන් යනු දෙවියන් වහන්සේට නමස්කාර කළ දේව භක්තික මනුෂ්‍යයන් බව පැහැදිලිය.

**සුනිල් ජැක්සන් ප්‍රනාන්දු**
කඩලාන

## සැඟවුණු සුපුවත, මෙහෙමත් මිනිස්සු, එතැන මෙසේ සිදුවිය යළි ඕනෑ!

**කතුතුමනි,**

ඥානාර්ථ ප්‍රදීපය පුවත්පතේ එදා පළවූ 'සැඟවුණු සුපුවත', 'මෙහෙමත් මිනිස්සු', 'එතැන මෙසේ සිදුවිය' යටතේ සත්‍ය එළිදරව් කැරිණ. මේ විශේෂාංග යටතේ නොයෙකුත් ස්ථාන වල සිදු වූ අසාධාරණකම්, අකටයුතුකම් හා පැසසිය යුතු ගෞරව කළ යුතු දේ පිළිබඳව සටහන්ව තිබිණි.

දැන් එම විශේෂාංග නැත. එබැවින් කරුණාකර මේ ගැන අවධානය යොමුකොට නැවත වරක් එම විශේෂාංග ඇරැඹීමට අවශ්‍ය පියවර ගන්නේ නම් අද සමාජයේ සිදුවෙන්නාවූ යහපත හා අයහපත පිළිබඳව කෙටි සටහනක් මගින් අන් සැමට දැන ගැනීමට මහත් පිටුවහලක් වනු නිසැකය.

**ඇම්. ඩබ්. අනුර ශාන්ත පීරිස්**
හලාවත

## ප්‍රදීපය විශාල කළ යුතු නොවේ

**කතුතුමනි,**

"ඥානාර්ථ ප්‍රදීපය ප්‍රමාණයෙන් විශාල වුවහොත් මැනවි" යනුවෙන් පසුගිය සතියේ පළවූ ලිපියට අදහසක් ලිවීමට සිතුවෙමි. 'ඥානාර්ථ ප්‍රදීපය' අපට නම් කුඩාවට නොපෙනේ.

එහි ඇතුළත් සියලුම දැ සතිය පුරා අපට මහා විශ්ව කෝෂයකි. තවද මෙම පුවත් පත වට ප්‍රමාණයෙන් විශාල කොට මුද්‍රණය වුවහොත් මිලේ වෙනසක් ද අනිවාර්යයෙන් සිදුවේ. එවිට සති හතරම පුවත්පත මිලට ගන්නා අයට යම් අපහසුතාවයක් විඳින්නට සිදුවෙයි. එනිසා මෙලෙස මේ මිලට ඥානාර්ථ ප්‍රදීපය ලැබේවා යනු අපගේ පැතුමයි.

**ග්‍රේටා පෙරේරා**
වැලිකන්න

## මීසම් පිළිබඳව වැඩි අවධානයක් යොමු කරමු

**කතුතුමනි,**

අතලොස්සක් මීසම්වල ජනතාව මීසම් සේවක පියතුමා සමග යම් යම් ගැටලු මතුකර ගැනීමට උත්සාහ කරති. පියතුමාත් මනුෂ්‍යයකු වූවත් එතුමා නිසි තෝරාගැනීමක් මත සභාව තුළ අධ්‍යාපනයක් ලබා දේව කැඳවීමක් මත බිහි වූ මනුෂ්‍යයෙක් බව අප අමතක කළ යුතු නැත. මෙවැනි ගැටලු ප්‍රශ්න ඇතිවීමට මූලික හේතුව මීසම් භාර පියතුමාට පෙර සේවය කළ පියතුමා සමග හෝ වෙනත් මීසමක පියතුමන් සමග සංසදනය කිරීමට මීසම් වාසීන්ගෙන් අතලොස්සක් ක්‍රියා කිරීම නිසාය. දෙදෙනකු කිසිවිටක එක සමාන අයකු නොවේ. එය දේව සැලැස්මයි.

කලින් සිටි පියතුමා කළ දේම නව පියතුමා කරන්නේ නම් එය අර්ථවත් නැත. දෙවියන් වහන්සේගේ කාර්ය විවිධ පුද්ගලයින් ලවා ඉටුකර ගන්නා නිසා එක් එක් පියතුමන්ලාගෙන්ද උන්වහන්සේ විවිධ කාර්යන් ඉටුකර ගන්නා බව අප දැන ගත යුතුය. මේ සියලු ගැටලු වලට තවත් පැත්තකින් හේතුව අප පියතුමන්ලාව මෙහෙයවීමට උත්සාහ කිරීමයි. එය වැරදි කාරණයකි. ඇතිවෙන ගැටලු ප්‍රශ්න පියතුමා පුද්ගලිකව හමුවී කථා කර විසඳා ගැනීම තුළින් බොහෝ ගැටලු මතු නොවේ.

අද බොහෝ දෙනා පුරුදුව ඇත්තේ දේවස්ථානයට ගොස් ගෙදර යෑමටය. දේව මෙහෙයට සහභාගිවී ගෙදර යාමටය. එය අප කළ යුතු දෙයකි. මා එයට වරදක් නොකියමි. එය මා අගේ කරමි. අපගෙන් දේවස්ථානයට විය යුතු යුතුකම් ගැන සිතා බලන්නේ නම් ඊට වඩා යමක් අපගෙන් විය යුතුව ඇත. අද දේවස්ථාන පිරිසිදු කිරීම, දේවස්ථාන භූමි පිරිසිදු කිරීම කරන්නේ කීයෙන් කී දෙනාද? එසේ කරන අයට උදව් කරන්නේ කීයෙන් කී දෙනාද? ඒ අයව අගේ කරන්නේ කීයෙන් කී දෙනාද?

දෛනිකව අතුගා පිරිසිදු කළ යුතු දේවස්ථාන භූමි රාශියක් ඇත. ඒවා ඉටුකර ගැනීමට කුලී කාරයින් සිටින දේවස්ථාන ඕනෑතරම් ඇත. ඒවා පියතුමන්ලාට අයත් කාර්යයන් සේ සලකා අහක බලා ඉන්නා අයත් සිටිති. වැරදි සොයන අයට වැරදිම පෙනේ. එය හොඳ දෙයක් නොවේ. නමුත් අපි අපි ම අපේ අඩුපාඩු තේරුම් ගෙන කටයුතු කරන්නේ නම් තව තවත් අර්ථවත් තත්ත්වයක් අපගේ මීසම්වල ගොඩනැගෙනු ඇත.

**සුමිත් මාර්ක් ද සිල්වා** - කඩලාන

## නත්තල අරුත් ගන්වන්න

**කතුතුමනි,**

ස්වාභාවික විපත් - ආර්ථික අර්බුද - කල කෝලාහල - යුද්ධ මේ සියල්ල හිස ඔසවා ජනතාව පීඩාවට පත්ව සිටියත් උඳුවප් මාසය ළඟා වත්ම සොබා දහම කියාපාන චමත්කාරය හමුවේ ළඟා වන නත්තල පිළිගන්නට ජනතාව පෙළ ගැසෙන්නේ සියලුම කම්කටොලු බාධක අභිබවා නැඟී සිටිමින්ය. නත්තල වසර 2012 පැරණි වුවද නත්තලේ මිහිරියාව කිසිදිනක අවතක්සේරු නොවී නැවුම් භාවයම රැගෙන වසරින් වසර උදා වෙන්නේ කිතු සමිඳාණන් ලොවට ගෙනා සාමයේ පණිවුඩයද රැගෙනය.

නත්තලේ සැබෑ අරුත වත්මන් සමාජය තුළ හැල්ලුවට ලක්ව ඇත්තේ නත්තල වානිජ කරණයට හසුව නත්තලේ මිහිරි බව මුදලට වෙන්දේසි කරන්නට සැදී පැහැදී සිටින ව්‍යාපාරිකයන් පෙරටු කොට ගෙනය. සැබෑ නත්තලක් ප්‍රතිෂ්ඨාපනය කරන්නට කිතුනු සැමට මේ වකවානුව තුළ පැවරෙන වගකීම අති මහත්ය. ජේසු බිළිඳු එදා ගවහලේ උපත ලබා සමාජයට කියාපෑ බැහැපත් බව - නිහතමානි කම - සාමය සතුට සමාජය තුළ මාංශගත කරන්නට අප සැමට බලවත් වගකීමක් ඇත. සියල්ල මුදලේ වටිනාකමට යටවන යුගයක නත්තල කා බී ප්‍රීති වන්නට පමණක් අප යොදා ගන්නේ නම් අප අතින් සිදුවනුයේ බලවත් වරදකි. ඇති හැකි අය නැති බැරි අයට යමක් දෙන්නට සුහදත්වය ගොඩ නගන්නට



අධ්‍යාත්මිකත්වයෙන් පිරිපුන් වන්නට මේ වකවානුව යොදා ගැනීම කළ යුතුමය.

දේව මාතාවන්ගේ බැහැපත්කම, කීකරුකම ජුසේ මුනිඳුන්ගේ කැපවීම, ආදරය, රැකවරණය ශුද්ධවූ පවුලේ ආදර්ශය නත්තල් කථා තුළින් අද සමාජයට ගත හැකි ඉහළම පාඩමකි. කඩා හැලෙන පවුල් ජීවිත අයාලයේ යන දූ දරුවන්, ගබ්සාව මගින් දරුවන් ප්‍රතික්ෂේප කරන අයවලුන් හට නැවත සිතන්නට, පවුල් ජීවිත සවිමත් කොට ගන්නට මේ නත්තල් සමය උපයෝගි කර ගැනීම වටී.

අද සමාජය වැටී ඇති ආධ්‍යාත්මික හා සදාචාරාත්මක ප්‍රපාතය දෙස බැලීමේ දී අපට හැඟෙන්නේ අපගේ කිතුනු බවින් මෙන්ම අනිකුත් ආගමික පසුබිමකින්ද සමාජයට එතරම් ප්‍රබල බලපෑමක් ලැබී නැති බවකි. අපේ නත්තල වසරක් පාසා අප මහා ඉහළින් සමරා ඇති වුවද ඉන් ලැබෙන ජීවය හරය සමාජය තුළ මාංශගතවී නැත. තවමත් අප ප්‍රමාද නැත. භෞතික සම්පතට වඩා ආධ්‍යාත්මික සම්පත වටිනා බව තේරුම් ගෙන අප වඩාත් එය පෝෂණය කරන්නට අප සැම එකාවන්ව පෙරමුණ ගත යුතුය. කාබී ප්‍රීතිවන නත්තලකට වඩා මිනිස් ජීවිත පිරිපුන් කරවන නත්තලක් අප සැමරිය යුතුය. බෙදා ගැනීම නත්තලේ ප්‍රධානම කර්යය බවට පත් විය යුතුය. මේ නිසාම ගරු මර්සලින් ජයකොඩි පියතුමන් පැවසුවේ දුගියා බත් කන දා මගේ නත්තල බවය. ඒ වදන අද සමාජය තුළ රෝපණය කරමින් දුගියා සනසන්නට කිතුනු අපි උත්සුක වෙමු.

**සිසිල් පෙරේරා**
කෙරවලපිටිය

## බොරැල්ල මහකනත්තේ සිට තරුණ තරුණියන්ට පණිවුඩයක්

**කතුතුමනි**

මීට දශක කිහිපයකට පෙර ඉරුදින දිව්‍ය පූජාවේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කිරීම අවසානවීමට ආසන්නව අන්නවිරාල නොහොත් මුහුප්පු රාල විසින් 'පෙර නම් කිම'ක් සිදුවිය. එනම් විවාහ අපේක්ෂිත යුවලගේ විස්තර ප්‍රකාශයට පත් කරමින් 'මේ පිළිබඳව යම් ලේ නෑකමක් හෝ විවාහවීමට යම් බාධාවක් ඇති බව යමෙක් දනී නම් ඒ බව අප මීසමේ පූජා ප්‍රසාදින් වහන්සේට ගෞරවයෙන් දන්වන මෙන් සමස්තයින්ට මෙයින් නියෝග වන්නේය' යනුයි. පසු කලක මෙම පෙර නම් ප්‍රකාශයට පත් කිරීම දේවස්ථානයේ දැන්වීම් පුවරුවට සීමා වුවද අද එය දක්නට නැත.



කතෝලික විවාහයේදී කතෝලික සභාව ලේ නෑයන් අතර සිදුවන විවාහ අනුමත නොකළද සමාජයේ එය සිදුවන බව දක්නට ලැබේ. ඥාති සහෝදර සහෝදරියන් අතර ඇති සම්බන්ධතා විවිධාකාර අර්ථ දක්වමින් ජන මාධ්‍ය මගින් විකාශය කෙරේ. ඇතැම් විටක එය විවාහයකින් නිමා කෙරේ. එය නාට්‍යයකට හෝ කථාවකට සීමා වුවද ඉන් ඉක්බිතිව එහි ප්‍රතිඵල විකාශනය නොවේ. වර්තමාන විවාහ, ප්‍රේම සම්බන්ධතා මත ගොඩනැගෙන ඒවා වල සම්භාවිතාව වැඩි වී ඇතත්, නව යොවුන්වියේ සිට ඒවාට නිසි උපදෙස් ලැබී නොමැති බවට බොරැල්ල මහ කනත්තෙන්ද සාක්ෂි සොයා ගත හැක. කොළඹ නගරයේ වූ මාතෘ හා ළමා රෝහල්වල සිට ගබ්සා වූ කලල කොටස් සහ මළ දරු උපත් භූමදානය සඳහා බොරැල්ල මහ කනත්ත තෝරා ගැනේ. එයට ගොදුරු වූ නූපන් බිළිඳුන්ගේ දෙමාපිය විස්තර සොයා බැලීමේදී 'පෙරනම්' කීමේ 'ලේ නෑකම්' වගන්ති සිහිපත් වේ.

**එන්. ජයන්ත පෙරේරා**
මහජන සෞඛ්‍ය පරීක්ෂක
බොරැල්ල සුසාන භූමිය



# ැම්බර් 18 වෙනිදා

## කතෝලික කොමිසමේ සභාපති

## පාණන්ගේ පණිවුඩය

සංක්‍රමණිකයන්ගේ අවශ්‍යතා සොයා බැලීමට විශේෂිත වූ ශුද්ධාසනීය කොමිසමක් ක්‍රියාත්මක වේ. සෑම රටකම මේ සඳහා සවිමත් ව්‍යුහයන් ගොඩනගා ඇති අතර, ශ්‍රී ලංකාවේ කතෝලික සංක්‍රමණිකයන්ගේ කොමිසම විසින් ඔවුන්ගේ ආත්මික හා සමාජයීය අවශ්‍යතාවයන් පිළිබඳව අවධානය යොමු කිරීමට කටයුතු කරනු ලබයි. කතෝලික ජාතික සංක්‍රමණිකයන්ගේ කොමිසම, විදේශ රදගුරු මඬුලු කොමිසම් සහා සමඟ ඒකාබද්ධ වෙමින්, සංක්‍රමණිකයන්ගේ දූත සේවා සහ ආධ්‍යාත්මික අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ක්‍රියා කරනු ලැබේ. මෙම සම්බන්ධතාවයන් සහ සහයෝගිතාවය නිසා අද වන විට මැද පෙරදිග සමහර රටවලට පවා සංක්‍රමණිකයන්ගේ දූත සේවා, ආධ්‍යාත්මික අවශ්‍යතාවන් සහ විවිධ සේවාවන් සඳහා පූජාප්‍රසාදින් වහන්සේලා හා පැවිදි සොයුරු සොයුරියන් පිටත්කර යවනු ලැබ ඇත.

සංක්‍රමණය වීමට මූලික හේතුවක් වන්නේ දිළිඳුකමයි. සමහර අවස්ථාවලදී දිළිඳු නොවූවත් වඩාත් හොඳ ජීවන තත්ත්වයක් පතා විදේශ ගතවන්නෝ ද වෙති. සංක්‍රමණය හේතුකොට ගෙන විවිධ කාලීන සමාජයීය අවශ්‍යතාවයන් පැන නැගී ඇත. එවැනි අවස්ථාවලදී කතෝලික සභාව සංක්‍රමණිකයන්ව ශක්තිමත් කිරීමට හා දිරිදීමට නිරන්තරයෙන්ම කැපවී සිටිති. එසේම කතෝලික සංක්‍රමණිකයන් කුමන රටක සිටියත් ඔවුන්ගේ විශ්වාසය ජීවත් කරවීමත් ආගමික වතාවන්ට සහභාගි වීමට අවස්ථාවක් සලසාදීමත් සභාවේ දූත මෙහෙය හා කාර්යභාරය ලෙස සලකනු ලැබේ.

ශ්‍රී ලංකාවට බොහෝ සෙයින් අදාළ වන මෙම ගෝලීය සංසිද්ධිය ගැන අප දැනුවත්වීම ඉතා කාලෝචිතය. සංක්‍රමණිකයන්ගේ විශ්ව දිනය සමරන අපට නාසරෙත්හි ශුද්ධවූ පවුල එදා අත්දුටු අසරණභාවය අවිනිශ්චිතභාවය සහ අනතුරුදායක ස්වභාවය අපගේ ආවර්ජනයට ඉතා යෝග්‍යවූ සාධකයන් වේ. ඔවුන්ගේ සංක්‍රමණයේ දී ඔවුන්ට අති බිහිසුනු අභියෝග යන්ට මුහුණ දීමට සිදුවූවත් ශුද්ධවූ පවුල එම ගමන ඇදහිල්ලේ වන්දනා ගමනක් කර ගත්හ. අනතුරුදායක හා අසරණභාවය හමුවේ සැමවිට දෙව්පියාණන්ගේ මැදහත්කම සෙවූහ. මව්බිමෙන් ඈත් වී සේවය කරන අපගේ ශ්‍රමික සහෝදර සහෝදරියන්ට ද නොයෙක් අභියෝගවලට මුහුණ දෙන අවස්ථා වලදී ශුද්ධවූ පවුලේ ආදර්ශය මහඟු වූ දිරියක් වනු නොඅනුමානයි.

සංක්‍රමණිකයන්ගේ විශ්ව දිනය සමරන මෙදින විවිධ අමාරුකම් හා දුෂ්කරතා තුළින් ගමන් කරන්නාවූ ශ්‍රමිකයන් සිහිපත් කර ඔවුන්ගේ පීඩාකාරී අවස්ථාවලදී ඔවුන් එකිනෙකා සමඟ එකමුතු වෙමින් එකිනෙකා වචනයෙන්, ක්‍රියාවෙන් ශක්තිමත් කිරීමට ධෛර්ය ලැබෙන ලෙස යාච්ඤා කරමු.

## ට සුරපුරයක් නම් නොවේ



හා මූලික අරමුණු අමතක කර දමා විවිධාකාර අනියම් සබඳතා ගොඩනගා ගැනීම කණගාටුවට කාරණයකි. ඇතැම් විට වෙනත් ජාතීන්ගේ ඇසුර පතා යන අයද වෙති. මෙවැනි අයගේ පවුල් ජීවිත කඩා ඉහිරී, දරුවන් අසරණ තත්ත්වයට ඇද වැටෙන බව අමුතුවෙන් කිව යුතු නොවේ.

කරුණු කාරණා කෙසේ වූවත් මෙරට තුළ වෙසෙන බහුතර ශ්‍රී ලාංකිකයන් ඉතා සංයමයකින් යුතුව ආගමික අංශයට නැඹුරුව සිය ජීවිකාව ගෙන යයි. මෙරටට සේවය කරන බොහෝ දෙනෙක් තනිකම පාළුව අසරණ බව අත්දකින විට කිසිදු ආගම් භේදයකින් තොරව දේවස්ථානය කරා ඇදී යාම තුළ දෙවිඳුන් කෙරෙහි ගැඹුරු විශ්වාසයක් ගොඩනඟා ගනිති. එසේම කතෝලිකයන් වෙනුවෙන් ශ්‍රී ලාංකික සදාසරණ සොයුරියන් වන අපිදු ඔවුන්ව ආධ්‍යාත්මිකව පෝෂණය කර දෙවිඳුන් තුළ ශක්තිමත්ව විශ්වාසයේ ජීවිත ගමනක් යන්නට යොමු කරන්නෙමු. එසේම ඔවුන්ගේ අතිශය පෞද්ගලික ප්‍රශ්න වුවද අප සමඟ සාකච්ඡා කොට විසඳා ගැනීමට ද අප අවස්ථාව ලබා දී ඇති අතර, ඔවුන්ගේ අයිතීන් පිළිබඳව ද දැනුවත් කෙරේ. තවද දේව සංරක්ෂණය කෙරෙහි විශ්වාසය තබා ආදරයෙන් එකිනෙකා හා බැඳෙමින් සාධාරණත්වයේ හා සාමයෙන් පිරි නව ලොවක්, ගොඩනැඟීමේ අභිලාෂයෙන් සේවය කරමු.

සෑම වසරකටම දෙවරක් එනම් නත්තලට හා පාස්කුවට ශ්‍රී ලාංකික පියතුමකු ලවා දිව්‍ය පූජා පැවැත්වීම මොවුන් ලද තවත් ජයග්‍රහණයකි. බෞද්ධ සැදැහැවතුන් සඳහා ශ්‍රී ලංකාරාමයෙන් වන සේවාවද සුළුපටු නොවේ. ඔවුන්ද දීප ව්‍යාප්තව සැදැහැවතුන්ගේ සිත සුව පිණිස විවිධ වැඩසටහන් දියත් කොට ශ්‍රී ලාංකිකයන්ව යහමඟට ගැනීමට ප්‍රශංසනීය සේවාවක් ඉටු කරයි.

සයිප්‍රස් දේශයේ ස්ථාන කිහිපයක මරිය මව්තුමිය දර්ශනය ඇති බව මෙරට ජනයාගේ විශ්වාසයයි. එබැවින් මෙරට ජනයා මෙන්ම ශ්‍රී ලාංකිකයන් තුළ ද මරිය මව් කෙරෙහි දැඩි භක්තියක් ඇත. එතුමියගේ ආශිර්වාදය නොඅඩුව මෙරටට හිමි වී ඇතිවාට කිසිම සැකයක් නැත.

කවුරු කෙසේ කීවත් මෙරට, සංක්‍රමණිකයන්ට සුරපුරයක් නම් නොවේ. කෙසේ වෙතත්, මැද පෙරදිග රටවලට වඩා නම් යහපත් රටක් බව නොකියාම බැරිය. මෙරටේ සංක්‍රමණිකයන් තිබෙන වද හිංසා ඉතාමත් අඩුය. එසේ වීමට හේතුව ක්‍රිස්තියානි රටක් බැවින් යයි මගේ හැඟීමයි.

අවසාන වශයෙන් සඳහන් කළ යුතුව ඇත්තේ 20000 අධික ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් මෙරට තුළ සේවය කරමින් ඔවුන්ගේ දහඩිය කඳුළු මතින් අප රටට ගලා යන විදේශ විනිමය විශාලය. එමඟින් ඔවුන් රටේ ජාතික ආදායමට ඉහළින්ම දායක වේ. නමුත් එම පිරිස් වෙනුවෙන් ලැබෙන සුභ සාධනය ගැන නම් අවංකවම සතුටු විය නොහැකි බව කණගාටුවෙන් වුවත් සඳහන් කිරීමට සිදුවේ. කාලයක් තිස්සේ සේවක ස්වාමි දෙපාර්ශ්වයම දායක වෙමින් සමාජ රක්ෂණයට කපා ගන්නා මුදල්, නැවත මව්බිමට යන විට කිසිවකුට ලැබෙන්නේ නැත. ඒ සඳහා අපේ රජයට මැදිහත් වීමේ කාලය පැමිණ ඇත.

ශ්‍රී ලංකාවේ සංක්‍රමණික දිනය සමරන, අද වැනි දිනක, ඔවුන්ගේ ඒ විශිෂ්ට කැපකිරීම හා සේවය සියලුම ශ්‍රී ලාංකිකයන් විසින් අගය කළ යුතුව ඇත. ඔවුන්ට අපගේ ප්‍රණාමය ලබාදිය යුතුමය.

**සයිප්‍රසයේ සිට**
**ගරු ජෙනට් සිල්වා පැවිදි සොයුරිය**
සදාසරණ පැවිදි නිකාය

# නත්තලේ අරුත

## නිවැරදිව වටහා ගනිමු



ලෝකාරම්භයේ බිඳ වැටුනු දෙව් මිනිස් සබැඳියාව යළිදු එක්කරලන්නට අභිමත වූ දෙවිඳාණෝ සමාජීය, ආර්ථික, සංස්කෘතික ගතිකයන්ට යටත්ව කාලය සම්පූර්ණ වූ කල මෙලොව තුළ මිනිස් වෙසින් මාංශගත වූ සේක. එසේ වූයේ ශු. ලියවිල්ල තුළ සඳහන් පරිදි ආදිපිය, වීර නායක, දිවැසි හා රජවරුන්ගේ යුගයන් නිමා කරමිනි. මෙහිදී මනුෂ්‍ය ස්වභාවයට හා මනුෂ්‍ය ගතිකයන්ට ගරු කළ දෙවිඳාණෝ මෙහිදී තමන් මැවූ මනුෂ්‍යයා නමැති තම විශිෂ්ටතම මැවිල්ල වෙත අනුගත වීම අසහාය සිදුවීමකි. මෙමගින් ලෝකයේ කිසිම තැනක කවර අන්දමේ නොඇසූ, නොමැති, නොවන්නාවූ සිදුවීමක් ලෙස කිතුනුවන් වන අපට ආඩම්බර විය හැකිය. මන්ද අප අදහන්නේ අපගේ දුකට වේදනාවට, කඳුළට හා සුසුමට සංවේදී අපත් අතර වැඩ විසූ දෙවිඳාණන් කෙනෙකු බැවිනි.

මෙහිදී නත්තල් මංගල්‍යය හෙවත් ක්‍රිස්තෝත්පත්ති මංගල්‍යය මුළු විශ්වයේම ආනන්දජනක, උත්සවශ්‍රීයෙන් හා හැඟුම්බර කාලපරිච්ඡේදයක් ලෙස සැලකිය යුතුය. මෙහිදී මෙම මංගල්‍යයේ ප්‍රධානම තේමාව වනුයේ "දුබල මනුෂ්‍යත්වය හා ප්‍රබල දේවත්වය අතර හමුවීමයි." දේවපුත්‍ර ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මෙලොවට ගෙනා ඒ සාමය, සමෘද්ධිය, සෞභාග්‍යය, ප්‍රේමයේ හා දයාවේ සුබවදන තුළින් සමස්ත විශ්වය කරා ම රැගෙන යාම නත්තලේ මූලික අරමුණ වන්නේ ය. දෙවිඳාණෝ මෙලොව මාංශගත වූයේ යම් සේද ඔවුන් වහන්සේ ද කිතුනුවන් වන අපට ආරාධනා කරන්නේ එකී මාංශගත වීමේ අරුත තුළින් ලෝකයා වෙත සුබ වදන හා සමෘද්ධිය රැගෙන යාමටය. ස්වකීය දේවත්වයේ උත්තරීතර බව පසෙකලා මනුෂ්‍යත්වය වැළඳගත් දෙවිඳාණෝ ස්වකීය සමාජීය, සංස්කෘතික ගතිකයන්ට අනුගත වූ සේක. එම නිසාම සැබෑ ජුදෙව්වකු ලෙස ඔවුන් වහන්සේ ස්වකීය සංස්කෘතික, ආගමික හා දේශපාලනික සන්දර්භයන්ට අනුකූලව හා අනුගතව ක්‍රියා කළ ස්ක.

මෙහිදී මෙකී ආදර්ශය හා සන්දර්භය තුළ නත්තලේ නිවැරදි ආකල්පය වටහා ගන්නට උත්සුක විය යුත්තෙමු.

බහු ආගමික, බහු සංස්කෘතික වටපිටාවක් තුළ ජීවත්වන කතෝලික පිරිසක් ලෙස මෙහිදී නත්තලේ යථාර්ථය, නත්තලේ නිවැරදි ආකල්පය හා යථාරූපිත්වය මැනවින් පැහැදිලි කර දිය යුතු වන්නේ ය. නත්තල් මංගල්‍යය කියූ සැනින් ම බොහෝ දෙනෙකුගේ අවධානයට යොමු වී ඇත්තේ නත්තල් ගස්, නත්තල් සීයා, සැරසිලි, ගවලෙන්, ඇඳුම් පැළඳුම්, විලාසිතා යන එකී මෙකී නොකී දේවල් පමණකි. බොහෝ දෙනෙකු කිතුනුවන් වන අපට නගන අභූත චෝදනා ද පවතින්නේ ය. කිතුනුවන් වන අප කා, බී, ජොලි කරන පිරිසක් ලෙස ඇතැම්හු අර්ථ දක්වති. නූතන සමාජය තුළ බොහෝ දෙනා නත්තල පවත්වන්නේ වානිජකරණ සන්දර්භයක් තුළය. ඇතැමෙක් මෙම සමය තුළ කිතුනුවන් වන අප නගන චෝදනා අතර නත්තල් යනු විවේකයේ හා වින්දනයේ සමයකි. ගෘහස්ත සමාජය තුළ වියදම් සහිත කාල පරාසයකි. වෙනදාට වඩා කෑම බීම, ඇඳුම් පැළඳුම්, මත්පැන් තෑගි බෝග යනාදියෙන් සමන්විත වූවකි. තරුණ දිවිය තුළ නත්තලේ විලාසිතා, වින්දනයේ, ප්‍රීති සම්භාෂණයේ කාල පරිච්ඡේදයකි. .... යනාදි ලෙස නඟන, කියන, ලියන චෝදනා හමුවේ නත්තල් පිළිබඳ නිවැරදි දැක්ම උකහා පෙන්වා දීමට අපට කාලය ලැබී ඇත.

නත්තල් මංගල්‍යය සමරන කිතුනුවන් වන අප හට ප්‍රථමයෙන් ම වටහා ගත යුතු කරුණ වන්නේ එය ආනන්දයේ හා සංතෘෂ්ටියේ කාල සීමාවක් මිස, වේදනාවෙන් මිරිකුණු, විඳවිය යුතු කාලපරිච්ඡේදයක් නොවේ. අපේ ම ඇතැම් අය චාම්, සරල, සුදු ඇඳුම් යනාදිය ලෙස නත්තල ද විටෙක අවමංගල්‍යයක් කරලන්නට උත්සුක වෙති. නමුත් මෙහිදී වඩාත් වැදගත් වනුයේ කිතුනු පැවැත්ම හා ආකල්පයන්ට අනුකූල ඇඳුම් පැළඳුම් පැළඳීමය. එනමුදු නත්තල් මංගල්‍යයට දැඩි නීති රීති යොදා "මෙලෙස අඳින්න, මෙලෙස කරන්නැයි" උපදෙස් දීම හා වර්ගීකරණයක් කිරීම අවශ්‍ය වන්නේ නැත. තවද නත්තල යනු අවමංගල්‍යයක් නොවේ. කිතුනුවන් ලෙස අප බොහෝ දෙනකු මේ සඳහා ආගමන සමයේ දී පවුල්, මීසම් ලෙස ඒකරාශී වී නත්තල් මිහිරියාව, ආධ්‍යාත්මිකව හා බාහිරව එකමුතුකමින් හා සහයෝග යෙන් ද, සියලු දෙනා හා අතර පවතින වාද භේද දුරලා ක්‍රියා කරති, නැගම් යති, එකට ආහාර ගනිති. මෙය වැරැද්දක් නොවේ. එයින් නත්තල් මංගල්‍යයට කිසිදු හානියක් හෝ පළුදුවක් හෝ සිදු නොවේ. තවද මස් මාංශ අනුභවය පිළිබඳව චෝදනා නඟන ඇතැම් අන්තවාදිහු නත්තලේ කෑම බීම, මස් මාංශ අනුභව කිරීම් පිළිබඳව නඟන චෝදනාවලට කිවයුතු ප්‍රධානතම දේ වන්නේ මෙහිදී මස් මාංශ, මත්පැන් බොහෝ දුරට පරිහරණය හා අනුභව කරන්නේ කිතුනුවන් පමනද? යන්නය.

දෙසැ. 25 දාට පෙර මස් මාංශ හා මත්පැන් එක්රැස් කරගන්නේ කිතුනුවන් පමණක් ද? යන්න බොහෝ දෙනෙකු හොඳින් දන්නා කරුණකි. තවද නාගරිකව බාල් නැටීම, නගර ශාලා වල ද මේ දිනවල බොහෝ දුරට සහභාගි වන්නේ කිතුනුවන් නොවේ. මන්ද කිතුනුවෝ බොහොමයක් නත්තල් මංගල්‍යය නිමිත්තෙන් තමන්ගේ පවුල් තුළින් එකමුතුව හා සහයෝගිව සිටීම දැකිය හැකිය. මන්ද කිතුනු අනන්‍යතාවය තුළ අපේ බොහෝ දෙනකු නත්තල් සමයේ දී නත්තලේ මිහිරියාව විඳිමින් ආධ්‍යාත්මිකව හා බාහිරව සූදානම් වෙමින් සාමකාමීව වෙසෙන බව අවධාරණයෙන් යුතුව ප්‍රකාශ කළ හැකිය.

ඒ එසේ නම් විවිධ අභූත චෝදනා හමුවේ ප්‍රකාශ කළ යුතු ප්‍රධානතම ප්‍රකාශනය වන්නේ නත්තල් මංගල්‍යය අවමංගල්‍යයක්, දේශපාලනික හා සංස්කෘතික යථාර්ථයකට වඩා එය ආනන්දනීය වූද, පූජනීය ද ප්‍රේමයේ සුබවදන ලෝකයාට ප්‍රකාශ කිරීමට අප කැඳවන හා ඒ තුළින් අපගේ අනන්‍යතාවය සමස්ත සමාජයට ප්‍රකාශ විය යුතු හා ප්‍රකාශ වන ප්‍රධානතම මංගල්‍යය වේ. මන්ද කිතුනුවන් ලෙස අපගේ ප්‍රධානතම මංගල්‍යය වන පාස්කු මංගල්‍යයට වඩා බාහිර වටපිටාවට අපගේ අනන්‍යතාවය ප්‍රකාශ වන ප්‍රධානතම මංගල්‍යය නත්තලය. පවුලක් ලෙස එකට එක්ව දේවස්ථානයට යෑම, දිව්‍ය පූජාවට සහභාගි වීම, තෑගි බෝග හුවමාරු කිරීම, සුබ පැතීම, නත්තල් ගස්, ගවලෙන් සෑදීම, නැගම් යෑම, ආහාර ගැනීම යනාදි දේ වැරැදි ලෙස නම් කළ නොහැකිය. එම නිසා නත්තලට චාම්, සුදු යනාදි වර්ගීකරණ අවශ්‍ය නැත. තවද නත්තල් මංගල්‍යය හමුවේ කිතුනුවෝ කා, බී, ජොලි කරන පිරිසක් නොවන බව අවධාරණයෙන් යුතුවම ප්‍රකාශ කළ යුතුය.

තවද නත්තල් භූමිකාවට හා යථාර්ථයට හා එහි සම්ප්‍රදායන්ට පළුදු කරන සෑම අවස්ථාවක ම අප සැම පෙරමුණ ගත යුතු අතර, ක්‍රිස්තෝත්පත්ති මංගල්‍යයේ සැබෑ යථාර්ථය වටහා ගෙන නූතන සමාජීය, සංස්කෘතික සන්දර්භයන්ට මාංශගත වෙමින් මනුෂ්‍යත්වය නංවාලමින් මානව විමුක්ති මඟ ගොඩනැඟීමට අප සැම වැයවෙමු, ඇප වෙමු, පෙරමුණ ගනිමු.

**අසේල දසනායක**

# අධිෂ්ඨාන

**වෙන්නප්පුවේ සරෝජිනි ප්‍රනාන්දු**

**මා ඉදිකඩුල්ලෙන්** පනිනවිට රට අඹ ගස යට හිඳගෙන ඉරුණු **දැලක් මසමින් සිටි අම්මාගේ මුහුන සිනාවෙන් පිරෙන්නට විය.**

"සුද්දියෙ අක්කා ආවා" දැල පැත්තකට දැමූ අම්මා කොන්ද අල්ලාගෙන නැගිට මා පසු පස විත්, එළිපත්ත මත හිඳගත්තාය. දොඩමළුවූ අම්මා මුලින්ම කියන්නට වූයේ, මා හිටියායින් භාගයක් වී ඇති බවය. අනතුරුව ඇය බෝඩිංවල බත් හොඳ නැති බව සහ එහි අයිතිකරුවන්ට තදින් අවලාද නගන්නට වූවාය. ඉන්පසු ඇය තාත්තාට නිතරම වැළඳෙන පපුව අමාරුව ගැන කියන්නටද ගෙදර අග හිඟ කම් ගැන කියන්නටද අමතක නොකළාය.

මුව දොවා ගත් මම ලෑලි පුටුවට බර වූයෙමි. මට එක්වරම පාලිතව සිහිවිය. අම්මාට මුහුණ දීමට අපහසුවක් දැනුනද මම අම්මා දෙස බැලුවෙමි.

අම්මාගේ දුබල දෑස යොමුවී තිබුණේ ගෙපලට මඳක් ඔබ්බෙන් දමා තුබූ අත්තිවාරම වෙතය. තණපඳුරු, නිදිකුම්බා සහ වල්පැලෑටි වලින් ගහනව තුබූ ඒ මතට හිරුරැස් වැටී තිබිණ. අම්මාගේ පැතුම මනරම් නිවසකි. මගේ සරසවි වරම නිසා ඇන හිටි නිවස යළි කවදා ඉදිවේදෝයි අම්මා සිතනු නොඅනුමානය.

රා කට්ටක් බී ගෙපැල දෙසට එන තාත්තාගේ වෙහෙසකර මුහුණ දියවී හිනාවක් මෝදුවිය. මේස් බැනියම ගලවා ඇඳ විට්ටමට දැමූ තාත්තා ලණු ඇඳ මත දිගාවී සෙනෙහසින් මදෙස බැලීය.

"මොනවද අඩු පාඩු නෝනෝ"

"මුකුත් නැහැ තාත්තෙ"

මට ඇවසි දෑ අපමණය. ඒවා කියා මා පියන්ගේ හිත්වලට නැති කරදර දෙන්නට මට හිත් දෙන්නේ නැත. හැකිතාක් පිරිමසා ගන්නට නිති වෙර දරන්නේ ඒ නිසාය.

"ඔය විස්ස විජ්ජාලෙ මහා නරක තැනක් කියල ගබන් මණ්ඩිය තොටුපළේදි කතාවට ගිහින් කිව්ව. බාන කඩාගත්ත හරක් වගේලු. මට වෙලාවකට හිතෙනව නෝනා ඕකට නොගිහින් මේ පැත්තෙ මොකක් හරි කළානම් හොඳයි කියල."

මම මඳ සිනා මුවින් යුතුව වැට අද්දර තුබූ අරලිය ගසට නෙත් යොමු කළෙමි. සුදු අරලිය මල් නෙතට රසඳුනක් වැනිය. මාළු බදින සුවඳ නාසයට ගෙන එන්නේ අන් සුවඳකි. ජයදේව ඇන්ටීගේ නිවසේ එළවළු කෑමට මාළු කෑමට ඇත්තේ නොතිත් ආශාවකි.

කුස්සි කෑල්ලට වී අපි සතුටින් දිවා ආහාර ගතිමු. තාත්තා ලණු ඇඳේ දිගාවූයේ සිරිත් පරිදිය.



ටිකකින් උන්දැගෙ ගෙරවිල්ල ඇසෙන්නට විය.

හීන් නින්දක් ගිය මට ඇහැරුණේ නංගීගේ අතේ උණුසුමටය.

"තේ ටිකක් බොමු අක්කෙ. අක්කට නම් සැප නින්දකුත් ගියා."

"ඔව් හුඟ කාලෙකට පස්සෙ. එහෙදි නම් මේ වෙලාවටත් පාඩම් කරනව."

"අම්මගෙ බත් කාලා බත් මතට වෙන්ඩ ඇති නින්ද ගියෙ."

"ඇයි නංගි තේ එකට සීනි දැම්මෙ. අපරාදෙ සීනි පුපුරු ටිකක් දුන්නනම් මාත් යසට බොනවානේ."

"එහෙම පුලුවනැයි තව ටික දවසකින් දොස්තර නෝනා කෙනෙක්නේ."

නංගීගේ සුරතල් වදන්වලින් සතුටක් දැනෙනවා වෙනුවට මසිතට කාන්දුවන්නේ උහුලා ගත නොහැකි බරකි. මා අලස ලෙස ගෑටුවේ කුස්සිකෑල්ලටය.

අම්මා බත උයන්නේ කඩිමුඩියේය. නංගි තෙල් දමන අඟුලු කරවල ඇතිලියේ සුවඳ නැති බඩ ගින්න ඇති කරයි. කැකුළු හාලෙ බතුයි, පොල් සම්බලයි මීට එකතුවුණාම බත් මරන්න පුළුවන්. එහෙත් මේ තරම් වෙහෙසෙන තාත්තාට, නිවසේ අනිත් අයට මීට වඩා සමබල ආහාර වේලක් සකසා ගත හැකිනම් කෙතරම් අගේද? ඊට ද හරස් වී ඇත්තේ මගේ වැඩි දුර සිප් සතර නොවේද?

සුදු වැලි මිදුළ මතට මළ හිරු රැස් වැටී ඇත. කෑදලි කරා යන කාකයන්ගේ 'කාකුවෙන්' වටා පිටාවම පිරී ඇති සේය. තාත්තා බත් කන විට නංගි බුලත් මඩිස්සලය පිළියෙල කළේ පුරුද්දටය.

අමුඩය හැඳගෙන කලව දක්වා වෑහෙන අමුරෙදි බැනියම හැඳ ගත් තාත්තා ගෝනි පඩංගුව ගෙන මිදුලට බහින්නට පෙර සුරුවම ළඟට ගොස් ඔරසන් කියා කුරුසිය නළලේ ඇඳ ගත්තේ සුපුරුදු පරිදිය. වතුර බෝතලය ගත් අම්මා තාත්තා සමග ඉදිකඩුල්ලෙන් පනිද්දි මටද ඔවුන් සමඟ යාමට සිත් විය. කුඩා කල සිට සරසවි යන තෙක් මා අනන්ත වර වැල්ලට ගොස් ඇත. පාර දෙපස අලුත් ගෙවල් කිහිපයක් ඉදිවී ඇත.

තාත්තා දැල එකතුකර තෙප්පම මත ගෝනියද, වතුර බෝතලයද සමග සීරුවට තැබුවේය. තෙප්පම දියත් කරන්නට අත තිබ්බේ, අල්ලපු තෙප්පමේ මයිකල් අයියාය. තාත්තා අප දෙස බලා සිටියේ අඬාවැටෙන දෑසිනි. ජීවය සිඳී යන තාත්තාගේ දුබල දෑසේ ශේෂවූ ජීව බිඳුව දැක මම තැති ගතිමි.

තාත්තගේ වෙහෙසකර මුහුණ මහද සසල කරයි. අපේ කුස ගින්න, ඉගෙනුම සහ ජීවත්වීම උදෙසා තාත්තා මහා මුද සමග සටන් වදින මොහොත එළඹිණ. තාත්තා රැගත් තෙප්පම දිය දෙබෑකරමින් ඈතට ඇදී යන්නට විය. සෝකයෙන් හඬනා හදවතින් යුතුව බලාසිටිද්දි තාත්තා තිතක්වී නොපෙනී යන්නට විය.

"නෝනෝ යන්, පෙරේදා දවලුත් පපුව අමාරුව හැදිල මන් සිද්ධාර්තෙ ඇතිල්ලුව. යන්න එබා කිව්වට අහන එකක් යැයි" දුබල හඬින් කියන්නට වූ අම්මා මට ඉස්සර වූවාය.

සඳ නැඟ එමින් තිබිණි. සුපුරුදු පරිදි අම්මා ඔරසන් කියන්නට සූදානම් වූවාය. නංගිද මල්ලිද අම්මා අසලින් වාඩිවූහ. කුප්පි ලාම්පු එළියෙන් ඔවුන්ගේ මුහුණ පෙනෙයි. ඒවායේ ඇත්තේ පිසිහම් ගතියකි. ඔවුන්ගේ සිරුරු කේඩෑරිය. කුඩා කල අප විඳි කටුක අත්දැකීම් පණ ගසා මහද හෙම්බත් කරවයි. දැල් එලන්නට මුදු ගිය අසරණ තාත්තාගේ දුක්බර දෑස් මට සිහිවෙයි.

ජයගත යුත්තේ මා පමණක් නොව අප සියල්ලන්ම යන අදිටන මසිත තුළ මහත් ප්‍රබෝධයක් ඇති කරයි.

---

## ෆිලීෂන් අබයකෝන්ගේ සුබස 224

### දුටු නටබුන්

**මියුරු තෙපලෙන් රදනා යයි සැලලිහිණියා පසසන සන්දේශකරු ලිය පිය තෙපල ලෙස පිය තෙපුල් යුතු කතුන් ආදි සුබ නිමිති නැකතටත් ඉහළ බව නොබියව පවසයි. තෙපුල, තෙපල, තෙප්ල ඉපැරණි** හෙළ වදන්ය. වා හා විසි මාතෘභාෂාවලින් බිඳුණු ඒවාය. ලපනය (සල්ලාප) භාෂණය (සම්භාෂණ) කථනය වදනය වචනය යනු හරි තේරුම කීම වූවත් දැන් වචනාර්ථයට වැඩි හුරුවක් දැක්වේ. භාෂාව/ බසත් වචනයයි. බහින් බස් බලන්න. වදන යනු මුහුණටත් යෙදේ. වාචික. වාචාල, වාච්‍ය, වාචකය එකම ක්‍රියා මූලයක ප්‍රතිඵලය. බේදවාචකය අනුවේදනීය කථාවකි. සිද්ධියක් නම් නෙවේ. දමිළ වාසගම (කියවීම) වාචකයයි.

වාක්පටුත්වය වචනින් දක්වන දක්ෂතාවයි. වාග්ලාවන්‍යය වචනවල සුන්දරත්වයයි වාග්දේවි සරස්වතියයි. වාගීශ්වර සුරගුරුයි. වාක්දාතය කිතුනු වහරේ පොරොන්දුවයි. දූන් වචනය යන තේරුමැති වාක්දත්තය හරි වදන බව පෙනේ. ඉංග්‍රීසියෙන්ද වචනයක් දීම (බහදීම) පොරොන්දුවකි.

සුපුල් (හොඳට පිපුණු) උපුල්, තෙපුල් පිරිමි දරුවැනට ලස්සණ නමය. ඉන් තෙපුල් කිතුනුවකුට නම් පදගත අර්ථයට වඩා ගැඹුරට, ඈතට ගිය වදනකි. දෙවියෝ ම වචනය (ජුවාම් 1:1) වන බැවිනි. මේ වචනය දේවධර්මාචාර්යයනට අවබෝධ වුණත් සාමාන්‍ය අපට වටහාදීම ලේසිපාසු නැත. සර්වදයාබර දෙවිපියාණන්ගේ මිනිසා ගැලවීමේ සිතිවිල්ල ගැළවුම්කාර පුත්‍රයා ව වචනය විය. කෙතරම් හිතේ ආදරය තිබුණත් අදාරයි යන තෙපුල තෙපලෙන තුරු නොදැනෙන සේය. අපි දිනකට තෙවරක් "වචනය තෙමද මාංස වුණේය. අප සමග ද වාසය කළේය යයි" (ජුවාම් 1:14) උච්චාරණය කරමු.

ජුවාම් සුවිශේෂයේ මුලදීම දකින වචනය, වාක්‍යය, ධර්මය ලෙස පෙරළි පෙරළී යයි. නව පරිවර්තනයේ මාංසගත වීමට යෙදුණු මිනිසත් (මිනිස් +අත්) මනුෂ්‍යාත්ම යනුයි. ධර්මයාණෝ මිනිසත්බව රැගෙන යයි කියවන බුදුනුවන් කුමක් සිතාවිද? දුකකිනි මිනිසත්බව ලබාගන්නේ (ලෝවැඩ සඟරාව) මහ+අත්= මහත් (මහාත්ම) පරම+අත්=පරමත් (පරමාත්ම) සුදු+අත්=සුදත් (ශුද්ධාත්ම) විමසන්න.

මේ අතින් දිව්‍ය පූජාවේ විශ්වාස ලක්ෂණය හරියට හරිය. ශුද්ධාත්මයාණන්ගේ ආනුභාවයෙන් කන්‍යා මරියාවන්ගෙන් මිනිස් බව ගෙන උන්වහන්සේ මනුෂ්‍යයා වූසේක.

---

# ප්‍රදීපය කෙටි කතා

# සඳුට හොරෙන්

**කටුවපිටියේ ලිලී ඇග්නස් සියඹලාපිටිය**

**චාර්ලිස් පාන්දරින්ම බුලත් කොරටුවට ගියේ එදින කොරටුවේ බුලත් ටිකද කඩා ගැනීමට තිබුණ නිසාවෙනි. බිරිය එන්සිනාද අත් උදව්වට යන්නේ ටිකක් පමාවී ඔහුට** තේ ජෝගුවක්ද රැගෙනය.

නිවස පේන මානයේම එළවලු කොරටුවද තිබෙන නිසා කුස්සියෙ වැඩපල ඉවරවු ගමන්ම එළවලු කොරටුවට යාම ඇගෙන් දිනපතාම ඉටුවන කාර්යකි. කොරටුවේ වැඩටික ඉවර කරනා චාර්ලිස් ඉරමුදුන්වේගෙන එන විට දිය කඩිත්තෙන් ඇඟපත දොවාගෙන පිලේ ඇති හාන්සි පුටුවේ දිගාවී ගිමන් නිවා ගන්නේ බුලත් විටකින්ද සප්පායම් වීමෙනි. දහවල් බත උයා අවසන් වනවිටම පොඩි උන් දෙන්නාද පාසල් ගොස් නිවසට දුව එන්නේ සුළු සුළු අමනාපකම් මහ ලොකුටව කනේ තබන්නටය. එන්සිනාද ඔවුන් දෙදෙනාම අස්වසාලමින්

"පව්නේ පුතේ...... නංගී තාම පුංචිනෙ. නංගිව ආදරයෙන් බලාගන්න එපා" යැයි පවසන්නේ දෙදෙනාගෙම හිස අතගාමිනි. දෙදෙනාගෙම අමනාපකම් මොහොතකින් අමතකව කුස්සියට දිව එන ඔවුන් දෙදෙනාටම බත්ටික බෙදා කට කට කවන්නේ තමාගේ කුසින් වැදූ දරුවන් මෙන් ආදරයෙනි.

අනේ..... වාසනාවන්ත දරු පැටව් දෙන්නා නංගියි මස්සිනයි දෙන්නා හදිසි අනතුරකින් මියගියේ පුංචි කිරි කැටියො දෙන්නා එන්සිනාට බාර කරලා. ඔවුන්ට දරු පැටව් නැති හින්දා ඔහුට විතරක් නෙමෙයි එන්සිනාටත් ඉහේ මලක් පිපුනා වාගේ වුනා දරුවෝ බාරගත් දවස. මවකටත් වඩා දැඩි ආදරයෙන් අවුරුද්දක් වයසැති සඳුනි දියණියත් අවුරුදු පහක් වයසැති තරංග පුතුටත් අදටත් මවක හා පියෙකුගේ ආදරය දක්වන්නේ ඔවුන් දෙදෙනාය.

සඳුනි දෙක වසරේත් තරංග පහ වසරේත් එකම විදුහලේ ඉගෙනුම ලබන අතර අම්මේ කියා කටපුරා එන්සිනා අමතන්නත් ලොකු අප්පච්චි කියා කටපුරා චාර්ලිස් අමතන්නටත් එසේ අමතන බොහෝ වේලාවට ඔවුන්ගේ දෑසට කඳුළු උනන වාර අනන්තය. එදිනද චාර්ලිස්ගේ කල්පනා දැහැන බොහෝ ඈතට දිවගොස් තිබුනද යළිත් කල්පනා දැහැනින් මිදුනේ ඔවුන්ගේ සුරතල් කතාබහට වශිවූ නිසාවෙන්, කුස්සිය පැත්තට යාමට අදිටන් කළ මොහොතේය. ඇත්තෙන්ම ඔවුන්ගේ සුරතල් ලොවේ තනිවන ඔවුනට දවස ගෙවී යන්නේද දවස උදා වන්නේද දරු සෙනෙහසිනි.

කොරටුවෙන් කඩාගන්නා බුලත් එළවලු පොළට ගෙන යාම සඳහා සකස් කරමින් වෙහෙසෙන විට පොළෙන් ගෙන ඒමට ඉදිරිපත් කරන ඔවුන්ගේ ඉල්ලීම් නිමක් නැත. කෙසේ හෝ ඒ හැමදේම ගෙනත් දෙන බවට පොරොන්දු වී නිදා ගැනීමට සලස්වා පසුදා උදේ රැයින්ම පොළට යන්නේ ඔවුන් අවදිවීමට පෙරය.

පොළට ගොස් ඔවුන්ගේ ඉල්ලීම් ඉටුකර දීමට වෙහෙසෙන ලොකු අප්පච්චි ගෙදරට අවැසි දේවල් ගන්නේ ඉන් පසුය. රටක් රාජ්‍යයක් ලත් පරිදි ඔවුන් ගෙනා තෑගි වලට අතට පත්වූ රස කැවිලිවලට සොම්නසින් පසුවන දරුවන්ගේ සිනහා හඬින් මුළු නිවසම දෝංකාර වෙද්දී වැඩියෙන්ම එදාට සතුටුවන්නේ දරුවන්ට වඩා ඔවුන් දෙදෙනාය.

කාලය ගෙවී ගියේ කාටත් හොරාය. දැන් සඳුනි හා තරංග තරුණ දූ පුතුන්ය. ඔවුන් ද දැන් ගෙදර කටයුතු ගැන මනා අවබෝධයකින් පිරී ඇත. ලොකු අප්පච්චි හා මෑණියන්ට පෙර පරිදි නිවසෙ මෙන්ම එදිනෙදා වගකීම් හරියාකාර ඉටුකර ගැනීමට ද අපහසු බව ඔවුන්ට ද අවබෝධ වී ඇත. එය වඩාත්ම තහවුරු වූයේ දිනක් ලොකු අප්පච්චි එළවලු බුලත් විකිණීම සඳහා තැරැව්කරුවකු නිවසට ගෙන්වා ගත් දවසේමය. එය ගොඩක් පාඩු ලැබීමක් බව දැන දැනත් එසේ කළේ අප්පච්චිට එසේ කරනු හැර එයිට වඩා දෙයක් කිරීමට අපොහොසත් වූ නිසාවෙනි.

උසස් පෙළත් සමත්ව ඇති නිසා තරංග රැකියා කිහිපයකට ඉල්ලුම්පත් යැව්වේ ගෙදරට කිසිදු දැනුම් දීමකින් තොරවය. ලොකු අප්පච්චිද බලවත් සේ ඔත්පල වූයේ මේ අතරය. එන්සිනාගෙද දවස ගත වුනෙ ලොකු අප්පච්චිගෙ බෙහෙත් සාත්තු සප්පායම් වලටය. මේ අතර සඳුනිගෙ රැකවරණය හා ඉගෙනීම එන්සිනාටද බර වැඩිය. සඳුනිව නේවාසිකව කන්‍යාරාමයක නතර කිරීමට සූදානම් කළේද ඇගේ කැමැත්ත අකමැත්ත නොතකාය. එන්සිනා හා ලොකු අප්පච්චි කරුණු කාරණා කියා දීමෙන් පසු ඇය බැලීමට නිතරම කන්‍යාරාමයට එන බවට පොරොන්දු වී සඳුනි ව කන්‍යාරාමයක නතර කිරීමට ටිකක් හෝ කැමති කරවා ගැනීමට හැකිවූයේ ඔවුන් තිදෙනාටම තිබූ දැඩි ආදරය නිසාමය.

හොඳට ඉගෙන ගෙන ලොකු නෝනා කෙනෙක් වෙනදාට මේ අයියා ඔයාට ලස්සන තෑග්ගක් දෙනවා. හොඳ නංගී වගේ ඔයා උසස් පෙළ පාස් වෙන්නම ඕනෑ හොඳද නංගී.

ඔයා හොඳම ලකුණු අරගෙන මගෙ සුදු නංගී එයා ඉහළින් පාස්වෙන්න ඕනෑ..... නැගණිය කන්‍යාරාමයේ නතරකර දැඩි ආයාසයෙන් සඳුනිගෙ හිස සිපගත් තරංග එදා ආපසු නිවසට පිය මැන්නේ දෑසේ කඳුළු පුරවා තිබියදීය.

ලොකු අප්පච්චිගෙන් සමුගෙන අලුත් රැකියාව බාර ගැනීමට තරංග පසුදා අගනුවරට පැමිණියේ උදේ රැයිනි. සාර්ථකව රැකියා ස්ථානයේ පත්වීමේ කටයුතු සාර්ථකව ඉටුකර ගැනීමට පහසුවූවාසේම නවාතැනක්ද ඔහුට ලබාගැනීමට හැකිවූයේ කිසිදා බලාපොරොත්තු නොවුනු ලෙසිනි. එම රැකියා ආයතනයේ තමා ලබාගත් තනතුරටත් වඩා උසස් තනතුරක් දරන සෙනුරගේ නිවසේය.

එය ඔහු ලද මහඟු අස්වැසිල්ලක් විය. මවත් පියත් හැර එම විශාල නිවසේ සිටි එකම දරුවා ඔහු විය. ඔවුන් හැම දෙනාම ඔහුට නිවසේ කෙනෙකු මෙන් හිතවත් විය. කාලය ගෙවී යද්දී එම ආයතනයේම උසස් වීමක් ලැබ තරංගට එතෙර යාමට සිදු වූයේ මේ අතරය.

එය වසර දෙකකට සීමා විය. තරංග මුලදී එම ගමන යාමට වැඩි කැමැත්තක් නොදැක්වූයේ තම නැගණිය හා පවුලේ එකම පිළිසරණය ඔහු නිසා බැවින් ඔවුනට එම රැකවරණය අහෝසි වේය යන සිතුවිල්ලෙනි.

නමුත් සෙනුර ඉදිරිපත් වෙමින් තරංග අතින් ඉටුවිය යුතු වගකීම් තම කරට ගෙන ඒ හැමදේම ඉටුකරන බවට පොරොන්දු වෙමින් තරංගගේ ගමනට හැමදේ සූදානම් කර දුන්නේ ඉටු දෙවියකු මෙනි. තරංග එම සති අනත්යේ ආයතනයේ වගකීම් බාරගෙන එතෙර බලා පිටත් වූයේ සෙනුර ගැන දැඩි විශ්වාසය තබමිනි.

එතැන් පටන් සෙනුර තරංගගේ අප්පච්චිලට පමණක් නොව කන්‍යාරාමයට යැවිය යුතු නේවාසික ගාස්තු පවා නියමිත වේලාවට ලැබීමට සැලැස්සුවේ ඉතාම වගකීමෙනි. ඒ සඳහා සෙනුරගෙ නමට ස්තූති කර තරංග විසින් එවන ලද ලිපි ආයතනයටම කිහිප වරක් ලැබී තිබුන අතර තරංගට යැවීමට කන්‍යාරාමයෙන් එවන ලිපියද හරියාකාරව ලැබිය යුතු අයට ලැබීමට සැලැස්සුවේද තරංගට මේ මොහොතේ තමා හැර උදව්විය යුතු කිසිවකු නොසිටි බැවිනි. ඒ ගැන තරංග මහත්සේ ස්තූති කර දිග ලිපියක්ද එවා තිබිණ.

දිනක් කන්‍යාරාමයෙන් තරංගට තැපැල් කිරීමට එවා තිබූ ලිපිය අතර ගැහැනු ළමුන් දෙදෙනෙකුගේ පාසල් නිල ඇඳුමින් ගත් සේයාරුවක්ද විය. එම සේයාරුවට යටින් 'සඳුනි' 'අචලා' යනුවෙන් සඳහන් කර තිබිණ. ඒ සමගම තිබූ කෙටි ලිපියෙහි මෙලෙස සඳහන් කර තිබිණ.

දයාබර සුදු අයියේ,

ඔයාගෙ නංගි සඳුනි උසස් පෙළ ඉහළින්ම සමත්. පොරොන්දුව මතකනේ. ලස්සන තෑග්ගක් ඕනේ හොඳද, පිංතූරයේ මා ළඟම ඉන්නේ මගෙ හොඳම මිතුරිය අචලා. විස්තර පසුවට.

මේ දයාබර සුදු නංගී සඳුනි

යනුවෙන් ලිපිය කෙටියෙන් අවසන් කර තිබිණ. ලිපිය හා සේයාරුව දෑතේ තබාගෙන මොහොතක් කල්පනාවේ අතරමං වූ සෙනුර ඉතාම වගකීමෙන් එම ලිපිය හා සේයාරුව සුරක්ෂිතව තැබුයේ කිසිවක් මේ මොහොතේ සිතා ගැනීමට අපොහොසත් වූ විලසිනි.

තරංග එන සතියේ එතෙර ගොස් පැමිණේවි. ඒ නිසා ලිපිය තැපැල් කළත් වැඩක් නැහැ. තෑග්ගක් මෙහෙන් ගන්න බැරියැයි හිත හදාගත් සෙනුර තමාගේ සුපුරුදු රාජකාරියේ යෙදුනෙ තරංගගේ පැමිණීම ඔහු පිළිගැනීමට තිබූ ආශාව තමාද අභිබවා හිතට දැනී තිබූ නිසාය.

තරංග එතෙර ගොස් තවත් ලස්සනවී පැමිණ ඇත. ඔහු පිළිගැනීමට ආයතනයෙන් පිටත් වූයේ සෙනුරය. සෙනුර කන්‍යාරාමයෙන් ලද ලිපිය හා සේයාරුව තරංග වෙත පත් කළේද ඔහු එම මොහොතේම කන්‍යාරාමයට යාමට සූදානම් වූයේද මේ අතරය. හිස් අතින්ම කන්‍යාරාමයට යාමට සූදානම් වූ තරංග දුටු සෙනුරට ඇතිවූයේ දැඩි කුතුහලයකි. ඒ නිසා ඔහු කටහඬ අවදි කරමින් 'තෑග්ග' ගැන මතක් කළද ඔහු සිටියේ නිහඬවමය. බැරිම තැන ඔහුත් නිහඬ වූයේ කළ හැකි අන් කිසිවක් නැති නිසාවෙනි.

ඉතාම රමණීය දැකුම් කළු භූමියක ඉදිවී තිබූ කන්‍යාරාමයේ ප්‍රධාන පාලක තුමිය ඔවුන් පිළිගත්තේ සිනහා මුසු මුහුණින්ය.

ආගිය තොරතුරු කතාබහ කිරීමෙන් අනතුරුව සඳුනි ගැන මහත් ආඩම්බරයකින් කතා කළේ ඇය විදුහලට අත්පත් කරදුන් ගෞරවය වෙනුවෙනි.

පාලක මව්තුමිය එතනින් ඉවත්ව ගිය නොබෝ වේලාවකින් ලස්සන තරුණියක් පැමිණ තරංගව වැළඳ ගත්තේ ඒ සඳුනි යැයි සෙනුරට පසක් කරමිනි. සොහොයුරු පෙමින් වෙලී සිටි අයියණ්ඩියටත් නැගණියටත් කතාකර ගැනීමට ඉඩ හැර සෙනුර එතැනින් ඉවත්වීමට සැරසුනේ ඒ අතරය. ඒ සමඟම ඉදිරියට ආ තරංග සෙනුරගෙ අතගෙන සඳුනිගේ දෑතට එක් කළේ මෙන්න මං නංගිට දෙනව කිව්ව පොරොන්දු වුන තෑග්ග.... යයි කියමිනි.

දෑස් දල්වා බලාසිටි සඳුනි ගේ දෑත සෙනුර සිප ගත්තේ අපමණ සෙනෙහසිනි.

අචලා හා පාලක මව්තුමිය ඈත සිට 'සඳුට හොරෙන්' ලැබුන තෑග්ග දෙස බලා සිටියේ සිනහා පිරි මුවිනි.

---

## 184

ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි සොයුරු



| | |
|---|---|
| ඈත්තු යන මගේ වටුවොත් | යනවාලු |
| අතපය වගේ යෑ කකුලක් | කිව්වාලු |
| බල්ලො කොළඹ ගියා වගේ නේද | කිව්වලු |
| මුහුදට ගව් ගාණක් දුර අමුඩෙ | ගැහුවලු |
| පොල් මද ගැන කතා නැතුව කොහු කෙන්දයි | ලෙඩේ |
| නොකෙරෙන දීගය වෙන කොට හෙවනැල්ලත් | ඇදේ |
| කලකදි වහ වෙච්ච දේම කලකදි රහ | වුනේ |
| ඒ ඉස්සර ගොයියා දැන් කාගෙත් ඉටු | දෙයියෝ |

**ගායනය : (හබ) රණ (අ) මුතු හෙට්ටි**

බැසිල් ෆොන්සේකා විසිනි

# චීනයේ ගබ්සා විරෝධි මාමා වෙනුවට බෑනා හිරේට

වර්ෂ 2012 අප්‍රේල් මාසයේ, උපතින් අන්ධ නීතිඥ චෙන් ගුආන් චෙන් චීන බළධාරීන් විසින් නිවාස සිර අඩස්සියට ගනු ලැබුවේ ඔහු විසින් ගබ්සාවට හා උපත් පාලනයට එරෙහිව ගෙනගිය දැවැන්ත විරෝධතාවය හේතුකොට ගෙනය. මාස හතරකට පසුව, බළධාරීන්ගේ ඇස් වසා ඔහු නිවාස හිර අඩස්සියෙන් හොර රහසේ පැන ගත්තේය.

කෝපයට පත් බළධාරිහු ඔහු සෙවිල්ලේ නිරත වූයේ මෙම සිද්ධිය කෙසේ හෝ ජාත්‍යන්තර මාධ්‍යයන් විසින් ලොවට හෙළි කිරීමේ හේතුව නිසාය. එලෙසින් චෙන් ගුආන් චෙන් ජීවත් වූ නිවසට ආරක්ෂක භටයින් කඩා වැදුනේ ඔහු රහසිගතව සැඟවී ඇත්දැයි සොයා බැලීමටය. ඔවුන්ට එහිදී දක්නට ලැබුණේ අන්ධ නීතිඥ චෙන් ගුආන් චෙන් ගේ බෑනා වන 33 හැවිරිදි චෙන් කෙගුයි පමණයි. නිවස තුළදීම ඔහු ශාරීරික හිංසනයට ලක්කොට බලෙන් රැගෙන ගොස් සිර අඩස්සියේ තබනු ලැබීය. ඔහු වෙත එල්ල කැරුණු බොරු චෝදනාව වූයේ, ඔහු විසින් ආරක්ෂක භටයන් හට මරණීය හානි සිදු කිරීමට උත්සහ කළ බවය.

සත් මසක පමණ කාලයක් සිරගත කිරීමෙන් පසුව, ඔහුව ගිය සතියේ අධිකරණය වෙත ඉදිරිපත් කෙරිණි. මෙම සිද්ධිය ද මාධ්‍යයන්ගෙන් සඟවනු ලැබුවත් පසුව එම සිද්ධිය හෙළි කරනු ලැබීමෙන්, නීතිඥයන් කීපදෙනෙක් ඔහු වෙනුවෙන් උසාවියේ පෙනී සිටීමට උත්සාහ කළ නමුත්, එයද වළකනු ලැබ ඇත. චීනයෙන් පැනගත් චෙන් ගුආන් චෙන් දැන් ජීවත් වන්නේ ඇමෙරිකාවේ නිව්යෝර්ක් නගරයේය. එහිදී, චීන නීතිය පිළිබඳ විශේෂඥයකු වන නිව්යෝර්ක් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ජෙරොම් කොහෙන් මෙම සිද්ධියේදී අන්ධ නීතිඥ චෙන් ගුආන් චෙන් හා සමීපව කටයුතු කරයි. චීනයේ පවත්නා එක් දරු ප්‍රතිපත්තිය හා බැඳි ගබ්සාවට හා උපත් පාලනයට එරෙහිව ඔහු ජාත්‍යන්තර ව්‍යාපාරයක් ගෙන යයි. චෙන් ගුආන් චෙන්ගේ බෑනාට විරුද්ධව එල්ල කරන ලද චෝදනාව බොරුවක් වුවත් ඔහුගේ නිදහසට කරුණු කියා පෑමට කිසිදු ආකාරයේ අවකාශයක් ලබාදුන්නේ නැහැ. චීනය විසින් දක්වනු ලබන "යුක්තිය හා සාධාරණය යන්න මහා විහිළුවක්" ජෙරොම් මහාචාර්ය වරයා එලෙසින් ද මාධ්‍යයන්ට පවසා ඇත. චීනයේ පවත්නා එක්දරු න්‍යාය යටතේ සිදු කැරෙන සාපරාධයන් පිළිබඳ වීඩියෝ පටයක් චෙන් ගුආන් චෙන් විසින් ලෝකය පුරා පතුරුවා හැරීමට කටයුතු යොදා ඇත.

# ඉන්දියාවේ ප්‍රථම ගිහි ප්‍රාණ පරිත්‍යාගවරයා භාග්‍යවරයට

18 වෙනි ශත වර්ෂයේ ගිහි ප්‍රාණ පරිත්‍යාගවරයා ලෙස සැළැකෙන ඉන්දීය ජාතික දේවසහයෙම්පිල්ලේ, දෙසැම්බර් මස 02 දින භාග්‍යවරයට ඔසවනු ලැබීය. ඉන්දීය කතෝලික සභාව විසින් එම අවස්ථාව සුවිශේෂී සිද්ධියක් ලෙස සලකනු ලැබුවේ, එතුමා ඉන්දියාවේ භාග්‍ය වරයට ඔසවනු ලැබූ ප්‍රථම ගිහි ප්‍රාණ පරිත්‍යාගවරයා වීමයි. කොට්ටාර් ප්‍රදේශයේ කාර්වර් මහා විදුහල් භූමියේ පවත්වන ලද එම උලෙළට වතිකාන නියෝජිතයෝ ද, ඉන්දීය කාදිනල්වරුද, රදගුරු හිමිවරු ද, පූජකවරුද, පැවිදි සහෝදර සහෝදරියෝ ද, ගිහි ඇදැහිළිවන්තයෝ ද අති විශාල සංඛ්‍යාවක් සහභාගි වුහ.

වර්ෂ 1712 දී උපත ලබා වර්ෂ 1752 දී ඇදැහිල්ල වෙනුවෙන් ජිවිතය පූජා කල දේවසහයෙම් පිල්ලේ, වැඩවසම් නයාර් පවුලක උපත ලබා ඇත. එතුමා ට්‍රැවැන්කෝර් හි අති බලසම්පන්න මතන්ඩා චර්මා රජයේ පාලන සමයේ රාජකීය සේවයෙහි නිරතව සිටියෝය. එදා පැවැති 'කුලාචාර්' නමැති දරුණු යුද්ධයෙන් පසු එවුස්ටාවෙස් ඩෙනඩික්ටස් ද ලෙනෝයි නම් ලන්දේසි කපිතාන් වරයා මතන්ඩා චර්මා රජයේ සිරකරුවෙක් බවට පත්විය. නමුත්, මෙම ලන්දේසි කපිතාන් වරයා මතන්ඩා චර්මාගේ හමුදාවට බැඳීමෙන් පසුව, දේවසහයෙම පිල්ලේගේ සමීපතම මිතුරකු බවට පත්ව ඇත. ඒ අනුව, එම ලන්දේසි කපිතාන් වරයාගේ ආභාෂයෙන් ඔහු කිතු දහම වැළඳගෙන ඇත.

එතුමා කතෝලිකයකු වශයෙන් බෞතිස්මය ලැබීමත් සමග වැඩවසම් සමාජ ක්ෂේත්‍රයේ ස්වාමිවරුන්ගේ උදහසට ලක්විය. එතුමාගේ කිතුනු ඇදැහිල්ල ප්‍රතික්ෂේප කොට යළි හින්දු දහම වැළඳ ගන්නැයි කාලයක් පුරා ඔහුට බලපෑම් කරනු ලැබුවත් ඔහු කිසිසේත්මැ සෙලවූයේ නැත. එමෙන්මැ සිය ඇදහිල්ල ප්‍රසිද්ධියේමැ ප්‍රකාශ කළේය. බළධාරින් විසින් එතුමාව වසර තුනකට වැඩි කාලයක් සිරේ තබාගෙන ශාරීරික හා මානසික පීඩාවලට පාත්‍ර කරනු ලැබුවත් එතුමා කිසිදු ආකාරයකින් ඇදහිල්ල ප්‍රතික්ෂේප කළේ නැත. කෝපාවිෂ්ට වූ බළධාරීන් වර්ෂ 1752 ජනවාරි මස 14 වෙනිදා එතුමාව රහස් ස්ථානයකට ගෙනගොස් වෙඩි තබා මරා දමනු ලැබීය. එතුමා භාග්‍යවරයට ඔසවනු ලැබීමේ ක්‍රියා වලිය වර්ෂ 2010 මාර්තු මාසයේදී අවසන් වු අතර ප්‍රාණ පරිත්‍යාග වර දේවසහයෙම් පිල්ලේ ගිහි කතෝලිකයා භාග්‍යවරයට එසවීම XVI වෙනි බෙනඩික්ට් ශුද්ධෝත්තම පියා විසින් ද අනුමත කරනු ලැබීය.

# නොතිත් පැය 40 ක නත්තලේ සත්ප්‍රසාද වහන්සේ යැදුමක්



ක්‍රිස්තුස් වහන්සේගේ උපත ද මරණයෙන් උත්ථානය ද සිදු වූ මැද පෙරදිග දේශය කිතු දහමේ තොටිල්ල යයි ලෙබනනයේ "නව මැවිල්ල" නම් සංවිධානය ලොවට පවසයි. මැදපෙරදිග මෙන් ලොවේ සියලු ජනයා ද සාමය බලාපොරොත්තුවෙන් බලා සිටිති. එබැවින් සියලු කළබලකාරි හා යුධමය වාතාවරණයන් තුළ මෙම බලාපොරොත්තුවේ නත්තල් සමය තුළදී, නිහඬතාවයෙන් හා නමස්කාරයෙන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ හමුවේ උත්ථාන වූ සමිඳුන් අත්දැකීමට අප සැම කැඳවනු ලැබ තිබෙනවා.'නව මැවිල්ල' සංවිධානයේ ක්‍රියාකරුවෝ එලෙස පවසති.

මේ අනුව, ලෙබනනයේ එම 'නව මැවිල්ල' නම් කතෝලික සංවිධානය විසින් අඛණ්ඩව පැය 40 ක් පුරා පැවැත්වෙන දිව්‍ය සත්ප්‍රසාදයේ උත්ථාන සමිඳුන් නැමදීමේ යැදුම දෙසැම්බර් මස 22 ඉරුදින ආරම්භ කැරේ. එම කතෝලික සංවිධානයේ ක්‍රියාකරුවන් විසින් සියලු මීසම් සංඝයන් හී සැදැහැවතුන් දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් ද අරඹා ඇත. නත්තලේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ නැමැදීමේ විශේෂත්වය වන්නේ බොහෝදුරට නිශ්ශබ්දතාවය තුළින් උත්ථාන සමිඳුන්ට ඇහුම්කම්දීමේ හා ප්‍රතිඋත්තර නත්තලේදී ලබා ගැන්මේ වන්දනාවක් යැයි පෙන්වා දී ඇත. තවද පැය 40 ක් නොකඩවා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අභිමුවේ පෙනී සිටීමෙන් අපේ සියළු ප්‍රශ්න වලට හා බලාපොරොත්තු වලට අනිවාර්යයෙන් උත්තර ලැබෙනා බවට අත්දැකීම් ඇත්තෝ සාක්ෂි දරති. අතීත ශත වර්ෂ කාලයේදී පවා නත්තල් සමයේදී උත්ථාන වු සමිඳුන් නමැදීමේ විශේෂ මෙහෙයන් පැවැති බැව් ද පෙන්වා දී ඇත.

# ශුද්ධවූ දේශයේ ඇතැම් පූජනීය ස්ථාන අනතුරේ

ඊශ්‍රායෙලයේ සැළසුමක් අනුව ජෙත්සමනි උයනේ ඔලිව් වෘක්ෂයන් සහිත ප්‍රදේශය හා ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණ ස්ථානය අවට භූමි භාගයේ හමුදා පුහුණු පීඨයක් ගොඩනගනු ලැබුවහොත් එම පූජනීය ස්ථානයන් අනතුරට පාත්‍ර වන බැව් කතෝලික පුවත් වාර්තා කරයි. යෝජිත ගොඩනැගිලල් වර්ග මීටර් 41,480 ක වට ප්‍රමාණයක මහල් පහකින් යුක්ත වනු ඇත. මෙලෙස හමුදා පුහුණු කීපයක් ගොඩනගනා ලද බැව් දැක්වෙන පත්‍රිකාවන් දැනටමත් ඒ ඒ ස්ථානයන් හි ප්‍රදර්ශනය කරත.

එලෙස හමුදා පුහුණු පීඨයක් ඇතිවීමෙන් ඒ අවට ප්‍රදේශයන් හී හමුදාවන්ගේ හැසිරීම් ව්‍යාප්ත වන හෙයින්, ආසන්න ප්‍රදේශයන්ට ඇතුළුවීමේ අවහිරතාවයන් ඇතිවය හැකි බැව් වාර්තා වේ. තට්ටු පහකින් යුත් එම යුධ පුහුණු ගොඩනැගිලල් අහස් කුසින් දිස්විය හැකි හෙයින් වන්දනා කරුවන් හා සංචාරකයන් කෙරෙහි ද අහිතකර වේ යයි ද දක්වා ඇත. අදාළ භූමි භාගය කලින් පලස්තීන පවුල් දෙකකට අත්ව තුබූ අතර වර්ෂ 1968 දී එම භූමිය ඊශ්‍රායලය විසින් පවරාගෙන ඇත. එම භූමි භාගය පිහිටා ඇත්තේ ද පලස්තීන වටපිටාවේය.

"ශුද්ධවු දේශයේ ඇතැම් පූජනීය ස්ථානයන්ට හානි පැමිණිය හැකි මෙම කාර්ය නොකළ යුතු යයි ඊශ්‍රායෙල් රජය වෙත කරුණු ඉදිරිපත් කළ යුතුය. මෙම අහිතකර තත්ත්වයන් පෙන්වා දෙමින් ශුද්ධ වූ ස්ථානයන් අවට යුධ පුහුණු ඇකඩමියක් ඉදිකිරීමේ සැලැසුම වහා නතර කරනා ලෙසට සකළ කිතුනුවන් ද විදේශ රාජ්‍යයන් ද විසින් වහා ඉල්ලා සිටිය යුතුය." එලෙස පවසනු ලබන්නේ ඊශ්‍රායෙලයේ පුරා විද්‍යා හා සමාජ ක්‍රියාකාරකම් පිළිබඳ සංවිධානයයි.

# වෙඩි කෑ ධර්මදූතිකාවගේ තත්ත්වය බරපතළයි

පාකිස්තානයේ වෙසෙන සුවිස් ජාතික 72 හැවිරිදි බර්ගිතා අල්බි නම් කිතුනු සමාජ සේවිකාව ත්‍රස්ත ක්‍රියාකරුවන්ගේ වෙඩි පහරට ලක්ව ලාහෝර් හි ජින්නා රෝහලේ දැඩි සත්කාරකයේ ප්‍රතිකාර ලබයි. දෙසැම්බර් මස 03 වෙනිදා සවස ඇ ලාහෝර් නගරයට පැමිණ සිය මෝටර් රථය නවතා ඉන් ඉවත්වීමට සැරසෙද්දී, මෝටර් සයිකලයකින් පැමිණි දෙදෙනෙක් ඇගේ පපු පෙදෙසට වෙඩි තබා ඇත. අවුරුදු 38 ක පමණ දිගු කාලයක් පාකිස්තානයේ දයා සේවයෙහි නිරතව සිටිනා ඇ වෙත වෙඩි පහර එල්ල කරනු ලැබීමෙන් කිතුනුවන් මෙන්ම අනෙකුත් ජනයා ද කම්පනයටත් ශෝකයටත් පත්ව ඇතැයි ලාහෝර් හී සාම මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජේම්ස් චනාත් පියතුමා කතෝලික පුවත් වලට පවසා ඇත.

දිගු කලකට ඉහතදී ඇ විසින් ආබාධිත දරුවන් රැකබලා ගැනීමේ සේවාවක් ආරම්භ කොට ඇත. කාලයත් සමග එම සේවාව ව්‍යාප්තවී ගොස් මේ වන විට එම සේවාව රාජ්‍ය නොවන සංවිධානයක් ලෙසින් ආබාධිත දරුවන් විශාල සංඛ්‍යාවකට සුවිසල් සේවාවක් සලසයි. තවද, ඇ විසින් කිතුනු වනිතාවන්ගේ සුවසේවා වැඩපිළිවෙලක් ද පවත්වාගෙන යනු ලබයි. අන්තවාදී ත්‍රස්ත ක්‍රියාකරුවන් විසින් ඇගේ වනිතා කිතුනු සේවාව කෙරෙහි විරෝධතාවය දක්වා ඇතැයි ද වාර්තා වේ. එබැවින් ඇට එල්ල කැරුණු මාරාන්තික වෙඩි වැදීම සංවිධානාත්මක ක්‍රියාවක් යැයි ද පෙනී ගොස් ඇත.

මෙම තත්ත්වය පිළිබඳව පාකිස්තාන අගමැතිවරයාගේ ජාතික සමගිය පිළිබඳ උපදේශක පෝල් බාති මෙලෙස පවසයි. "බර්ගීතා මහත්මිය වෙත ත්‍රස්තයන් විසින් එල්ල කරති සාපරාධි ක්‍රියාව සමස්ථ පාකිස්තාන ජනතාව විසින් හෙලා දැකිය යුතුය. මෙම අමානුෂික ක්‍රියාව පාකිස්තානයේ ආගමික සමගිය කෙරෙහි එල්ල කරති පහරක් ලෙසින් ද සැලැකිය යුතු වේ. තවද සියලු ආගමිකයන් එකාවන්ව ආගමික නිදහස වෙනුවෙන් කටයුතු කිරීමට පියවර ගැන්ම බර්ගීතා මහත්මියට කෙරෙන උත්තරීතර ගෞරවයක් වනු ඇත.

# උතුරු සුඩානය
## දකුණේ කිතුනු සුඩානයට බෝම්බ හෙළයි

ඉස්ලාම්වාදී උතුරු සුඩානය දකුණු සුඩානයේ කිතුනුවන්ට හා ඉස්ලාම් නොවන අනෙකුත් ආගමිකයන්ට විටෙන් විට ගුවනින් පවා පහරදීම් කරගෙන යයි. සුඩානය එකම රටක් වශයෙන් තිබුණත්, ආගමික හා ස්වාභාවික සම්පත් පදනම් කරගත් විරෝධතාවය නිසා ඉස්ලාම් උතුරු සුඩානයත් කිතුනු දකුණු සුඩානයත් අතර තිබුණේ දැවැන්ත විරෝධතාවයකි. වසර ගණනාවක් පැවැති යුද්ධයකට පසුව පසුගිය වසරේ පැවැති ජනමත විචාරණයේ ප්‍රතිඵලය අනුව උතුරු සුඩානය හා දකුණු සුඩානය රටවල් දෙකක් බවට පත්විය. එහෙත් දෙපාර්ශවයන් අතර සතුරුකම් නිමා වූයේ නැත. උතුරු හා දකුණු මායිම් අතර සටන් බොහෝවිට උග්‍ර වේ. පසුගිය සති කීපය තුළදී, උතුරු රජයේ හමුදා කණ්ඩායම් විසින් දකුණු මායිමේ ඒ ඒ තැන්වලට බෝම්බ හෙළා තිබේ.

සති දෙකකට ඉහතදී නොබෝ නම් කඳුකර ප්‍රදේශයේදී උතුරු සුඩාන හමුදා භටයින් විසින් කිතුනුවන් තිදෙනෙක් ද කිතුනු සමාජ සේවා ආයතන දෙකක් ද කතෝලික දෙව් මැඳුරක් ද බෝම්බ ප්‍රහාරයෙන් විනාශ කොට තිබේ. තවද අල්රේකා නම් ගැමි ප්‍රදේශයේ 42 හැවිරිදි සුලෙමාන් කුකු නම් කිතුනුවා ද ඔහු හා සිටි 06 හැවිරිදි ගැහැනු දරුවා ද බෝම්බ ප්‍රහාරයෙන් මියගොස් ඇතැයි වාර්තා වේ.

උතුරු සුඩානයේ ඉස්ලාම් වරුන්ගේ අරමුණ වන්නේ, කිතුනුවන්ගේ ව්‍යාප්ත වීමට හා ආර්ථික ප්‍රගතියට බාධා පැමිණවීම බැව් කිතුනුවෝ පවසති. "ඔවුහු නිරන්තරයෙන් දෙව් මැඳුරු ඉලක්ක කරති. දින කීපයකට ඉහතදී දේව ධර්ම නිකේතනයක් ද විනාශ කර තිබුණා. මෙලෙසින් ප්‍රකාශ කළේ කිතු දහම් සේවකයෙකි. එහෙත් පවත්නා තත්ත්වයට මුහුණදීම සඳහා කිතුනුවන් ද සිය එකමුතු සවිය හා බලය වඩවා ගනිමින් පහරදීම් වලට මුහුණදීමට සැරසී සිටිනා බැව් ද වාර්තා වේ.

# නයිජීරියානු ඉස්ලාමිකයෝ
## තවත් කිතුනුවන් 10 දෙනෙක් මරති

උතුරු නයිජීරියානු ඉස්ලාම්වරුන් විසින් කිතුනුවන්ට හා කිතුනු දෙව් මැඳුරු වලට පහරදීමේ රැල්ල තව තවත් උග්‍ර කොට තිබේ. දෙසැම්බර් මස 01 වෙනිදා උතුරු නයිජීරියාවේ වීබොං නම් නගරාසන්නයේ ඇති කිතුනු ග ම්මානයකට කඩා වැදුණු ඉස්ලාම්වරු ඇතැම් ගෙවල් ඇතුළට පැන කිතුනුවන් 10 දෙනෙකුගේ ගෙල කපා මරා දැමුවෝය.

ඔවුන් අත ගිනි අවි තිබුණත් කිතුනුවන් මරා දමනු ලැබුවේ පිහි කැති වලිනි. 'බොකෝ හරාම්' සංවිධානයේ මැර කණ්ඩායම් විසින් එලෙස කිතුනුවන් මරා දැමූ බැව් ඇස් පනාපිට දුටු ඇත්තෝ සනාථ කරති. එලෙස එම කිතුනුවන් මරා දැමීමෙන් පසුව අනෙක් කිතුනු පවුල් වල දරු දැරියන්ට පහර දෙමින් ඔවුන් පළවා හැර ගේ දොර ගිනි තබා විනාශ කරනු ලැබීය.

මෙම සිද්ධියෙන් පසු ඉරුදිනයේදී 'බොකෝ හරාම්' කණ්ඩායම උතුරු නයිජීරියාවේ දෙව් මැඳුරු කීපයකට පහරදී ඇත. එම අවස්ථාවේදී ඇදැහිලි වන්තයන් දෙව් මැඳුරු තුළ නොසිටි නිසා කීප දෙනෙක් පමණක් තුවාල ලබා ඇත. එහෙත් දෙව් මැඳුරු වලට පහරදීම වලක්වාලීමට එහි පැමිණි පොලිස් නිළධාරින් හට පහරදී ඇති අතර ඔවුන්ගෙන් දෙදෙනෙක් ද මරණයට පත් වී ඇත. තවද සිදුවු වෙඩි හුවමාරු වලදී කීපදෙනෙක් තුවාල ලබා ඇති අතර රජයේ කාර්යාල කීපයක් ද කඩා බිඳ දමා ඇත. බොකෝ හරාම් ත්‍රස්ත කණ්ඩායම විසින් දියත් කරෙති දෙව් මැඳුරු වලට පහරදීම් වළකාලීමට නයිජීරියානු රාජ්‍ය පොලීසිය ක්‍රියා කරනා හෙයින්, ඔවුන් පොලීසිය කෙරෙහි ද ක්‍රෝධයෙන් හා වෛරයෙන් සිටිනා බැව් වාර්තා වේ.

සංවාද මණ්ඩපය

# නිදහස් අධ්‍යාපනයේ කප්පාදුවට කතෝලික අපිත් නෑකම් කියමුද? කලු පැල්ලමකට යළිත් වරක් ඉඩ සලසමුද?



රදගුරුතුමනි,

**ලන්දේසි ආක්‍රමණයෙන් පසු අප දේශයේ අධ්‍යාපනික උන්නතිය උදෙසා ක්‍රමානුකූල ආරම්භයක් ලබා දී ඇත්තේ ඉංග්‍රීසි ජාතිකයෝ ය. ලංකාව තුළ නිදහස් අධ්‍යාපනයේ සැබෑ ආරම්භකයා වූයේ උපකෘත පාඨශාලා ආරම්භ කළ අති උතුම් දේව ධර්මාචාර්ය අර්නස්ට් බොන්ජන් නි.ම.නි. රදගුරු හිමිපාණන් ය. ඒ මූලාරම්භයේ සිට නිදහස් අධ්‍යාපන ක්‍රමයක් අප දේශය තුළ බිහි වීමට ලාංකේය කතෝලික සභාව ලබා දුන් අනුග්‍රහය පිළිබඳව සත්‍ය ඉතිහාසය අපට සාක්ෂි දරයි.**

එය කතෝලික අපට සාඩම්බරයට කරුණකි. ක්‍රි.ව. 1886 සිට ආරම්භ කළ උපකෘත පාසල් 1961 වර්ෂයේ "ආධාර ලබන පාසල්" නමින් රජයට ගැනීමෙන් පසු නිදහස් අධ්‍යාපනයේ නොයෙක් තාඩන පීඩන තුළින් හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ නොයෙක් වැරදි ක්‍රියා මාර්ග හේතුවෙන් දුප්පත් අසරණ දරුවන්ට නිදහසේ අධ්‍යාපනය ලැබීමේ වරම් ඇහිරුන බවත් ඉන් සැබෑ නිදහස් අධ්‍යාපනයට කණකොකා හැඬලීම ආරම්භ වූ බවත් ප්‍රසිද්ධ රහසකි. පාසල් රජයට ගැනීමේ ක්‍රියාදාමයට එරෙහිව ලාංකේය කතෝලික සභාව මුලින් සටනක යෙදුනි. එහෙත් 1956 දේශපාලනික පෙරළිය අධ්‍යාපන ක්ෂේත්‍රයට කෙළින්ම බලපෑ දේශපාලන පෙරළියක් විය. එහි අනිසි ප්‍රතිඵලය වූයේ පාසල් රජයට පවරා ගැනීමේ රජයේ දරදඬු, අදූරදර්ශී ක්‍රියා කලාපය නිසා ලංකා කතෝලික සභාවට ද ඒ අයගේ තීරණයට යටත් වෙමින් නිහඬ වීමට සිදුවිය. එහිදී අප කතෝලික සභාව මත ද කළු පැල්ලමක් තැවරුනු බව අප පිළිගත යුතුය. කතෝලික ධනවත් දෙමාපියන් ගේ දරුවන් සඳහා පෞද්ගලික කතෝලික පාසල් අතලොස්සක් රඳවා ගැනීමත්, එමඟින් අසරණ කතෝලික දුප්පත් දරුවන්ට කතෝලික වටිනාකම් ඇති කතෝලික පාසල් නොලැබෙන තැනට වැඩ සැලසීමත් ඊට හේතුවයි. තවද මෙම කතෝලික පාසල් වලට දරුවන් ඇතුළත් කරගැනීමේ ප්‍රධාන නිර්ණායකය කතෝලික ආගම නුවූ බැවින්, ධනවත් හා වංශවත් පවුල් වල නොකිතුනු දරුවන් ද ඒවායෙහි අධ්‍යාපනය ලැබූහ. ඔවුන් පවා 1961 දී, ආධාර ලබන පාසල් රජයට පවරා ගැනීමේ පනත් පිහිතලය අමෝරා ගත් අතර, කතෝලික පාසල් වලින්ම බිහිවූ ඔවුහු අපට ම පාරාවළල්ලක් වූවෝය. ආධාර ලැබූ පාසල්වල සිප් සතර හැදෑරූ අප අසරණ කතෝලික දුප්පත් දරුවන් අමතක කිරීම එම කාලය තුළ දී කතෝලික නිළ දරුවන් අතින් සිදුවූ අමතක නොකළ හැකි විශාල වරදකි.

ගරු රදගුරුතුමනි, මගේ මෙම ලිපියෙන් මම අදහස් කරන්නේ සිදුවූ වරද නැවත නැවත උලුප්පා දැක්වීම හෝ එය යළි යළි ගොඩට ඇද ගැනීම නොව, එවැනි වරදක් යළිත් නොවන්නට වගබලා ගැනීම යි. එය ගිහි ජනතාව වන අපගේත් අප එඬේරුන් වන ඔබතුමන්ගේත් යුතුකමයි. පාසල් රජයට ගත් පසු කතෝලික අසරණ දරුවන්ගේ අධ්‍යාපනය ගැන කතෝලික සභාවේ නිල දරුවන්ගේ සිත් යොමු නොවීම නිසා කතෝලික ගුරු අභ්‍යාස විදුහල් පවා අප කතෝලික අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් ගිලිහී ගියේ ය. මෙය අපට හුරු පුරුදු කතෝලික අධ්‍යාපනය රැඳී තිබුණු "පල්ලියයි - ඉස්කෝලයයි" සංකල්පය බිඳ වැටී යාමට හේතු විය. නිදහස් අධ්‍යාපනය ගැන දේශපාලන පොත පත පෙරළීමේදී අප ආඩම්බරයෙන් කථා කළත් අප දේශයේ දැනට බිහි වී ඇත්තේ නිදහස් අධ්‍යාපනයක් නොවන බව නම් සක් සුදක් සේ පැහැදිලිය. උදාහරණ ලෙස ගතහොත් දරුවන්ව පාසල් වලට ඇතුළත් කිරීමේ දී දේශපාලනික බලපෑම් හා අල්ලසට අමතරව පාසලකට ඇතුළත් කිරීමට ලක්ෂ ගණන් මුදල් ද දිය යුතුයි. පාසල් සංවර්ධන අරමුදල් සඳහා තරගකාරීව මුදල් පරිත්‍යාග කළ යුතුය. පන්ති කාමර හා පුටු මේසවල තීන්ත ආලේප කිරීම සඳහා ද මුදල් වාර්ෂිකව අය කෙරේ. පාසල් ගාස්තු ද සීමාවෙන් තොරය. ඉන්පසු නොයෙක් සල්පිල් හා ආධාර සඳහා මුදල් පරිත්‍යාග, ක්‍රීඩා උත්සව, ත්‍යාග ප්‍රදාන උත්සව සඳහා මුදල් ලබා ගැනීම දිගින් දිගටම සිදු වේ. මේ අයුරින් බලන කල නිදහස් අධ්‍යාපනය වචනයේ "නි" අක්ෂරය ලොප් කර "දහස් අධ්‍යාපනය"ලෙස හැඳින්වීම මැනවැයි මට සිතේ. විභාග සමත් වීම සඳහා බාහිර පන්තිවලට ද විශාල මුදල් සම්භාරයක් වැය කිරීමට සිදුවීම ඉතාම ශෝචනීය ය. මෙවැනි දේවල් සඳහා අපත් යළිත් වරක් වක්‍රාකාරයෙන් අත දෙනවා ද? කළු පැල්ලමකට යළිත් වරක් ඉඩ සලසනවාද?

සභා නිල දරුවන්ගේ යළි පිබිදීම මත කතෝලික සභාවට අයත් පෞද්ගලික පාසල්වල ශාඛා පාසල් පිහිටුවීම කතෝලික දෙමාපියන්ට හා දරුවන්ට වැසි නැති ඉඩෝරයට පින්නක් ලෙසටයි මා දකින්නේ. එය මහා වැස්සකට පරිවර්තනය වුවහොත් අපිට තවත් සතුටු වීමට හැකිය. එනමුත් මෙම පාසල් ද, පාසල් රජයට ගත් පසු ආරක්ෂා කළ පෞද්ගලික පාසල්වල තත්වයට පෙරසේම පරිවර්තනය වුවහොත් කතෝලික අසරණ බුද්ධිමත් දරුවන්ට කාගේ සරණයක් ද?

අප මීසම්වල සිටින අසරණ බුද්ධිමත් කතෝලික දරුවන්ව කතෝලික පෞද්ගලික පාසල් වලට ඇතුළත් කරවීම සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවීම අභාග්‍යයකි. මින් දරුවන් අධ්‍යාපනික මෙන්ම මානසික පසුබෑමකට ද ලක්වන අතර දෙමාපියන් ද ඉන් අසරණ වේ. එවැනි අවස්ථා වලදී කතෝලික දරුවන් වෙත අප නෙත් යොමු විය යුත්තේ "බාලයන් මා වෙත එන්න ඉඩ හරිනු" යන ක්‍රිස්තුන් වහන්සේගේ වදන් ද සිහිපත් කර ගනිමිනි. එම නිසා ක්‍රිස්තුන් වහන්සේව කේන්ද්‍ර කරගනිමින් දරුවන් වෙනුවෙන් විය යුතු සේවයට අප සභාව මුල් විය යුතු බව මගේ වැටහීමයි. එවැනි කතෝලික දෙමාපියන් හට එම මුදල වැය කිරීමට නොහැකි නම් එය විසඳා ගැනීමට සුදුසු ක්‍රියා මාර්ගයකට අප විසින් ප්‍රවිෂ්ඨ වීම අවශ්‍යයි නේද? අප දුප්පත් කතෝලික අසරණ දරුවන්ට අත දීමක් අවශ්‍යයි නේද?

ධනවත් කතෝලික දෙමාපියන්ගේ දරුවන් පෞද්ගලික පාසල්වලට ඇතුළත් කර ගැනීමේ දී ඒ සඳහා මුදල් අය කිරීම පාසලේ අවශ්‍යතාවයන් අනුව සිදු කිරීමට නීති රීති සීමාවන් අවශ්‍ය නොවේ. එනමුත් දුප්පත් පවුල් වලින් බිහිවෙන බුද්ධිමත් කතෝලික අසරණ දරුවන්ට අප පදවිය තුළ අප සභාව තුළ හා අප දේශය තුළ අනාගතයේ දී පාසල් වලට ඇතුළත් කරවීමේ සැලැස්මක් නැද්ද? ඔවුන්ගේ අසරණ දුගී භාවය තුළ දැනට ඉපදී සිටින, ඉපදෙන අසරණ දරුවාට එය සදාකල් නොවිසඳෙන ප්‍රශ්නයක් ලෙස මුහුණ දීමට ඉඩ හරිමුද? තව තවත් කල් මරමුද? අප පදවිය තුළ අප සභාව තුළ හා අප දේශය තුළ ඒ අසරණ දරුවන් සඳහා අරමුදලක් ඇරැඹීමට හා සැලැස්මක් ඇති කිරීමට ඇති බාධාව කුමක් ද? ඒ සඳහා අප සැම වෙහෙසවීම හා කැපවීමක් කළ යුතු යි නේද? එය අප කොයි කාගෙත් දේව කැඳවීමේ වගකීමක් නොවන්නේ ද? බුද්ධිමත් අසරණ කතෝලික දරුවන්ට කතෝලික පෞද්ගලික පාසල් වලට ඇතුළත් කිරීමට අප ගත යුතු මඟ කුමක් ද කියා සොයා බැලීම කාලීන අවශ්‍යතාවයකි. එයට කැමති සියළු දෙනා ඒකරාශී කරගෙන වටමේස සාකච්ඡාවකට ඇරැයුම් කළ යුතු කාලයකට අප දැන් ප්‍රවිශ්ඨ වී ඇති බව මාගේ වැටහීමයි. ජේසු සමිඳුන් පැවසූ ලෙස "සොයන්නාට සම්බ වේ" යන වදන අදහමින්, විසඳුම් සොයා යාමෙන් විසඳුම් ලැබෙන බවයි මගේ විශ්වාසය.

පාසල් රජයට පවරා ගැනීමේ දී කතෝලික පාඨශාලා සාමාන්‍යාධිකාරි පියතුමාට තිබූ බලතල තවමත් එසේ ම පවතී ද? එසේ නොපවතී නම් මහින්ද චින්තනය අනුව සියලු ආගම් වලට ගරු කිරීම මත එම බලතල නැවතත් ලබා ගෙන දුප්පත් අසරණ කතෝලික දරුවන් වෙනුවෙන් එතුමාට ඇප කැපවීමට හැකියි නේද?

රදගුරුතුමනි, අවසන් වශයෙන් තවත් යෝජනාවක් මේ සමඟ ඉදිරිපත් කරන්න මට අවසර දෙන්න. තවත් ප්‍රශ්නයක් අද කතෝලික අපට පැන නැගී ඇත. කතෝලික ආගම ඉගැන්වීමට ගුරු හිඟයක් අප දේශයේ පාසල් තුළ පවතී. අප පදවිය තුළ රජයේ පාසල්වල ඉගෙනීම ලැබූ, සාමාන්‍ය පෙළ විභාගය සමත් වී, උසස් පෙළ ඉගෙනුම ලබනට සුදුසුකම් ඇති දරුවන්, උසස් පෙළ සඳහා කතෝලික ආගම විෂයක් වශයෙන් තෝරා ගනී නම් ඒ සඳහා දැනට තිබෙන කතෝලික පෞද්ගලික පාසලකට කිසිම බාධාවකින් තොරව ඇතුළත් වීමට අවස්ථාව උදා කළ හැකියි නේද? පවත්නා කතෝලික ගුරු හිඟයට ද දේව කැඳවීම් පිළිබඳව දරුවන් තුළ හීන වී යන උද්යෝගයට ද මෙය කදිම පිළිතුරක් බව මගේ විශ්වාසය යි.

**සි. සෙ. ප්‍රනාන්දු**
උඩුගම්පොළ

# ලංකාවට සුදුසු අධ්‍යාපන ක්‍රමයක් සකස් කළ යුතුයි

අප වෙසෙන ශ්‍රී ලංකාවේ පවතින්නේ යටත් විජිත අධ්‍යාපන ක්‍රමයකි. අතීතයේදී මෙරට අධිරාජ්‍යවාදීන් විසින් නිර්මාණය කරන ලද බටහිර වුවමනාවන්ට ගැළපෙන අධ්‍යාපන රටාවක් ඔවුන් සකස් කර තිබේ.

එහිලා විෂය දැනුමට අධික වශයෙන් මූලිකත්වයක් ලැබෙන, ජනතා ප්‍රශ්න, සංකීර්ණතා ආදියට බද්ධ නොවන අන්දමින් මෙරට අධ්‍යාපනය සැකසිණ. එහි අයහපත් ප්‍රතිඵල රාශියක් භුක්ති විඳින්නට සිදුවී තිබේ.

සෞන්දර්යාත්මක රස වින්දනයෙන් බැහැරව සාහිත්‍යයට අඩු ලන්සුවක් ලබා දෙමින් නව අධිරාජ්‍යවාදී අදහස් කුළු ගැන්වෙන අන්දමින් මෙරට අධ්‍යාපනය සකස් වී පවතින බව පෙනේ. වර්තමාන සමාජය තුළ අධ්‍යාපනය පවා ආර්ථික සංස්ථාවේ සංරචකයක් බවට පත්වී ඇත. එපමණක් නොව දිනෙන් දින උග්‍රවන ජනතා ගැටලු, සිය දිවි නසා ගැනීම්, ළමා අපයෝජන, මිනීමැරුම් ආදි ප්‍රශ්න තුළ ගාමක බලවේගය වන්නේ නුසුදුසු අධ්‍යාපනයක් තිබීමයි.

දේශීය අවශ්‍යතාවලට යෝග්‍ය වන අන්දමට ස්වාභාවික සම්පත් උපයෝගී කොට ගනිමින් වැඩිහිටි පරපුරද සහය කොටගෙන මෙරට අධ්‍යාපනය සකස් කළ යුතුව ඇත. එමිල් දුර්කයිම් නැමැති සමාජ විද්‍යාඥයාට අනුව අධ්‍යාපනය වූ කලී සමාජ සංවර්ධනයේ නියමු සාධකයකි. ජීවිතයේ එදිනෙදා දේවලට යන වියදම් සීමා කරන ලෙසත් අධ්‍යාපනයට යන වියදම් සීමා නොකරන ලෙසත් වී. අයි. ලෙනින් පවසා ඇත.

මෙරට අධ්‍යාපන සංස්ථාව තුළින් සිදුවන්නේ විෂය දැනුමෙන් පුද්ගලයා යෝධයකු කිරීමත් කුසලතා හා මානව ගුණ දහම් වලින් අඟුටු මිට්ටෙක් බවට පත් කිරීමත්‍ය. එ

එදා මාර්ටින් වික්‍රමසිංහ සූරින් විසින් ලියන ලද "විරාගය" නමැති නව කතාවේ කථානායකයා වන අරවින්ද ජයසේනයන් ද තරුණ වයස තුළ මනස කුරෝලු වීමට බඳුන් විය. එයට පාදක වූයේ ද බටහිර අනුකාරක අධ්‍යාපන රටාවයි. මෙරට සිදුවන ලිංගික අපරාධ, අසම්මත සබඳතා, සියදිවි නසා ගැනීම්, වැඩිහිටියන් කරනු ලබන වැරැදි පිටුපස පවතින්නේ ද ශික්ෂණය ආශ්‍රිත ගැටලුය.

බටහිර අධ්‍යාපනයෙහි යහපත් පැතිකඩ ද පවතී. ඒවා මෙරට දේශීය අවශ්‍යතාවලට සරිලන අයුරින් සකස් කිරීමට කාලය එළැඹ ඇත. එදා ගැමි සමාජය තුළ විහාරාධිපති, ගුරුවරයා, වෙද මහතා ඉතා සුවිශාල කාර්යභාරයක් ජනතා ප්‍රශ්න සම්බන්ධව ඉටු කළහ. එම නිසා එදා සමාජය තුළ එකිනෙකා අතර ආරවුල්, ගැටුම් සීමිත විය. වත්මන් සමාජය තුළ නීතිඥයන්, මනෝ වෛද්‍යවරුන්, මනෝ උපදේශකයින්, අධ්‍යාපනඥයින්, ආගමික නායකයින්, පොලීසිය යන ක්ෂේත්‍ර වලින් සැදුම් ලත් බුද්ධි මණ්ඩලයක් තුළින් අධ්‍යාපන සංස්ථාව ආලෝකමත් විය යුතුය.

එපමණක් නොව සමාජ විද්‍යාඥයින් ද මෙම කර්තව්‍යය සඳහා උරදිය යුතුය. එවන් ක්ෂේත්‍ර වලින් සමන්විත වන උපදේශන ක්‍රියාවලියක් මෙරට සමාජමය වශයෙන් මෙන් ම අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ද ක්‍රියාත්මක වන්නට පියවර ගත යුතුය. දේශපාලනීකරණයෙන් තොරව මෙම උත්තුංග ක්‍රියාවලිය මල් ඵල ගැන්වීමට කාලය එළැඹ ඇත. ඒ හෙට නොව අදය.

**මලින්ත බෝපෙආරච්චි**
දලුගම, කැලණිය

# විවාහයේ දී කිතුනු වගකීම් ඉටු කරමු

**පවුල් පරිසර දෙකක හැදෙන වැඩෙන තරුණයකු හා තරුණියක දරුඵල ලැබීමේ අරමුණින් ඇති කර ගන්නා ගිවිසුම විවාහය ලෙසින් හැඳින්වීම සාමාන්‍ය සමාජයේදී සිදු වන්නේ ය. නමුත් කතෝලික විවාහය හෙවත් ආශිර්වාදකාර බන්ධනය යනු එපමණක් පමණක් ම නොවේ. කිතුනු විවාහය යනු පවුලක් ගොඩනැඟීමේ අරමුණින් යුතුව දුක සැප දෙකේ දීම එක්ව සිටින්නටත් ලැබෙන දරුවන් දෙවියන් තුළ රැකබලා ගන්නටත් මරණය දක්වා එක්ව විසීමටත් දෙවියන් ඉදිරියේ ලබා දෙන පොරොන්දුවකි. විශේෂයෙන් ම විවාහයෙන් පසු කතෝලික දහමට අනුව ස්වාමිපුරුෂයා හා බිරිඳ නොව එක් අයකු බවට පත්වන්නාවූ ශුද්ධ බන්ධනයකි.**

දෙවියන් වහන්සේ විසින් ලෝකාරම්භයේ දී ම ස්ථාපනය කර ක්‍රිස්තුන් වහන්සේ විසින් ප්‍රසාද නිධානයක් බවට පත් කළ අතිශුද්ධ වූ ආශිර්වාදකාර බන්ධනය අද වන විට හෑල්ලුවට ලක්වන ආකාරයේ කටයුතු සිදුවීම අභාග්‍ය සම්පන්න තත්ත්වයකි.

නැකත්, පොරොන්දම්, කේන්දර ආදි කරුණු මත පිහිටා ඊට අදාළ වන දින වකවානු තෝරා ගනිමින් විවාහයන් සිදුකරන සුළුතරයක් කතෝලිකයන් සිටීම තුළ කිතුනු ශුද්ධ විවාහයට අර්ථාන්විතවත් ප්‍රායෝගිකවත් සිදුවනුයේ නිගරුවකි. අපකීර්තියකි. එපමණක් ද නොවේ. විවාහ මංගල්‍යය දිව්‍ය පූජාවට මනාලියගේ අඩ නිරුවත් ඇඳුමද අන්‍යෝන්‍ය ප්‍රේමයේ උත්කර්ෂවත් අවස්ථාවට නැතිනම් ආශිර්වාදකාර බන්ධනය ප්‍රසාද නිධානයට තවත් පසකින් කරන්නාවූ අඩු සැලකිල්ලකි. මේ සියල්ලටමත් වඩා මෑතක සිට ඇති භයානකම ප්‍රශ්නය වනුයේ විවාහ මංගල්‍යය දිව්‍ය පූජාවට පෙර නව යුවළ ඡායාරූප ගැනීමේ චාරිත්‍රයයි. මේ හේතූන් නිසා වර්තමාන විවාහකයින් නොයෙක් ආකාරයේ විපර්යාස ගැටලු රැසකට



මුහුණදීම කණගාටුදායක සෝචනීය තත්ත්වයකි. ඒ අතර දික්කසාදය, ගබ්සාව හා දරුඵල නොලැබීම යනාදී ප්‍රධාන හා මූලික ගැටලු ද දැකගත හැකිය.

ඒ තුළ උතුම් විවාහයේ සුන්දරත්වය අත්විඳිමින් අනාගත පරපුර වෙනුවෙන් වගකීම් යුතුකම් දේව කැඳවීම තුළ ඉෂ්ට කරන්නට නොහැකි වේදැයි යන සැකය ද මතු වන්නේ ය. මේ හෙයින් කතෝලිකයන් මීට වඩා ආශිර්වාදකාර බන්ධනය සක්‍රමේන්තුව තුළ පවත්නාවූ ශුද්ධවූ තත්ත්වය ආරක්ෂා කිරීමට කැපවිය යුත්තේය. විශේෂයෙන් සභාවේ නීතිරීති වලට අනුව යමින් ඒවා රැකගනිමින් කටයුතු කරන්නේ නම් විවාහ ජීවිතයත් අනාගත පරපුරත් සමාජයේ සාර්ථක වන්නට හේතුවනවා නොඅනුමානය.

**ජයන්ත පළිහවඩන**

# දරුවන් ගැන මීට වඩා අවධානයක් යොමු කළ යුතුයි

**තිලකාගේ මව ගුරුවරියකි. පියා රජයේ සේවකයෙකි. දරුවන් හතර දෙනෙක්ගේ පවුලේ බාල එකම ගැනු ළමයා තිලකාය. ඒ නිසාම ඇය කුඩාකල සිටම හැදුනේ වැඩුනේ කගේත් ආදරය හා හුරතලය තුළය. කුඩා කල සිටම අම්මා ඉගැන්වූ පාසලේ අකුරු කරවූ ඇය උසස් පෙළ දක්වා ඉගෙන ගත්තේ අම්මා ඉගැන්වූ පාසල්වලමය. හැමදාම උදේ පාන්දරින් සූදානම් වී අම්මා සමඟ පාසල් යන ඇය අම්මා සමගම ගෙදර පැමිණීම මතක ඇති කාලයේ සිටම සිදුවූවකි.**

පල්ලියේ දහම් පාසලේ ගුරුවරියකවූ අම්මා සමග තිලකා දහම් පාසල් යැමද සිදුවිය. පාසල ඇරී ගෙදර ආ විගස වෙනත් ළමුන් ගමේ දරුවන් සමග සෙල්ලම් කරද්දී තිලකා අම්මා විසින් පවරන ලද ඉගෙනීමේ කටයුතුවල නිරතවූවාය. ඉඳහිට පවුලේ සියලු දෙනා එක්වී පල්ලියක මංගල්‍යයකට සහභාගිවූවා මිස, වෙනත් අමතර ගමනක් බිමනක් යැම ඒ පවුලේ පුරුද්දක් නොවීය. ගමේ කාගේත් ගරු සැලකිලිවලට පාත්‍රවූ තිලකාගේ පියා සහ මව ඔවුන්ගේ සමාජ තත්ත්වය රැකගැනීමට දැරූ උත්සාහය නිසාදෝ ගම්වැසියන් හෝ වෙනත් අසල්වැසියන්, ඥාතින් සමග අමනාපයක් නොතිබුණද වැඩි ආශ්‍රයක් නොවීය. තිලකාගේ වැඩිමල් අයියා කොළඹ කන්තෝරුවක රැකියාව කරමින් සිටියදී ඇතිවූ ප්‍රේම සබඳතාවක් මත බෞද්ධ කාන්තාවක හා විවාහ වී සිටින්නේය. විශේෂයෙන්ම තිලකාගේ අම්මා මෙම විවාහයට තදින්ම විරුද්ධ වූ නිසා ඔවුන්ට මහ ගෙදරට ඒම සපුරා තහනම්ය. ඔවුන් දෙදෙනාට දැන් පුංචි පුතකු සිටියත් ගෙදර තාත්තා හැර කිසිවකු එම දරුවා දැක නැත. අම්මාට හොරෙන් ඉඳහිට තාත්තා ලොකු පුතාගේ නිවෙසට ගොස් එහි විස්තර පසුව ගෙදරදී කෙරෙන සාකච්ඡා හැමදාම අවසන්වන්නේ අම්මාගෙන් තාත්තාට ලැබෙන ප්‍රබල වාග් ප්‍රහාරයකින් පසුවය. තාත්තාගේ දැඩි නිහඬතාවය සුරකීමේ ප්‍රතිපත්තිය නිසා ප්‍රශ්න වැඩිදුරදිග නොයා එතැනින්ම ලොප් වී යයි.

තිලකාගේ දෙවෙනි අයියා සාමාන්‍ය පෙළ දක්වා ඉගෙන ගත්තත්, ඔහු දැන් සංගීත කණ්ඩායමක ස්ථිර සාමාජිකයෙකි. කනේ කරාබුවක් පැළඳ, දෙවුරේම පච්ච කොටා, කොන්ඩය දිගට වවා සිටින ඔහු කවුරුත් කටින් නොකිව්වත් හැමෝම හිතාගෙන ඉන්නේ රස්තියාදුකාරයෙක් ලෙසය. ඔහු ඉඳහිට ගෙදර ආ විට හිසේ සිට දෙපතුල දක්වා හැම දේකටම අම්මාගේ විවේචනයට ලක්වූවත්, ඔහුගේම ගෙදර ඔහුට බෝඩිමක් පමණක් නිසා, ඔහු ඒ කිසි දෙයක් ගණන් ගන්නේ නැත. ගෙදරින් යැපෙන්නේවත්, ගෙදරට කිසි උදව්වක්වත් නොදෙන ඔහු ගැන දැන් කවුරුත් සොයා බලන්නේවත් නැත.

තිලකාගේ තුන්වෙනි අයියා නම් මහන්සිවී පාඩම් කර උසස් පෙළ හොඳින් සමත්වී දැන් විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයෙකි. ඉතා නිහතමානි චාම් ජීවිතයකට හුරුවී ඇති ඔහුගේ එකම ජීවිත ඉලක්කය උපාධිය සමත්වී පශ්චාත් උපාධි පරීක්ෂණයකට පෙනී සිටීමය. දැඩි වාමාංශික දේශපාලන මත දරණ ඔහු වැඩිකාලයක් ගතකරන්නේ යහළුවන්ගේ නිවෙස්වලය. බොහෝවිට රාත්‍රියේ යහළුවන් සමග පාඩම් කර ගෙදර එන්නේද නැත. ගෙදර ආවත් මේසයේ කෑම ඇර ඇත්නම් සංසුන්ව කෑම කයි, නැතිනම් කාමරයට වැද දොර වසාග නියි. ඉඳහිට හෝ වචනයක් කථාකරන්නේ තිලකා හා සමග පමණි. ඇය කුමක් හෝ විහිළුවක් කර ඔහු සමග කථාබහ ආරම්භ කරන්නට උත්සාහ කළත් ඔහු සිනහවී පැත්තකට යයි. තමන්ගේ ඉගෙනීමේ කටයුතු සඳහා වුවද ගෙදරින් සතයක්වත් ඔහු කිසිදා ඉල්ලා සිටින්නේ නැත. තමන්ගේ වියහියදම් කෙසේ පියවා ගන්නවාදැයි කිසිවකු දන්නේ ද නැත. අම්මාට නම් තමාගේ තුන්වෙනි පුතාට වඩා ලොකු මිනිහෙක් නැත. හැම දේකටම උදාහරණයට ගන්නේ ඔහුවය. නමුත් මේ පුතා අම්මා සමග සතියකට වචන දෙක තුනකට වඩා කථා කරන්නේවත්, කිසිමදාක අම්මාගේ හොඳක් නරකක් ගැන කිසිවකු සමග හෝ කියනවා කාටවත් ඇසී නැත. ගෙදරදී හෝ මගතොටේදී තාත්තා සමග මුහුණට මුහුණලා හමුවූවත් දෙදෙනා අතර කිසිදා වචන හුවමාරුවක් නැත.

ගමේ සමාජ සේවා කටයුතුවලට සහභාගි වෙන තිලකාගේ අම්මා, සමිති සමාගම් කිහිපයකට නිලතල දරන්නීය. මේ වැඩකටයුතුවලදී අද නිතරම තම දරුවන් හතර දෙනා ගැන පුරසාරම් දොඩන්නේ තමා මෙවැනි ගුණ යහපත් කම් ඇති දරුවන් බිහිකළ. තම යුතුකම් නිසි ලෙස ඉටුකළ කාන්තාවක් බව පෙන්වා දෙන්නටය. නමුත් ගෙදර තත්ත්වය ඊට වඩා හාත්පසින්ම වෙනස් බව, ගෙදර අය නොව, පිට අයත් හොඳාකාරව දනිති. නමුත් ඉස්කෝලෙ හාමිනේට කිසිවකු මූණට යමක් නොකියන්නේ ගුරු භක්තිය නිසා විය හැක.



**ගරු ප්‍රැන්සිස් නිකලස් සේනානායක පියතුමා**

මේ අතරතුර උසස් පෙළ සමත්වී ගෙදර සිටින තිලකා රැකියාවන් කිහිපයක් සඳහා ඉල්ලුම් පත් දමා සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබුවත් ගුරු වෘත්තිය හැර වෙනත් කිසිම රැකියාවක් කිරීමට ඉඩ නොදීමේ අම්මාගේ තීරණය නිසා ඒ සියලු බලාපොරොත්තු අත්හැර දැමීමට ඇයට සිදුවිය. අවසානයේදී ඇයව ජාත්‍යන්තර පාසලක කාර්යාලයේ ලිපිකාරිණියක ලෙස තෝරාගනු ලැබින. අම්මා එයටද තදින්ම විරුද්ධ වුවත්, පසුව තිලකාගේ ඇවිටිල්ල නිසා ඇයට එම පත්වීම භාරගැනීමේ අවසරය ලැබිණ. අම්මා ගම පුරාම කියා සිටියේ ඇය ජාත්‍යන්තර පාසලේ ගුරුවරියක බවය. ඇය රැකියාවට යැමට පටන් ගැනීමත් සමඟ, මින් පෙර කිසිදා නොදුටු ලෝකයක් ඇය ඉදිරියේ දිස්වන්නට විය. අවට සමාජයේ නිදහස, විවිධ මිනිසුන්ගේ හැසිරීම්, කැපිලි කෙටිලි, මෙකී නොකී බොහෝ දේවල් ඇයට අලුත් අත්දැකීම් පමණක් නොව, ඒවාට හැඩ ගැසීම තරමක් දුරට පීඩාකාරී අත්දැකීමක් විය. කාර්ය බහුල බවත්, එකිනෙකා පස්සට තල්ලු කරමින් ඉදිරියට යන්නට හදන සහෝදර සේවක පිරිසත්, දෙමාපියන්ගේ හා ගුරුවරුන්ගේ බලපෑම් නිසාත්, හෙම්බත්ව සිටින තිලකාට, කාර්යාල කාර්ය සේවකයකු ලෙස ඈත ප්‍රදේශයකින් පැමිණි නාමල් මුණ ගැසෙන්නේ, මේ අමාරුවේ වැටී සිටින වෙලාවේ වචනයක් දෙකක්වත් කථා කර ගන්නට සිටින එකම විශ්වාසවන්ත පුද්ගලයා ලෙසිනි. ඔහු කා සමගත් වැඩියෙන් කථා බහා නොකරන, තමන්ගේ වැඩ රාජකාරි ගැන පමණක් අවධානය යොමු කරන, කඩවසම් තරුණයකු ලෙස කා අතරත් ජනප්‍රිය චරිතයකි. දිනකට වචනයක් දෙකක් හෝ නාමල් සමග කථා කිරීමෙන් තිලකා වින්දේ අසීමිත සතුටකි. “උඹ වැඩට ගියාට කමක් නැහැ, කාගේ හරි කරේ එහෙම එල්ලෙනව නෙමෙයි” මේ වැඩ ඉවරවී ගෙදර එන හැම දිනෙකම අම්මා විසින් වාදනය කරන ලද සුපුරුදු තේමා ගීතයයි. ඒ නිසා ප්‍රේම සම්බන්ධයක් ගැන සිතීමට තිලකාට කිසිම නිදහසක් නැත. නමුත් නාමල් හා කථාබහ, ඇසුර තුළින් තිලකාට දැනුනේ ජීවිතයේ කිසිදා අත්නොවිඳි සුන්දර අත්දැකීමකි. ඒ නිසාම දැන් දෙදෙනා නිතර කථා බහේ යෙදෙනවා පමණක් නොව පුද්ගලික දේ ගැනද නිතර සාකච්ඡා කරති. තම මවගේ අසනීප තත්ත්වය ගැන නිතර කථා කරන නාමල්ගේ මාසයේ පඩියෙන් භාගයක්ම වියදම් වන්නේ අම්මාගේ බෙහෙත්හේත් වලට බව කිවූ විට තිලකාට ඔහු ගැන ඇතිවෙන්නේ අනුකම්පාවක් පමණක් නොව යුතුකම් ඉටුකරන පුද්ගලයකු ගැන ඇතිවන ගෞරවාන්විත හැඟීමකි. ඒ නිසාම ඊළඟ මාසයේ පඩියෙන් සෑහෙන මුදලක් තිලකා නාමල් අත තැබුයේ තමන්ගේ අම්මාටම කරන යුතුකමක් ලෙසය. එම මුදල දුන්විට නාමල්ගේ මුහුණේ තිබූ ඒ කෘතඥතාපූර්වක බැල්මෙන්ම තිලකා තුළ ඔහු කෙරෙහි විශේෂිත හැඟීමක් ඇතිවන්නට විය. තව සති කිහිපයකින් ඔවුන් ප්‍රේමවන්තයින් විය.

ගෙදර දොර අගහිඟකම් ගැන කථා කරන හැමවිටකම කිසිම පැකිලීමක් නැතිව තිලකා නාමල්ට උදව් කළාය. ඇගේ බැංකු පොතේ තිබූ සියලුම ඉතිරිකිරීම් ටිකින් ටික හිස්විය. දැන් ඔවන්ගේ ඇසුරට වසර දෙකක් පිරෙන්නට ඇත්තේ තව සති කිහිපයක් පමණි. තිලකා ඔවුන්ගේ විවාහය ගැන කථා කරන හැම විටකම නාමල් මවගේ අසනීපය ගැන කථා කිරීම නිසා තිලකා නිහඬ වූවාය. දිනක් තිලකා තම වැඩපොළෙහි යෙහෙළියකගේ උපන් දින සාදයට සහභාගිවී ආපසු ගෙදර එන්නට බොහෝ ප්‍රමාදවූයේ ඔවුන් දෙදෙනා සවස්වරුව තානායමක ගත කළ නිසාවෙනි.

15 පිටුවට »

# පනින්න පෙර සිතා (නො) බැලීම හෙවත් ‘වැට පැනීම’

**මා කලකට පෙර සේවය කළ කොළඹ ප්‍රදේශයේ කාර්යාලයකට අලුතින් පත්ව ආ පිළිගැනීමේ නිලධාරිනිය සමඟ** සීමාව ඉක්මවා ගිය සබඳතාවයක් **පැවැත් වූ මගේ මිතුරෙක්, එතෙක් කල් සුන්දර කැදැල්ලක් මෙන් තිබුණු ඔහුගේ පවුල් දිවිය** විනාශ කරගත්තා පමණක් නොව **මල්කැකුලු දෙකක් වන් තම සුරතල් දරුවන් දෙදෙනාගේ අධ්‍යාපනය ද කඩාකප්පල් කර දැම්මා.**

මෑතකදි ඔහුව හමුවූ විට මට දැනගන්න ලැබුණේ, ඔහු නැවතත් සිය බිරිඳ හා දරුවන් සමඟ එක නිවසක වාසය කරන බවයි. ඉමහත් සතුටට පත්වූ මා, එදා මෙන්ම එම කැදැල්ලේ සතුට හා සාමය ඇතැයි යන බලාපොරොත්තුවෙන් එම නිවසට ගොඩවැදුන ද, දැක්කේ අපායේ ශාඛාවක් එහි පවත්වාගෙන යන ලෙසකුයි. බිරිඳ අපව පිළිග ැනීමට වත් නො ආ අතර, දරුවන්ද හැසුරුනේ ‘ඉන්නවාට මේ ලොව වැනෙනවා විනා.....’ ආකාරයටයි. කලකට පෙර එහි තුබූ සිරියාව පෑල දොරින් පැන ගොස් තිබුණා. මගේ මිතුරා ද ඉතා අපහසුතාවයට පත්ව මා දෙස බැලූ ආකාරයෙන්ම මා ඔහුගේ ජීවිතයේ වර්තමාන ස්වභාවය තේරුම් ගත්තා. කෑලි එකතු කොට අපහසුවෙන් පුරුද්දාගත් - කලෙක සුන්දරව තිබු මල් බඳුනක්, මගේ සිහියට නැගුනා.

මෙවැනි බේදවාචකයන් නිර්වචනය කරන්නේ කෙසේද? අසීමිත ආශා හෝ අතෘප්තිකර ජීවන රටාවන් හි අනිවාර්ය ප්‍රතිඵලයන් ලෙස ද? කෙසේ වෙතත් මෙවැනි සම්බන්ධතා පිළිබඳව ඔබටත් බොහෝ අත්දැකීම් ඇති. බොහෝ විට කාර්යාලවල දී හෝ මගතොටේ දී හමුවන විරුද්ධ ලිංගිකයන් සමඟ පළමුව ඇතිවන සුහදතාවය, පසුව බැඳීමක් බවට පත් වී, දෙදෙනා අතින්ම සීමාව පැනෙන්නේ ඉතා සැහැල්ලුවෙන් හා නොතිත් ආශාවකිනුයි. ලෝකයේ ස්වභාවය ‘විවිධත්වය’ නිසා, සෑම පුද්ගලයෙක් ම විවිධත්වයට ආශා කරනවා. මතක තබාගන්න, එය ‘ආශාවක්’. අසීමිත ආශාවන් සෑමවිටම අවසානයේ ශෝකය ගෙන දෙනවා. තමා විවාහ වී සිටින්නේ සහකරුවෙක් සමග නොව ‘භාණ්ඩයක්’ සමග නම්, අනිවාර්යෙන් ම එම භාණ්ඩය ටික කලක් පරිහරණය කරන විට එය එපා වෙනවා. වෙනත් ‘භාණ්ඩයකට’ හිත යනවා. එහෙත් සහකරුවෙක් හෝ සහකාරියක් සමග විවාහ වුන කිසිවෙකුටත් එලෙස එපා වීමක් වන්නේ නෑ. හේතුව ආදරය නම් මනෝභාවය තුළ බැඳෙන හදවත්, කාලය සමග තව තවත් ශක්තිමත් වෙන නිසයි.

තණකොළ බුදින ගොනෙක් ගැන සිතන්න. ඌ තම වත්තේ තණකොළ කමින් වැටට එහා ඉඩම දෙස බලනවිට පෙනෙන්නේ, ඒ පැත්තේ ඉතා සශ්‍රික ලෙස තණකොළ වැඩි ඇති ලෙසකට යි. හැමදාම උලාකන තණකොළවලට වඩා, රසවත් තණකොළ වැළඳීමේ ආශාවෙන් එහා පැත්තට පැනයන ගොනා සිහිගන්වමින් මෙවැනි සබඳතා ගැන සිංහල භාෂාවේ ඇති උපහාසාත්මක යෙදුම ‘වැට පැනීමයි’. මා දන්නා තවත් එවැනි ‘ගොනෙක්’ තම සුන්දර බිරිඳට හොරෙන් වඩා හොඳ තණකොළ සොයා වැට පැන ගොස්, පත්ව ඇත්තේ අනපේක්ෂිත තත්ත්වයකට යි. එම අනියම් බිරිඳට අට අනුවක් රෝග ඇති බව නොදැන, සබඳතාවක් ඇතිකරගත් ඔහුගේ වැටුප දැන් සම්පූර්ණයෙන් වැය වන්නේ ඇයගේ රෝහල් බිල් ගෙවීමට යි. මෙවැනි අවස්ථා, විටෙක හාස්‍යජනක ලෙස පෙනීගිය ද, අද දිනයේ බොහෝ විවාහකයන් ගේ කඳුලු වල දැවටී පවුල් උපදේශකයන් ඉදිරියේ කඩාහැලෙන්නේ මෙවැනි අනියම් සබඳතාවල බිහිසුණු ඛේදාන්තයන් බව පවසන්නේ ඉතා කනගාටුවෙන්.

මේ සම්බන්ධයෙන් අපට කළහැකි එකම පිළියම මේ පිළිබඳව විශ්ලේෂණය කිරීම හෝ සාමුහිකව ශෝකවීම නොව විසඳුම් ලබාදීම යි. එය කළහැක්කේ කෙසේ ද? එය කළ හැක්කේ යුගදිවියක සැබෑ මිහිර පිළිබඳ අවබෝධවත් බව ලබාදීමෙන් ම පමණයි. අනියම් සබඳතා ඇරඹෙන්නේ විශේෂයෙන් ලිංගික ආකර්ශනය මුල්කොටගත් හේතුන් මත බව පෙනීගිය කාරණයක්. අද සමාජයේ බොහෝ අය අතර ඇති ප්‍රධාන අඩුපාඩුවක් ලෙස ඇත්තේ යම් පියවරකට පසු ඇතිවන ‘ඊළඟ ප්‍රතිඵලය’ ගැන කල්පනා නොකිරීම යි. අධික වේගයෙන් ගොස් අනතුරු ඇති කරගන්නේත්, අසීමිත ලෙස කෑමට ගිජුවී අට අනුවක් රෝග ලංකර ගන්නේත්, සුලු ලිංගික තෘප්තියක් වෙනුවෙන් සදාතනික පවුල් දිවිය අවුල්කර ගන්නේත් මෙවැනි දුරදිග බැලීමේ පුරුද්දකින් තොරව හැදී වැඩි තිබීමේ පාපය නිසා නොවේද? කුඩා දරුවන්ට ‘චෙස්’ ක්‍රීඩාව ඉගැන්වීම ඉතා ප්‍රායෝගික බව සිතෙන්නේ, එලෙස ඉදිරියට ගතයුතු පියවර ගැන කලින් කල්පනා කර බැලීමේ පරිචයක් එවැනි බුද්ධිමය ක්‍රීඩා තුළින් ඇතිවන නිසයි.

ඒ වගේම විවාහක යුවළකින් එක් අයෙක් අනියම් සබඳතාවකට පැටලීම කෙරෙහි අනෙක් සහකරු වෙත පැවරෙන වගකීමද අපට බැහැර කළ නොහැකි සත්‍යයක්. ඔබේ සහකරු හෝ සහකාරිය කෙරෙහි ආදරය විසුරුවා හැරීමට ඔබ අසමත්වීම ද එවැනි අයථා සබඳතා කෙරෙහි සෘජු බලපෑමක් තිබෙන බව කීමට මට ඉඩ දෙන්න. තමාට පූර්ණව ආදරය කරන තම ඕනෑ එපාකම් ආදරයෙන් ඉටුකරන සැමියෙක් හෝ බිරිඳක් අමතක කර තුන්වෙනි පාර්ශවයක් කරා යාම, නිරෝගි මානසිකත්වයකින් යුතු බිරිඳකට හෝ සැමියකුට නම් කොහෙත්ම බැහැ. ආදරය විහිදුවීමේ අඩුපාඩුවක් තමා අතින් සිදුව ඇතිදැයි අවංකව කල්පනා කර බැලීම. මෙවැනි අවස්ථාවකදි ගතයුතු පළමු පියවර වෙනවා. ‘පළමුව ඔබ වෙනස් වෙන්න, එවිට ලෝකයම වෙනස් වෙනවා’ යන ප්‍රකාශය ඉතා ගැඹුරු හා ප්‍රබල ප්‍රකාශයක්. අපට වී ඇත්තේ අප වෙනස් වෙන්න හරිම අකමැති වීමයි. තම ජීවිතය සුන්දර වනු පිණිස, ලෝකය වෙනස්වන තුරු බලා සිටින එවැනි අසරණයින් අපට නිතරම හමුවෙනවා. එබැවින් පළමුව තමා නිවැරදි දැයි අවංකව තමා දෙස බලා තීරණය කරන්න.

අනියම් සබඳතා ඇරඹීමේ තවත් අවස්ථාවක් ලෙස අප දකින්නේ යුවළ තුළ සංවාදයක් නො තිබීමයි. සාමාන්‍යයෙන් බිරිඳකට දිනයක අවසානයේ දී තම සැමියාට කියන්න තිබෙන දේවල් බොහොම යි. සමහර විට පිරිමි අපට ඒවා එතරම් වැදගත් කාරණා ලෙස නො පෙනෙන්න පුලුවන්. ඒත් ගැහැනියකට ඉතා සුලු දෙයක් වුනත් ඉතා වැදගත්. එබැවින් ඇයට ඉවසීමෙන් සවන් දීමට සැමියා අපොහොසත් වීම ම, අනාගතයේ දී මහා ව්‍යසනයකට මුල්විය හැකි යි. ඇයගේ පීඩනය මුදාහැරීම සඳහා සැමියා සන්නිවේදනයෙන් ඈත්වන විට, ඇගේ කතාව අසා සිටීමට ඉදිරිපත් වන, “ඇයට උරහිසක් දෙන්න” පුල පුලා බලා සිටින බොහෝ පිරිමි අද සමාජයේ ඉන්නවා. එවැනි ‘දුක්ගන්නා රාළලා’ට මනසින්ද බැඳුනු පසු, එම පවුලේ සමගිය ගැන තව මොන කථාද? බොහෝ කාර්යාලවල හා මග තොටේදි එවැනි කපටියන්ට බිලිවී පවුල් අවුල් කරගන්නා අහිංසක කාන්තාවන් අප දැක තිබෙනවා. එබැවින් ගැහැනියකගේ රුචි අරුචිකම් හා චර්යාවන් පිළිබඳ අවබෝධවත් වීම වඩා වැදගත් බව සියලු ස්වාමිපුරුෂයන් වෙත අවවාදාත්මකව කියන්න කැමතියි.

‘ඔබ’ යනු, ‘ඔබේ සිතිවිලි වල ප්‍රක්ෂේපණයක්ම’ මිස වෙන කුමක්වත් නොවේ. එනම් ඔබ තුළ මෝක්ෂ රාජ්‍යය හෝ නරකාදිය නිර්මාණය කරගන්නේද ඔබමයි. එබැවින් අප සියල්ලන්ගේ ම එකම පැතුම වන ‘ප්‍රීතිමත් යුගදිවියක්’ යන ලෞකික මෝක්ෂ රාජ්‍යයේ ආනන්දය විඳ ගැනීමට කැමති සියලු විවාහකයන්ට අප දෙන පණිවුඩය මෙයයි. ආශාවන් පසුපස ගොස්, ‘වැට පනින අඥාණ වෘෂභයෙක්’ නොවී, සැබෑ ආදරබර සැමියෙක් - බිරිඳක් හෝ මවක් - පියෙක් වන්න. එයින් ඔබේත් ඔබේ සහකරුගේත් පමණක් නොව, ලෝකය ලස්සන කරන්න දෙවිඳුන් ඔබ දෙදෙනා තුළින් එවා ඇති සුන්දර මල් කැකුලු වන් දරුවන්ගේ ජීවිත වලටත් ‘සැබෑ කතෝලික පවුලක’ ඇති සංහිඳියාව අත්දකින්න ඉඩ දෙන්න. එවිට අපේ ලෝකය වඩ වඩාත් ලස්සන වේවි.

අගරදගුරු පවුල් සේවාවේ
**ප්‍රීති ජයසූරිය**

දසත ආලෝකය විහිදමින්
ප්‍රදීපය
දැල්වෙන පහන්

# ගිහි දහම් දූත සේවක ඩබ්ලිව්. එම්. ප්‍රනාන්දු

**ජා-ඇල කණුවන පදිංචි ඩබ්ලිව්. එම්. ප්‍රනාන්දු මහතා වසර 60 කට වැඩි කලක් විවිධ ක්ෂේත්‍ර තුළින් ගිහි දහම් දූත සේවාවෙහි නිතර වූවෙකි. පහත දැක්වෙන්නේ ඒ මහතාගේ සේවාව සහ විශේෂ ජීවන තොරතුරු පිළිබඳ කෙටි සටහනකි.**

### මරියතුමියගේ හමුදාවේ සේවාව

1950 වසරේදී බෝලවලාන ගුරු විදුහලේදී මරියතුමියගේ හමුදාවේ ක්‍රියාකාරී සාමාජිකයකු වු ප්‍රනාන්දු මහතා පසුව පානදුර මීසමේ වික්ෂෝප දේවමාතා වහන්සේගේ ප්‍රීසිඩියමේ සාමාජිකයෙක් සහ නිලධාරියෙක්ද කණිෂ්ට ප්‍රීසීඩියමේ සභාපතිද විය. මොරටු ක්‍යුරියාව ඇරඹුනු විට එහි ප්‍රථම ලේකම් වූ හේ පසුව එහි සභාපති ද විය. අගරදගුරු පදවිය තුළ පමණක් නොව හිගුරක්ගොඩ, පොළොන්නරුව ආදී ඈත ප්‍රදේශවලද මරියතුමියගේ හමුදාව පතුරුවා හැරීමට දායක වූ හේ මුල් කාලයේදී ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වී තිබූ එම හමුදාවේ අත්පොත සිංහල භාෂාවට පරිවර්තනය කිරීමෙහි ද දායක විය. තමාගේ ගිහි දහම්දූත සේවාවට තෝතැන්න වූයේ මරියතුමියගේ හමුදාව බව ප්‍රනාන්දු මහතා පවසයි.

### කතෝලික අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි සේවාව

1994 වසරේදි ප්‍රනාන්දු මහතා අගරදගුරු පදවි අධ්‍යාපන කාර්යාලයේ වගකිව යුතු නිලධාරියකු වශයෙන් පත් විය. කාර්යාලයේ වැදගත් ලිපි සැකැසීමට අමතරව අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි කතෝලිකයන්ගේ ඇතැම් නීත්‍යනුකූල අයිතිවාසිකම් දිනා ගැනීම සහ රැක ගැනීම පිළිබඳ කටයුතු ද ඔහුට පැවරුනි. රජයට පවරා ගන්නා විට පාසලේ තිබූ ආගමික සිසු අනුපාතය අනුව පාසල්වලට සිසුන් ඇතුළු කරවීමට ඇති අයිතිය රැක ගැනීම සඳහා ද, එම අයිතිය කතෝලික දරුවනට භුක්ති විඳීමේ අවස්ථා ලබාදීම සඳහා ද, රජයේ පාසල්වල කතෝලික දරුවනට පාසලේදී කතෝලික ධර්මය ඉගෙනීමේ සහ කතෝලික වත් පිළිවෙත් වලට සහභාගි වීමේ අයිතිය ආරක්ෂා කර දීම සඳහා ද ඔහුගෙන් සිදුවූ සේවාව ප්‍රශංසනීයය. වසා දැමීම නිසා කතෝලික සභාවට ආපසු භාරදිය යුතුව තිබූ පාසල් සැලකිය යුතු සංඛ්‍යාවක් එසේ භාර නොදී තිබියදී ඒවා කතෝලික සභාවට ආපසු ලබාගැනීම සඳහාද, රජයට පවරා ගැණුනු කතෝලික පාසල් වල භූමියෙන් ලැබෙන නිත්‍ය ඵලදාව කතෝලික සභාවට ලබාගැනීමේ අයිතිය රැකදීම සඳහාද ඔහුගේ ක්‍රියාකරී දායකත්වය ලැබිණි. කතෝලික පාසල්වල අයිතිකරු වශයෙන් අගරදගුරු හිමිපාණන්ටද, කතෝලික පෞද්ගලික පාඨශාලා සාමාන්‍යාධිකාරි පිතුමනටද අදාලව පැවරුණු නඩුවලදී, එම කාර්යාලයේ පාලක පියතුමන්ගේ උපදෙස් අනුව අවශ්‍ය කටයුතු කරන ලද්දේ ප්‍රනාන්දු මහතා විසිනි. හේ අගරදගුරු පදවි අධ්‍යාපන කොමිෂන් සභාවේද, බයිබලය, ධර්මෝපදේශය සහ අධ්‍යාපනය පිළිබඳ ජාතික කොමිෂන් සභාවේද අධ්‍යාපන අමාත්‍යංශයේ කතෝලික උපදේශක කමිටුවේද සාමාජිකයෙකි. ඇක්වයිනස් විශ්ව විද්‍යාල ආයතනයේ කතෝලික අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවට සම්බන්ධ කථිකාචාර්ය වරයකු වශයෙන් ද හේ සේවාවේ යෙදී සිටියි. කතෝලික අධ්‍යාපනය සම්බන්ධයෙන් කරන ලද දිගුකාලීන සේවාව ඇගැයීම සඳහා අගරදගුරු පදවි කතෝලික කොමිෂන් සභාව විසින් ඒ මහතාට පිරිනැමුණු ක්‍රිස්ටෝපර් බොන්ජීන් විශිෂ්ට අධ්‍යාපන සේවා සම්මානය පිළිගන්වන ලද්දේ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසිනි.



### ජනප්‍රිය කථිකයකු සහ කෘතහස්ත ලේඛකයකු වශයෙන් සේවාව

ජනප්‍රිය කථිකයකු වු ප්‍රනාන්දු මහතාට විවිධ කතෝලික සංවිධාන වලින් දේශන පැවැත්වීම සඳහා ආරාධනා ලැබේ. තමාගේ විශේෂ දේශනයක් හැටියට ඒ මහතා සලකන්නේ 2007 වසරේදී අම්පිටියේ ජාතික දෙව්සත්හලේ 4 වැනි වසරේ ගරු සහෝදරවරුනට 'කතෝලික දරුවන්ගේ අධ්‍යාපන ගැටලු' යන මැයෙන් කළ දේශනයයි. 1968 වසරේදී ඔහු විසින් පල කැරුණු 'සිංහල ලඝු ලේඛණ ගුරුවරයා' නමැති පොත අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය විසින් පුස්තකාල පොතක් වශයෙන් අනුමත කරන ලදි. 1970 වසරේදී, තමා උගත් ලඝු ලේඛණ ක්‍රමය ඇතුලත් පොත සංශෝධනය කර පලකළ 'පෙරේරාගේ කෙටිකුරු හෙවත් නවීන සිංහල ලඝු ලේඛණ කලාව' නමැති පොත උක්ත මණ්ඩලය විසින් පාසල් පෙළ පොතක් වශයෙන් අනුමත කරන ලදුව එම විෂය ඉගැන්වීම සඳහා පාසල් වල භාවිත විය. My Daily Bread නමැති ග්‍රන්ථය සිංහල භාෂාවට පරිවර්තනය කර ඔහු විසින් පල කැරුණු 'සමිඳුනට සවන් දෙමු' ග්‍රන්ථය අතිශයින් ජනප්‍රිය වීම නිසා පළමු වැනි මුද්‍රණයට දෙවසරක් පිරෙන්නටත් පෙර තෙවැනි මුද්‍රණයද නිකුත් විය. පහත පළවන්නේ එම පොත පිළිබඳව අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඇගැයීමයි. My Daily Bread ග්‍රන්ථය සිංහල භාෂාවට පරිවර්තනය කර පළ කර ඇති 'සමිඳුනට සවන් දෙමු' ග්‍රන්ථය ක්‍රිස්තියානි විශ්වාසය ශක්තිමත් කර ආධ්‍යාත්මික පෝෂණය ලබා දෙන්නකි. මෙම පොත ගිහි පැවිදි හැම කතෝලිකයකුගේම පරිශීලනයට අතිශයින්ම යෝග්‍ය බව සතුටින් සඳහන් කරමි. 'කතෝලික අධ්‍යාපනය සහ පාසල් රජයට පවරා ගැනීම' යන මැයෙන් වන ප්‍රනාන්දු මහතාගේ ග්‍රන්ථය ශ්‍රී ලාංකික කතෝලික අධ්‍යාපනය පිළිබඳ ලිඛිත ඉතිහාසයේ මෙතෙක් පැවති බරපතළ අඩුපාඩුවක් මැනැවින් සපුරාලයි. උපකෘත පාඨශාලා පිළිබඳ ඉතිහාසයද, ඒ සඳහා කතෝලික සභාවේ මහඟු දායකත්වයද, කතෝලික සභාව පාසල් රජයට පවරා ගැනීමට විරුද්ධත්වය දැක්වීමේ නිරවද්‍යතාව, එසේ පවරා ගැනීම නිසා අධ්‍යාපනයට සිදුවී ඇති බරපතළ හානියෙන් පිළිබිඹු වන බවද එම පොතේ සවිස්තරව දැක්වේ.

### සිංගප්පූරුවේ සේවාව

වසරක පමණ කලක් සිංගප්පූරුවේ සිය දියණියගේ නිවසේ නැවතී සිටි ප්‍රනාන්දු මහතා එහි පදිංචි ශ්‍රී ලාංකික කතෝලිකයන්ගේ සහ ශ්‍රී ලාංකික ප්‍රභවයක් ඇති සිංගප්පූරු කතෝලිකයන්ගේද එකමුතු සංවිධානයක් ගොඩ නැගීමෙහි මූලික විය. ශ්‍රී ලාංකික ගරු කන්‍යා සහෝදරියක විසින් එහි පවත්වාගෙන ගිය ආගමික සහ සමාජ සේවා සංවිධානයකට සම්බන්ධ වූ ප්‍රනාන්දු මහතා විවිධ රටවලින් එහි පැමිණ සිටින ගෘහ සේවිකාවනට ඉරුදින වල ඉංග්‍රීසි යතුරු ලියනයද, ශ්‍රී ලාංකික කතෝලික ගෘහ සේවිකාවනට ආගමද ඉගැන්වීමෙහි නිරත විය.

### ලඝු ලේඛණ ක්ෂේත්‍රය තුළ සේවාව

ප්‍රනාන්දු මහතා සිංහල ලඝු ලේඛණය පිළිබඳව පුළුල් අවබෝධයක් මෙන්ම සුවිශේෂ දක්ෂතාවයක් ඇත්තෙකි. සිංහල ලඝු ලේඛණ ක්‍රමවල සාර්ථකත්වය පරීක්ෂා කිරීම සඳහා රාජ්‍ය භාෂා කොමසාරිස් තුමාගේ නායකත්වයෙන් පත් කැරුණු කාරක සභාවට, ඒ කාරක සභාව විසින් කළ යුතු නිර්දේශ තමා විසින්ම යෝජනා කිරීමට හේ නොපැකිලුනේය. ප්‍රනාන්දු මහතාගේ නිර්දේශ මුළු මනින්ම පිළිගත් එම කාරක සභාව, 1967 අංක 1 දරණ සැසි වාර්තාව වශයෙන් පල කැරුණු සිය වාර්තාවට එම කාරක සභාවේ නිර්දේශ වශයෙන් ඒවා ඇතුළු කර තිබීමෙන් එම විෂය පිළිබඳව ප්‍රනාන්දු මහතාගේ විශේෂඥතාව මැනවින් පිළිබිඹු වේ. මරදානේ ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ සිංහල ලඝු ලේඛණය පිළිබඳ බාහිර කථිකාචාර්ය වරයකු වශයෙන්ද, ඇක්වයිනස් විශ්ව විද්‍යාල ආයතනයේ ඉංග්‍රීසි ලඝු ලේඛණය පිළිබඳ බාහිර කථිකාචාර්යවරයකු වශයෙන්ද, පෞද්ගලිකවද, ප්‍රනාන්දු මහතාගෙන් ලඝු ලේඛණ යතුරු ලියන විෂයයන් හැදෑරූ සැලකිය යුතු සංඛ්‍යාවක් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙහිද, රජයේ විවිධ දෙපාර්තමේන්තුවල සහ විවිධ පෞද්ගලික ආයතනවලද එම අංශයේ රැකියා ලබාගැනීමට සමත්ව සිටිති. වැල්ලවත්තේ 'පොලිටෙක්නික්' ආයතනය විසින් 1954 දී පැවැත්වුණු සමස්ථ ලංකා සිංහල ලඝු ලේඛන ශූරතා තරගයේදී ප්‍රථම ස්ථානය දිනාගෙන රන් පදක්කම හිමිකරගන්නා ලද්දේ ප්‍රනාන්දු මහතා විසිනි. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් 1998 වසරේදී පැවැත්වුණු ලඝු ලේඛන වෘත්තියේ සමස්ත ලංකා තරග පරීක්ෂණයෙන් ප්‍රථම ස්ථානය දිනාගෙන ශූරතා රන් පදක්කම සහ මුදල් ත්‍යාග දිනා ගන්නා ලද්දේ ද ප්‍රනාන්දු මහතාගේ ශිෂ්‍යයකු විසිනි. තම සමාගම විසින් නිෂ්පාදනය කැරුණු සිංහල ඔලිම්පියා ටයිප් රයිටරයේ සාර්ථකත්වය ප්‍රදර්ශනය කිරිම සඳහා ඔෆිස් ඇල්පයන්ස් සමාගම විසින් 1962 වසරේදී පැවැත්වුණු තරගයේදී මුළු දිවයිනෙන්ම ප්‍රමුඛ ස්ථානය හිමිකරගෙන ජයග්‍රාහකයාට හිමි සිංහල ඔලිම්පියා යතුරු ලියනය හිමිකරගත්තේ ද ප්‍රනාන්දු මහතාගේ ශිෂ්‍යයෙකි.

### රැකියාව

වසර 5 ක් පුහුණු ගුරුවරයකු වශයෙන් සේවාවේ යෙදී සිටි ප්‍රනාන්දු මහතාගේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සේවා කාලය වසර 34 කි. පාර්ලිමේන්තු සේවාවෙන් විශ්‍රාම ගත් අවස්ථාවේ දී ඒ මහතාට සුබ පැතීම සඳහා පැවති උත්සවයේදී පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් ප්‍රනාන්දු මහතා තක්සේරු කරන ලද්දේ පහත දැක්වෙන අයුරිනි. ඩබ්ලිව්. එම්. ප්‍රනාන්දු මහතා අංග සම්පූර්ණ හැන්සාඩ් සංස්කාරකවරයෙකි. අංගසම්පූර්ණ මහත්මයෙකි. අංගසම්පූර්ණ කතෝලිකයෙකි.

### වත්මන් තොරතුරු

ජීවන මගෙහි 81 වැනි සැතපුම් කණුව පසුකර සිටින ප්‍රනාන්දු මහතාගේ පෑන තවමත් ක්‍රියාත්මක වෙයි. ඒ මහතාගේ ලේඛණ කටයුතු සියල්ලම පාහේ තමා විශ්වාස කරන ධර්මය පිළිබඳ ඒවාය. දෙව් සමිඳාණන්ගෙන් තමාට දායාද වී ඇති තලෙන්තු මැනවින් භාවිත කරමින් තව දුරටත් සේවාවෙහි යෙදෙන්නට ඒ දෙව්සමිඳානන්ගේම ආසිරි ප්‍රනාන්දු මහතාට බහුලව ලැබේවායි පතමු.

# ශු. ජුසේ මුනි දෙව්මැඳුර ගීයෙන් සැරැසු රණවීර ගුරු පියා

**පමුණුගම ශුද්ධවූ ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුරට යාබදව එකල පැවැති රජයේ රෝමානු කතෝලික පිරිමි** විදුහලය. වේලාව උදෑසන අටට **පමණය. ඉස්සර 'හෝඩියෙ පන්තිය' යැයි හැඳින්වූ පළමුවන ශ්‍රේණියේ සිසු දරු පිරිසක් පාසලේ සිට පේළියට දෙව්මැඳුරට ඇදෙති. ඉඳහිට ඔවුන් අතර 'කිචිබිචි' හඬයි.**

සුදෝසුදු ජාතික ඇඳුමෙන් සැරැසුණු උපැස් යුවළක් පැළඳගත් තරුණ ගුරු මහතෙක් මේ සිසු දරුවනට මග පෙන්වයි. ඔවුහු දෙව් මැඳුරට ඇතුළු වී යාච්ඤා කරති. අවසානයේ කෙටි ගීයක් ගායනා කරති.

ත්‍රිත්වේක දේව තුතිවෙ
සන් ජුසේ පියාණනේ
මේ බාල ළදරු අපට
දේව පිහිට ඉල්ලා දෙනු මැනේ.

මේ සිසු දරුවන් අතර මම ද වීමි. අපට මඟපෙන්වූ ගුරු මහතා වෙන කවරකුත් නොව කැපුන්ගොඩ ඩී. ජේ. රණවීර මහතා ය. මේ කියු ලුහුඬු ගීය එතුමාගේ නිර්මාණයකි. වසර සතලිස් ගණනකට පසුව වුවද මට ඒ ගීය තවම මතකයි. හෝඩිය පන්තියද රණවීර ගුරු දෙවිඳු ඇසුරේ ලැබූ සිප් සතර ද මාගේ මතක සිනමා පටයේ තවමත් රැඳී තිබේ. රණවීර ඉස්කෝල මහතාත් පාසලත් හෝඩියේ පන්තියත් කෙතරම් ප්‍රිය ජනක තැනක් නොවේද යන්නට ඒ සමය අපගේ මතකයේ මෙතරම් තදින් පිහිටා තිබීම සාක්ෂ්‍යයක් නොවන්නේද?

මහා විද්‍යාඥ ඇල්බට් අයින්ස්ටයින් ගුරුවරයා ගැන මෙසේ කීවේය. "ගුරුවරයාගේ උත්තරීතර කලාව වු කලී නිර්මාණශීලි ප්‍රකාශනයේ හා දැනුමේ ආනන්දය අවදිකරලීමයි."

ජෝන් ස්ටීන්බලික් කීවේ "විශිෂ්ට ගුරුවරයා විශිෂ්ට කලාවකි. ඔහුගේ මාධ්‍යය මානව මනස හා හදවතය" කියායි. රණවීර ගුරුතුමා තුළ මේ කියමන් කෙතරම් සත්‍ය වී තිබේදැයි මතක මං පෙතේ ආපසු ගමන් කරන විට පසක් වේ.

ඉස්සර හෝඩිය පන්තියට යන බාලයන්ගෙන් සමහරෙක් මුල් දිනවල 'හොරෙන් පැන' ගියහ. මම ද එවැන්නෙක් වීමි. මා ගෙදර ගිය විට අපේ ආච්චි අම්මා යළිත් මා කැටුව පාසලට පැමිණ රණවීර ඉස්කෝලෙ මහත්තයාට මා බාර දෙන්නීය. එවිට එතුමා 'මොකද පැනල ගියෙ.....?' කියා මට කඩා පැන්නාද? වේවැල් කසායෙන් සංග්‍රහ කළ ද? ඊට හාත්පසින්ම වෙනස් ආකාරයට එතුමා තමාගේ පුංචි හාර්මෝනියම් එක (සර්පිනාව) ගෙන ඒ වටා පුංචි අප රොක්කර ගත්තේ ය. එකින් එක ගීත ගායනා කළේය. පන්තිය සිනහවෙන්, කිචිබිචියෙන්, රසයෙන්, ආනන්දයෙන් පිරී ගියේය. උගන්වන්නට වෙලාව පැමිණි බව එතුමා තේරුම් ගන්නේය. 'අ' යනු 'ආ' යනු වලින් පටන් ගෙන, අප්‍රිකාවේ පිග්මිවරුන් ගැන, ඇලස්කාවේ එස්කිමෝවරුන් ගැන කතා ගලා එන්නේය. ඒ අධ්‍යාපනික තොරතුරු ඇතුළත් සිතුවම්වලින් හෝඩිය පන්තියේ බිත්ති පිරී තිබෙනු තවම මතකය. ඒ ඇතැම් රූ සටහන්ද එලෙසින්ම මතක පරිගණකයේ ඇඳී තිබේ.

ඩී. ජේ. රණවීර ගුරුතුමා සංගීතඥයෙක් ද නාට්‍යකරුවෙක් ද වූයේය. එකල පමුණුගම නාඩගම් කලාවට පසිඳුව තිබුණේය. එතුමා කැකිල්ලේ නඩු තීන්දුවක් ඇසුරින් කෙටි නාඩගමක් රචනා කළේය. අප සිසුන් කණ්ඩායමක් තෝරාගෙන එකල පාසලේ ඉංග්‍රීසි ඉගැන්වූ ඇන්ටන් ගුරු මහතාද සමඟ නාඩගම පුහුණු කළේය.

මෙම නාඩගම වත්තල මණ්ඩලයේ සාහිත්‍ය තරගමාලාවට ඉදිරිපත් කෙරුනු අතර එයින් ප්‍රථම ස්ථානය දිනාගත්තේය. ගම්පහ දිස්ත්‍රික් තරගයට නාට්‍යය ගෙනයාමට පෙර රණවීර මහතා වඩාත් කැපවීමෙන් අප පුහුණු කළේය.



'ගෙරවිල්ල' නම් ආකර්ෂණීය නමක් ද ඊට දෙනු ලැබිණ. යක්කල චන්ද්‍රජෝති විද්‍යාලයේ පැවැති එම තරගයෙන් ද ජයගෙන සමස්ත ලංකා තරගයට සහභාගි වීමට නාට්‍යය සුදුසුකම් ලද ද, තැපෑලේ ප්‍රමාදයක් හේතුවෙන් එම වාසනාව අපෙන් ගිලිහි ගියේය.

රණවීර මහතා වැනි පුංචි, නිහතමානී මිනිසකුට මෙතරම් වික්‍රමයක් කළ හැකි වූයේ කෙසේදැයි මම අදත් කල්පනා කරමි. කැපුන්ගොඩ පදිංචිය තිබුණත් රණවීර මහතාගේ බැඳීම තිබුණේ පමුණුගම ශුද්ධවූ ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුර සමගය. මා දන්නා කාලයේ සිට ජුසේ මුනි දෙව්මැඳුරේ ගායනා කණ්ඩායම පුහුණු කළේ ඔහුය. එහි ගැයෙන විවිධ ගී අතර රණවීර මහතාම රචනා කර තනු නිර්මාණය කළ ගීතිකා රැසක් ද වූයේය. වෙසෙසින් ම විවාහ මංගල දිව්‍ය පූජාවේදී ගායනා කෙරෙන පමුණුගමට සීමා වු ජනවන්දනාවට ද අනුකූල කන්කළු ගී රැසක් එකල ගායනා කෙරිණි.

ගායනා කණ්ඩායම පුහුණු කිරීම සඳහාද විවිධ දේව මෙහෙයන් සඳහා ද තම බයිසිකලය පැද ගෙන කැපුන්ගොඩ සිට පමුණුගමට එතුමා ආවේය. නුවාන දින රාත්‍රිවල ද විවිධ මංගල දිනවලදීද ඔහු මෙම සේවාව කළේ මහත් කැපවීමෙනි. සඟසැපත් අබා කොස්තා පියතුමා පමුණුගම මීසම් සභා පිය සමයේ සැමරුණු විවිධ ජයන්ති උලෙළ වෙනුවෙන් රණවීර මහතා වෙහෙසවී කටයුතු කළ අයුරු අපට අදත් මතකය.

නවසිය හැත්තෑ ගණන්වල බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩු සමයේ සිදුකෙරුනු අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් පසුව හයවැනි ශ්‍රේණිය සඳහා ගොන්සාල්වේස් මහා විද්‍යාලයට යාමට අපට සිදුවිය. ටික කලෙකින් රණවීර මහතා ද එහි ගුරුවරයකු ලෙස පත්ව ආයේය. පුංචි කාලයේ අපට 'අ' යනු කියාදුන් ඔහු සත්වැනි ශ්‍රේණියේදී සමාජ අධ්‍යයනය ඉගැන්වීය. ඊජිප්තු, මෙසෙපොතේමියානු, ඉන්දුනිම්න ශිෂ්ටාචාර ගැනද, අප ගම හා අවට පරිසරය ගැනද ඔහු විදුහුරු ලෙස අපට ඉගැන්වීය.

ගොන්සාල්වෙස් මහ විද්‍යාලයෙන් සමුගත් පසු පමුණුගම පැමිණි සැමවිටම මම ඔහු මුණගැසුනෙමි. වෙසෙසින්ම නව ගීතිකා ගැන ද මගේ අලුත් ජීවිතය ගැන ද ජුසේ මුනි දෙව්මැඳුරු වැරැණ්ඩාවේ මුණ ගැසුණු අපි කතා බස් කළෙමු.

දේවභක්තියෙන් පිරුනු මිනිසකු වු ඩී. ජේ. රණවීර මහතා බලය, ගෞරවය. පදවි, තනතුරු හඹාගිය පුද්ගලයෙක් නොවීය. තමාට පැවරුණු වගකීම කුමක් වුවද නිහතමානිව එය කැපවීමෙන් ඉටුකළ කෙනෙක් විය. ඔහුගෙන් උගත් සිසුකැල ඊට සාක්ෂි දරණු ඇත.

අපේ කටට හුරු පුරුදු ලෙස 'රණවීර ඉස්කෝලෙ මහත්තයා' ගැන මගේ මතකයේ රැඳුණු කරුණු රැසකින් සමහරකි ඒ. සේවය පමණක්ම මිස තාන්න මාන්න නොසෙවු ඒ සඳහා තරග නොකළ ඒ නිහතමානි මිනිසාගේ ජීවිතය, ගරු මෝසැසි පෙරේරා පියනම විසින් රචිත මේ ගී පද කිහිපයෙන් සාරාංශ කළ හැකියැයි මට සිතේ.

"නිවාඩුවක් නොසොයා - සැප පහසුව දුරැලා
අප මුළු දිරි ද යොදා - කරමුව වැඩප බෙදා
මහන්සියක් නොබලා - පිළිලබයක් නොපතා
කොතෙකුත් වැඩ කරලා - හෙම්බත් වුණත් හොඳා
ඔබගේ ආසාවේ - හැටියට අප සේවේ
කළ බව දැනුනොත් ඒ - ඇති අප සිත් සැනැහේ"

මිහිමත වන්දනා ගමනින් පසු රණවීර මහතා දෙවිපියාණන් විසින් සදාතනීක ජීවිතයට කැඳවනු ලැබ ඇත. සිය දිවිය දෙවිඳු පසස ගීයක් කරගත් ඔහුට සග පුරෙදී දේව මහිමයට පසස ගය ගයා සිටීමේ භාග්‍යය ලැබෙනු ඇත. අප ද තුටින් ඔද වැඩී "පියාණෙනි මේ ගුරු පියාණන් අපට ලබාදුන් ඔබට ස්තූති ප්‍රශංසා වේවා!" යි පුන පුනා පතමු.

ජුසේ මුනි දෙව්මැඳුර ගීයෙන් සැරැසු රණවීර මහතා, පමුණුගමියන් පවසන ලෙස 'සර්ව සභාව රක්ෂාධිකාර අපගේ පියාණෝ වන ශුද්ධවූ ජුසේ මුනින්ද්‍රයන් ඉදිරියේ' අප වෙනුවෙන්ද යදිනු ඇත.

**සමන් කපිල විජේසූරිය**
කැනඩාව

ජීවිත වටිනාකම් ... 1 පිටුවෙන්

ප්‍රවීන කලාකරුවන් පස් දෙනෙකුට මූල්‍යමය ආධාර ලබා දුන් අතර බොනිෆස් ප්‍රනාන්දු, ඇන්ටන් ග්‍රෙගරි, සමන්ති ලැනරොල්, ඇන්ටන් මිහිඳුකුල හා ඇන්ටන් සිල්වා එම ආධාරයන් ලබා ගත්හ.

මෙම අවස්ථාවේදීම මාධ්‍යවේදීන් කිහිප දෙනෙකුගේ කෘතීන් සහ සඟරා කාදිනල් හිමිපාණන් වෙත පිළිගැන්වූහ. ඒ අතර මැක්ෂිමස් රෝයි සහ ශිරාන් මෛත්‍රී ගේ සංස්කරණයෙන් යුතුව එළිදැක්වෙන 2012 "උඳුවප් මිහිර" හා "හරසර" යන සඟරා, ඉන්දීවර තිලකරත්නගේ "Cultural Scene thus far - 2" , රංග චන්ද්‍රරත්නගේ රචිත "සිහිනය" හා මහාචාර්ය විමල් දිසානායකයන්ගේ "Cross Currents Observations on Titerature Cinema and Culture" යන කෘතීන් යුගල ද, ලුවී වැන්ඩ්‍රස්ට්‍රාටන්ගේ "Buddhi the Elephant Boy" කෘති පිළිගැන්විණ.

කාදිනල් හිමිපාණන් සියළු කලාකරුවන් සමීපයට යමින් ඔවුන් හා දොඩමළුව සැපදුක් විමසමින් ඔවුන්ට තිළිණ ප්‍රදානය කරමින් ඔවුනොවුන්ගේ ඉල්ලීම් පරිදි ඡායාරූපයන්ට පෙනී සිටිමින් ගත කළ මොහොත සියළු දෙනාට ආශ්වාදනීය අවස්ථාවක් විය. මෙම අවස්ථාවට නෙස්ලේ ලංකා ආයතනයේ කාරුණික අනුග්‍රහය ද ලැබී තිබිණ. සුහද හමුව සජීවී ලෙස අන්තර්ජාලය ඔස්සේ විකාශනය වූ අතර www.lankacatholicinfo.com වෙබ් අඩවිය ඔස්සේ එම අවස්ථාව නැරඹීමේ හැකියාව ඇත.

ජනතා ධර්මදාන ... 1 පිටුවෙන්

සොයා බලමින් කටයුතු කරන්නේය. ශුද්ධාසනය ජනතා ධර්මදානය පිළිබඳ සසුන් නියෝජනය 1622 දී පිහිටවූයේ ලොවපුරා ධර්මදූතික කටයුතු හා ධර්මදානය සඳහා කටයුතු යෙදූ අතර මේ වනවිට 1,100 අධික සසුන් කලාපයන්හි අගරදගුරු වසම්, රදගුරු වසම්, අපෝස්තලික පරිපාලක ඇතුළු කටයුතු බාරව කටයුතු කරන්නේ මේ සසුන් නියෝජනයයි.

අන්ධකාරයට ... 3 පිටුවෙන්

කල එළැඹෙන තුන් දින අඳුර තුළ පාස්කු ඉටිපහන දැල්වීමට අර්ථයක් ඇත. එනම්, නිරන්තර සිත් සෝදිසියකට ඇතුළු වී ඇදහිල්ලේ ආලෝකය දල්වමින් ඔවුන් වහන්සේගේ ආලෝකය අප වෙතට ගෙන අපේ හදවත් සිසාරා පැතිරෙන 'අඳුර' හෙවත් ලෞකික බිය දුරු කිරීමයි.

අප සියලු දෙනා තුළම අඳුරක් පවතී. අතීත විවිධ සිදුවීම් ඔස්සේ, අඳුරු මතකයන්, අත්දැකීම් ඔස්සේ සිත් බිඳීම් හා ඇතුලාන්ත තුවාලයන් ඔස්සේ ඇතිවූ බලාපොරොත්තු සුන්වීම, කලකිරීම, වෛරය, පලි ගැනීම, උඩඟුව, ද්වේශය, ඊර්ෂ්‍යාව යන අඳුර මිනිස් සිත වෙලා පවතී. ආරම්භයේදී දෙවියන් වහන්සේ 'ආලෝකය වේවා' කියා අණ කළේ මෙම අන්ධකාරයට බව අප අමතක නොකළ යුතුය. (උත්පත්ති 1:3) තවද උන්වහන්සේට 'අඳුර' තවදුරටත් අඳුරක් නොවන බවද තෙහෙලි ගීයක් අපට පසක් කරදෙයි (තෙහෙලි ගී 139:12) උන්වහන්සේට අපේ අඳුරත්, එළියත් එක හා සමාන වන්නේ උන්වහන්සේ අපේ ඇතුලාන්තය මැවූ නිසාය. (තෙහෙලි ගී 139:13) තවද දෙවිඳාණෝ ලංව සිටිනුයේ බිඳුණු සිතැත්තන්ට බවද (ගීතා 34:18) දෙවිඳුන්ට ප්‍රසන්න වනුයේ බිඳුණු හදවත බවද අපි දනිමු (ගීතා 51:17). එසේනම් අපගේ සිත් බිඳීමට අප මුහුණ දෙන අන්ධකාරයට, ඉන් නික්මෙන පීඩාවට අරමුණක් ඇත. ඒ අප සැබෑ ආලෝකය වන ක්‍රිස්තුන් වහන්සේ කරා ගෙන ඒමයි. දෙවියන් වහන්සේට ලං වූවන් ඔවුන් වහන්සේ හික්ම වූ සේක. එසේ කළේ ඔවුන් පීඩාව හරහා ගෙනයමිනි. මීට කදිම නිදසුන වනුයේ වචනයේ දාසිය වූ මරිය තුමියයි. ඕ තුමියගේ හදවත මුළුමනින්ම තුවාල කළ කුරුස පාමුලදී ඇයට ඉතිරි වූයේ දෙවියන් වහන්සේගේ වචනය; එනම් ඔවුන් වහන්සේගේ, කිසිදා නොමැකෙන කිසිදා පහව නොයන වචනය පමණි (යෙසායා 40:8). එතුමිය අදහාගත්තේද කිසිදා පහව නොයන දෙවියන් වහන්සේගේ තිර පෙමයි. සදාතනික වචනයයි, ඒ නම් ඇය දස මසක් කුස තුළ දරාගෙන ලොවට ජනිත කළාවු ක්‍රිස්තුන් වහන්සේයි.

ඇදහිල්ලේ වසර ප්‍රකාශ කරමින් අප ශුද්ධෝත්තම පියාණන්ද ප්‍රකාශ කළේ ඇදහිල්ල අපි නැවත සොයාගත යුතු බවයි. එනම් අපේ හෘද සාක්ෂියට අවනතව ඊට ඉඩ දෙමින් අපේ හැම ජීවිත අත්දැකීමකදීම අප දුන් බෞතිස්ම පොරොන්දු අලුත් කරගත යුතු බවයි. දෙවියන් වහන්සේගේ රාජ්‍යය උදාවීම සඳහා කළහැකි හොඳම සූදානම එයයි. අවසාන දිනය කවදාද? එය කෙදින උදාවේද යන්න ප්‍රශ්න කළවිට උන්වහන්සේ පැවසුයේ එය මනුෂ්‍ය පුත්‍රයාණන්ද නොදන්නා බවයි; එය දන්නේ දෙවියන් වහන්සේ පමණක් වෙයි. (මාක් 13:32) තවද, "ක්‍රිස්තුන් වහන්සේ මෙන්න මෙතැනය නැතහොත් අන්න අතනය යි කීවොත් විශ්වාස නොකරන්න" කියා අපට ඉගැන්වූයේ ඔවුන් වහන්සේමය. (මතෙව් 24:23) අන්තිමය දක්වා ඇදහිල්ලෙන් ස්ථිරව සිටින කෙනා ගැලවීම ලබන බවය. උන්වහන්සේ තහවුරු කළ සේක. එසේනම් අප කළ යුත්තේ ද දයාධික මනස්ථාපනයකින් කැළඹීමට පත්වීම නොව දයාදික මනස්ථාපනයකින් ස්වාමින් වහන්සේට ඇදහිල්ලේ පිළිතුරක් දීමය. එසේනම් මේ එළැඹෙන්නේ ඇදහිල්ලේ ආලෝකය දැල්විය යුතු කාලයයි. එළිදරව්ව පොත පවසන ආකාරයට අපව පවිත්‍ර කොට අපේ වස්ත්‍රය. කාන්තියෙන් සුදු කරනු ලැබුවේ ක්‍රිස්තුන් වහන්සේගේ රුධිරය හේතුවෙනි. ඊට අනුව අසීමිත සංඛ්‍යාවක් ගැලවීම ලැබිය යුතුය. මෙය මූලධර්මවාදීන් වචනාර්ථයෙන් අරුත් දැක්වුවද, යථාර්ථය කිසිවකුට කිසිදා වෙනස් කළ නොහැකිය. යථාර්ථය නම්, උන්වහන්සේ හේතුකොට ගෙන සුවහසක් දෙනා ගැලවීම ලබන බවයි. එසේනම් අප බිය විය යුතු නැත. කැළඹිය යුතු ද නැත. නමුත් කවදා, කෙසේ උන්වහන්සේ අප අතරට වැඩියත් අපි සූදානම් විය යුත්තෙමු. උන්වහන්සේව අපගේ ස්වාමියාණන් ලෙස පිලිගනිමින් සැබෑ ඇදහිල්ලේ පිළිතුරක් දීමට අපට හැකිවන දාට සිමියොන් දිවැසිවරයා පැවසූ සේ, 'සමිඳුනි, ඔබ පොරොන්දු වූ ලෙසම දැන් ඔබේ දාසයා හට ශාන්ති සිතින් යාමට ඔබ නිදහස දී ඇත. මන්ද, ගැලවීම මාගේ දෙනෙතින් දිටිමි" (ලූක් 2:30) යි පැවසීමට අපට ද හැකිවනු ඇත.

## "සාම මිහිර" 54 කලාපය දොරට වඩී



"සාම මිහිර" ජාතික නත්තල් වාර්ෂිකය 54 වන වරට දොරට වැඩීම ඉකුත් දා රාගම, තේවත්ත "එම්මාවුස්" හිදී විශ්‍රාමික අගරදගුරු අති උතුම් නිකලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

එම උත්සව අවස්ථාවේදී "සාම මිහිර" සංස්කාරක ඇන්තනි ජයලත් මහතා විශ්‍රාමික අගරදගුරු හිමිපාණන්ට එහි මුල් පිටපත පිළිගැන්විණි. මෙම සඟරාව සංස්කාරක, "සාම මිහිර" ජාතික නත්තල් කලාපය, අංක 822 ජේ. ධර්මපාල මාවත, තේවත්ත, රාගම ලිපිනයට රු. 45 ක මුද්දරයක් සමඟ ඔබගේ නම සහ ලිපිනය යොමු කිරීමෙන් නොමිලේ ඔබට ද ගෙන්වා ගත හැකිය. **(සේයා - එච්. ඒ. කල්දේරා, සටහන - සී. ආර්. ඩික්සන් ඇන්තනි)**

දුක් විඳීමෙන් ... 5 පිටුවෙන්

තනිකම, අඳුර, අපිරිසිදු බව පිරි කුඩා කුටිය කෲරත්වයේ හා අසාමාන්‍ය වද හිංසනයේ තෝතැන්නක් විය. එනමුදු එම කුටියම ලෝක සාහිත්‍යයේ සහ සභා ශුද්ධවාදයේ ද උසස්ම කෘතීන් බිහි කළ තිඹිරි ගෙය විය. සිය සොහොයුරන්ගෙන් විවේචන, ශාරීරික වේදනා විඳ දිවියේ මහා ඛේදවාචකයකට මැදිව සිටි මේ තරුණ පියතුමා සිය ශූඪවාදී, ගැඹුරු අධ්‍යාත්මික අත්දැකීම් ලොවට හොරෙන් සනිටුහන් කරන්නට විය. සිය කටුක අත්දැකීම් සිපිරි ගෙය තුළ පද්‍යය බවට පෙරළී අසම සම කෘතීන්ට මුල පිරීය. මේ කාලය තුළ එතුමන්ගේ උසස්ම කෘතියක් වන "අධ්‍යාත්මික ගීතාවලිය" හි වැඩි හරිය ලියැවුණි. නව මසක් පුරා විඳී මේ දුක් වේදනා වඩා බැහැපත්, සුදුවත් දිවියකට මඟපෑදීය. 1578 වසරේ දෙව් මව් පරලොව වැඩි මංගල්‍යය දින රාත්‍රියේ මේ සිරකුටියෙන් පැන යාමට ඔහුට හැකිවිය. බයෙසා, ග්‍රනඩා, කෝර්දෝවා, සෙජොවියා වැනි ස්ථානවල තාපසාරාම පිහිටුවමින්, ප්‍රතිව්‍යුහගත කරමින් සිය දිවිය කාර්මෙල් නිකායේ නවෝදය උදෙසා මෙතුමෝ යෙදවූහ. එහෙත් ගෙවුනු කාලය තුළ ද දුක් පීඩා වල නිමක් නම් නොවිණි. තද බල ලෙස රෝගාතුර වූ ජුවාම් තුමන්ව තමුනට ඉතා කෲරව සැලකූ තම තාපසාරාමය වෙත නැවත ගෙනෙන ලදි. එහිදී එතුමන්ගේ නිරන්තර යැදුම වූයේ "දුක් විඳීමට හා නොසලකා හරිනු ලැබීමට" දෙවිඳුන් තමුන්ට සළසන ලෙසයි. සාමාන්‍ය මිනිස්කම අභිබවා ගිය අධ්‍යාත්මිකත්වයක් දුක් වේදනා විඳීමේ අගය වෙනත් මානයකින් දර්ශනය කිරීම පුදුමයට කරුණක් නොවේ. මේ නිසාම ඔහුගේ එදිරිවාදීහු පවා අවසන් හුස්ම හෙලන එතුමන් තුළ අසමසම සුදුවරයකු හඳුනාගැනීමට සමත් වූහ. 1591 දෙසැම්බර් මස 14 වන දින එතුමාණෝ සිය ආත්මය දේව හස්තයට භාර කළහ. 1726 දසතුන් වන බෙනදික් සුදොතුම් පියාණෝ මෙතුමන් සුදුවරයට එසැවූහ. "කාර්මෙල් කන්ද නැගීම, "ආත්මයේ අන්ධකාර රාත්‍රිය", "ආධ්‍යාත්මික ගීතාවලිය", "ප්‍රේමයේ ජීවමාන ගිනි දැල්ල" යන ප්‍රධාන කෘතීන් හැර "අධ්‍යාත්මික අනුශාසනා", සිය ආත්මික දරුවන් වෙත ලියූ ලිපි, පද්‍ය 26 ක් හා "අධ්‍යාත්මික අප්තෝපදේශයන්" මෙතුමන්ගේ පන්හිඳින් සහාව ලද අමරණීය දායාද වෙති.

දරුවන් ගැන ... 13 පිටුවෙන්

එදින ඇය තම විශ්වාසවන්ත ආදරවන්තයාට සියල්ල පූජා කළාය. තිලකාගේ හැසිරීම් රටාවේ පමණක් නොව ඇගේ ඇඟ පතෙහිද යම්කිසි වෙනස්වීම් දුටු තිලකාගේ මව මේ ගැන ඇගෙන් දිගින් දිගටම ප්‍රශ්න කළත්. කොහොම හරි කෙටි පිළිතුරකින් ඇය අවස්ථාව මගහරවා ගන්නට සමත්වූවාය. දැන් දැන් නාමල්ගේ පෙර තිබූ ඇඟෑළුම්කම ටිකෙන් ටික අඩුවන බව දුටු ඇය දිනක් තමා නාමල්ගේ දරුවකු කුසදරා සිටින නිසා හැකි ඉක්මණින් විවාහ වන ලෙස යෝජනා කළාය. නමුත් නාමල් ඒ මොහොතේදී ඈ දෙස පෑ රුදුරු බැල්ම ඇගේ මුළු සර්වාංගයම දැවී යන ලෙස දැනුණි. ටික දිනකින් නාමල් වැඩට ඒම නවතා දැමීය. දුර කථනයද විසන්ධි කර ඇත. කිසිත් කරකියා ගත නොහැකි තැන අවසානයේ ඇය අම්මාට සියළු විස්තර කීවේ කෙසේ හෝ නාමල් සොයා ගැනීමේ අරමුණිනි. කෝපය ඉක්මවා ගිය අම්මා ඇයට හොඳටම පහර දුන්නා හැර ප්‍රශ්නයට කිසිම විසඳුමක් ගැන කථා නොකළාය.

බැරිම තැන ඇය තම ලොකු අයියාට තමාගේ තත්ත්වය ගැන දන්වා ලිපියක් යැව්වාය. පිළිතුර වූයේ තමන්ගේ බිරිඳ දෙවෙනි දරුවා ලැබීමට සිටින හෙයින් දැන්ම කිසිවක් නොකළ හැකිබවය. ගෙදර ආ විටෙක ඇය දෙවෙනි අයියාගේ උදව්ව ඉල්ලා සිටියේ කෙසේ හෝ නාමල් සොයා ගැනීම සඳහාය. 'ඕවා සුළු දේවල්නෙ, ඕව ගණන් ගන්ඩ එපා' කියා ඔහු යන්නට ගියේය. තුන්වෙනි අයියා මේ සිදුවීම ඉතා අසාධාරණ ක්‍රියාවක් බවත්, අධිරාජ්‍යවාදය මෙයට වගකිව යුතු බවත් මෙය සිදුවූයේ පවතින සමාජ ක්‍රමයේ වරද නිසා බවත් පැහැදිලි කරමින් දීර්ඝ විස්තරයක යෙදුනාය. අවසානයේ තිලකා තනිවම නාමල් සොයා යෑමට තීරණය කළාය. දිගු බස් ගමනකින් පසු සවස 7.00 පමණ කෙසේ හෝ නාමල්ගේ මහගෙදර සොයාගත්තාය. එහියන විට නාමල් තම බිරිඳ හා දරු දෙදෙනාත් සමග රූපවාහිනිය නරඹමින් සිටිනු දැකීම තිලකාගේ සියලු උත්සාහයන් උඩුයටිකුරු දැමීය. දැන් කුමක් කරන්නද? පවුලක් කඩාකප්පල් කරන්නට අකමැතිවූ තිලකා අඳුරේම, නොදන්නා පළාතක මහපාරට බැස්සාය. අමාරුවෙන් අසල කුඩා නගරයට ඇය ආවේ යන්නේ කොහේදැයි ගැන කිසිම අදහසක් නැතිවය. රාත්‍රිය බස්නැවතුම්පලේ ගත කරද්දී එතැනට පැමිණි කරුණාවන්ත මාමා කෙනෙකුගේ උදව්වෙන් ඇය සුඛෝපභෝගි රථයක තවත් තරුණ ව්‍යාපාරිකයකු සමග නොපෙනී ගියාය. දැන් ඇය ලෝකයේ පැරණිතම වෘත්තියෙහි යෙදී සිටින්නීය.

## ඔබවහන්සේ අප නිවෙසට වඩින්නට තරම් අපි සුදුස්සෝ නොවෙමු



**ජේසුස් වහන්සේ එදා මිනිසුන් අතරට ගොස් ඔවුන්ගේ දුක් දෝමනස්සයන් ස්පර්ශ කරමින් එදා කළ ධර්මදූත සේවාව මට සිහිපත් කරවූයේ ගාලු පදවියේ රදගුරු අති උතුම් කිංස්ලි රේමන් වික්‍රමසිංහ හිමිපාණන්ගේ ක්‍රියා කලාපය තුළිනි. උන්වහන්සේ තම පදවියේ සේවය ආරම්භ කළේ පදවියට අයත් මීසම්වල සියළු රෝගීන් බැහැදැකීමට යෑමෙනි.**

මගේ මව වසර 15 ක පමණ පෙර සිට අක්ෂි ආබාධයකින් පෙළුන අතර දෙඇසට ශෛල්‍ය කර්ම 4 ක් මාතර මහ රෝහලේ සහ ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ දී සිදු කොට තිබිණි. මෙයට වසර 2 කට පෙර මගේ සොයුරා ද අංශභාග රෝගයෙන් සිරුරේ වම්පස, දකුණුපස දෙපාර්ශයම අප්‍රාණික වූයේ ඔහුට වයස 58 වන විටය. මේ රෝගීන් දෙදෙනා සිටි අප නිවෙසට අපේ රදගුරු ප්‍රසාදින් වහන්සේ වැඩියේ එදා ජේසුස් වහන්සේ කළ ධර්මදූත සේවාව සිහිපත් කරවමිනි. මගේ මවට උන්වහන්සේ අප නිවසට වැඩියාය යන්න අදහාගත නොහැක්කක් විය. ඇය කියා සිටියේ "හිතා ගන්න වත් බැරි වාසනාවක්!..... ඉස්සර නම් බිෂොප් වහන්සේ පල්ලියකට වැඩියෙත් අවුරුදු 4කට පහකට සැරයක් අභිවෘද්ධි ආලේපය දෙන්න. මගේ සොයුරා සැප්තැම්බර් මස 18 දින මිය ගියේ ය. ඉන් නමවෙනි සතියේදී එනම් නොවැම්බර් 20 දින මව ද මිය ගියාය. නොවැම්බර් 22 දින අහඹු ලෙස මාතර මීසමට පැමිණ සිටි රදගුරු හිමිපාණන් අප නිවෙසට වැඩම කර මවගේ දේහයට අවසාන ආශිර්වාදය ලබා දුන්නේ එදා ජේසුස් වහන්සේගේ ධර්මදූත සේවා සිහිපත් කරවමිනි.

අති උතුම් රදගුරු ප්‍රසාදින් වහන්ස, ඔබවහන්සේ අපට සවියක්, දිරියක්, ඔබවහන්සේට අපි තුති පුදමු. එමෙන්ම අප නව මීසම් සේවක ගුරු ඩේමියන් අර්සකුලරත්න පියතුමාටත් අපේ හිටපු මීසම් සේවක කලාපීය නාහිමි අතිගරු චාල්ස් හේවාවසම් පියතුමාටත් මහත් ගෞරවයෙන් තුති පුදමු.

✍ මාතර, **ජෙනට් නානායක්කාර**

## මීගමු රෝහලේ දොස්තර මහතාගේ ගොන්සාල්වේස් වේදිකා රංගය

**රාසාවේශයට පත් වූ කල නිර්මාණවේදියාට විෂය ලෝකය අමතක වෙති. සටකපටකම් වලින් පිරුණ ලෝකයෙන් ස්වල්ප මොහොතකට හෝ මිදී, කිසියම් ධ්‍යානයක් තුළට වැද එය රස විඳින්නට කැමැතිය. ධ්‍යානයට සමවදින යෝගියකු මෙන් අමන්දානන්දයට පත්වුවත් ඔහුට රසික ප්‍රතිචාරය අවශ්‍යය. ඒ ප්‍රතිචාර අනුව යමින් ඔහු තුළින් තවත් අපූරු නිර්මාණ බිහිවන්නේ ය.**

මෙකල වේදිකා නාට්‍යයක් නිර්මාණය කිරීම පිණිස අවම වශයෙන් රුපියල් හාර පන්ලක්ෂයක් වුවමනාය. එම ප්‍රාග්ධනයත් නැවත උපයා ගැනීමට එම නාට්‍ය බොහෝ වාර ගණනක් වේදිකාගත කළ යුතු අවදානම් සහිත පිරිවැයකි. ඒ සඳහා ජනප්‍රිය සංස්කෘතික අංග අඩු වැඩි වශයෙන් ගලපා ගත යුතුය. එහෙත් ඔහු තෝරාගත් විෂයේ එවැන්නක් අඩංගු නැත. මා විශ්වාස කරන පරිදි ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාට අප ලාංකීය කතෝලිකයා කෙලෙහිගුණ දැක්වූවා මදිය. එතුමා දැඩි ඕලන්ද පීඩන සමයේ ජුසේ වාස් පියතුමා දමා දුන් අත්තිවාරම මත අද අපගේ හිසට සෙවන දෙන ලාංකීය කතෝලික සභාව දේශීය සංස්කෘතික හැඩයෙන් ගොඩ නැගීමට මහත් කැපකිරීමක් කළ සුරුවාය. එතුමා වෙනුවෙන් වෛද්‍ය ආලෝක කෘතගුණ දැක්වීමට ගත් උත්සාහයට විශාල වටිනාකමක් එකතු කිරීම යුතුකමක් සේ සලකන බැවින් මෙසේ ලියමි.

ඔහු නාට්‍ය ආරම්භ කරන්නේ වේදකාව්‍යයේ එන කර්ණරසායන ගීතයන්ගෙනි. එම ගීතයන්ගේ පද රචනා මෙන්ම තාල රාග නාට්‍යයේ මුල් භාගයට මහත් ආලෝකයක් ලබා දෙයි. ඔහු අතින් සිදුවූ අතපසු වීමක් ලෙස මා දකින්නේ වේද කාව්‍ය බොහෝ වේලාවක් යනතුරු රංගගත කිරීමයි. ඒ සඳහා භාවිතා කළ බැලේ ආකාර රංග රීතියනම් අඩුවක් නැතිව ඉගි නළුව අපූර්වත්වය සිහිගැන්වුවද නාට්‍ය පෙළ පිළිබඳ පූර්ව අවබෝධයක් නැති ප්‍රේක්ෂකයකුට ප්‍රථමයෙන් හැඟෙන්නේ එය ලෝකාරම්භය පිළිබඳ කෙරෙන රංගයක් ලෙසයි. ප්‍රථමයෙන් එය ගොන්සාල්වේස් පියතුමා විරචිත වේද කාව්‍යය බවට ඉඟියක් ලබා දෙන්නේ නම් මනාය. ගොන්සාල්වේස් චරිතය පිළිබඳ නාට්‍යයක් නිර්මාණය කිරීමේදී ඔහු මුහුණ දෙන මූලික ගැටලුව එහි ආගමික පසුබිම විනාශ නොකර ඉතිහාසය විකෘති නොකර වාර්තාරංගයෙන් බැහැර නිර්මාණයක් බිහිකිරීමයි. එය ජයගැනීමට වෛද්‍ය උදාර බොහෝදුරට සමත් වී තිබේ. දෙබස්වල ඒකමිතියක් පවත්වා ගැනීමට අපොහොසත් වන අවස්ථා කිහිපයක් හමුවුවද එය සැලකිය යුතු දුර්වලකමක් ලෙස මතු නොවෙයි. ගොන්සාල්වේස් පියතුමාගේ කර්ණරසායන කර්ණාටක රාග තාල මෙන්ම එතුමා උකහා ගත් අපූර්ව සිංහල ගේය පද ද අධ්‍යක්ෂවරයා මැනවින් ගලපා ගනියි. අසා සිටින්නට මිහිරිය.

නාට්‍යෝචිත ලෙස පෙළ සකස් කර ගැනීමේ හැකියාව මෙන්ම අවස්ථා මතුකර ගැනීමේ හැකියාව ද ආධුනික නාට්‍යකරුවකු ලෙස ඔහුගේ නිසග හැකියාවක් බව අමතක කළ නොහැකිය. පාස්කු මඩුව ඕලන්ද සෙබළුන් කඩා දමන අවස්ථාව වැනි මැනවින් ගොඩ නගා ඇති නාට්‍යමය අවස්ථාවන් කිහිපයක් හමුවෙයි. සමස්ථයක් ලෙස ගත් කල ගොන්සාල්වේස් නාට්‍යය අපූර්ව වින්දනීය නාට්‍යයකි. එය සෑම කතෝලිකයකුම පාහේ නැරඹීම මනාය.

✍ රාගම, **අජිත් මෙන්ඩිස්**

## ගුරු සේවයෙන් ඉසිඹු ලබයි



**මහරගම ගුරු විදුහලේ අධ්‍යාපන මූලධර්ම හා ක්‍රම විද්‍යාව විෂයය භාර කථිකාචාර්යවරියක ලෙස සේවය කළ නෙළුම් වීරසූරිය ගුරු මාතාව පසුගියදා ගුරු සේවයෙන් ඉසිඹු ලැබීය.**

ඇයගේ 37 වසරක ගුරු ජීවිතය තුළ ඉටු කළාවූ අමිල මෙහෙයන් අපමණය. ඒ අතරින් සුවිශේෂ වන්නේ නුපුහුණු ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහනේ කථිකාචාර්යවරියක ලෙස ඇය ඉටු කළ අනගිභවනීය සේවයයි.

වර්ෂ 1958 දී මොරටුව ජයලත් අප ස්වාමිදුවගේ කන්‍යාරාමයේ පහළ බාලාංශයට ඇතුල් වී 1972 වසරේදී අ.පො.ස. උසස් පෙළ විභාගය ඉහළින් සමත් වී කොළඹ විශ්ව විද්‍යාලයට තේරී පත්වුණු ඇය, එහිදී අධ්‍යාපනවේදී උපාධිය හා අධ්‍යාපන ඩිප්ලෝමාව සමත් විය. 1975 වසරේදී ඇයගේ පළමු ගුරු පත්වීම ලෙස බණ්ඩාරවෙල සීවලී විදුහලේ සේවයට එක්විය. එහි අවුරුදු 4 ක් සේවය කිරීමෙන් අනතුරුව 1979 වසරේදී කො/ද ශ්‍රී සුනන්දෝපනන්ද විදුහලට ඇයගේ සේවය ලබා දුන්නාය. 1990 වර්ෂයේ දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් මෙහෙයවනු ලැබූ නුපුහුනු ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසහනේ කථිකාචාර්යවරියක් ලෙස සේවය කළාය. එතැන් සිට 2005 වසර දක්වා වසර 15 ක් කොළඹ දිස්ත්‍රික්කයේ නුපුහුණු ගුරුවරුන් පුහුණු කිරීමේ ව්‍යාපෘතියේ කථිකාචාර්යවරියක ලෙස විවිධ තනතුරු හොබවමින් ඇය ඉමහත් සේවයක් ඉටු කළාය. ඉන් අනතුරුව කථිකාචාර්යවරියක ලෙස මහරගම ගුරු විදුහලට තේරී පත්වුණු ඇය, එම කාල සීමාව තුළ මහරගම ගුරු විදුහලේ සේවය කළ එකම කතෝලික කථිකාචාර්යවරිය ද වූවාය. 2012 දෙසැ.14 දින විශ්‍රාම යන තෙක් මහරගම ගුරු විදුහලේ අධ්‍යාපන මූලධර්ම හා ක්‍රම විද්‍යාව විෂයය භාර කථිකාචාර්යවරිය ලෙස ඉතා අගනා සේවයක් ඉටු කළාය.

අද දින ගුරු විදුහලෙන් සමුගෙන ඉසිඹු සුව විඳින ඇයට අපි සදා නිරෝගී සුවය හා ජය සතුට පතමු.

✍ **ජූඩ් නික්සන් වාස්**